රළ සමග

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

ISSN 1391 - 1031
2017 ජූනි
23 වෙළුම 03 කලාපය

ආධාරය රු 30/=

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී

"මධ්‍යතනවාදය හා සමග සසඳන කල, ධනපති ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රගතිශීලී විය. ඒ අනුව එයින් ප්‍රයෝජන ගැනීම කළ යුත්තක් විය. නමුත් දැන් එය කම්කරු පංතියේ වුවමනාවන්ට සෑහෙන්නේ නැත. දැන් අපි ආපසු බලනවා වෙනුවට ඉදිරිය බැලිය යුත්තෙමු. ධනපති ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවට නිර්ධනපංති ප්‍රජාතන්ත්‍රවාදය ආදේශ කිරීමට බලාපොරොත්තු විය යුත්තෙමු."

**ලෙනින්,**
**තෝරාගත් කෘති,**
**9වැනි වෙළුම,**
**45 පිටුව**

# ගංවතුරෙනුත් ආණ්ඩුව අසමත්

## ආපදා කළමනාකරණය නමට පමණයි

පසුගිය දිනවල පැවති අයහපත් කාලගුණ තත්වය හේතුවෙන් දිවයිනේ දිස්ත්‍රික්ක අටකට බලපෑ ගංවතුර හා නායයෑම් තත්වය හමුවේ විපතට පත් ලක්ෂ 05කට වැඩි ජනතාවට සහන සැලසීමේදී හවුල් ආණ්ඩුව සෑම අතකින්ම තමන්ගේ අසාර්ථකභාවය පෙන්වා ඇති බවත් ජ.වි.පෙ. රතු තරුව සහන සේවා බලකාය ඇතුළු ස්වේච්ඡා සංවිධාන මැදිහත්වීම නොවන්නට විපතට පත් ජනතාව මහත් අසීරුතාවයකට පත්වීමට ඉඩ තිබූ බව වාර්තා වේ.

විශේෂයෙන් ආපදා තත්වය ඇතිවූ මෙහොතේ සිට කඩිනමින් ක්‍රියාත්මක වීමට ආණ්ඩුව අසමත් වූ අතර රාජ්‍ය නිලධාරීන්ට ඒ සම්බන්ධයෙන් වහා මැදිහත් වීමට පරිපාලන ඉඩකඩ සලසන්නාවූ හදිසි ආපදා තත්වයක් ප්‍රකාශයට පත් කිරීමට පියවර ගෙන තිබුණේ නැත. ආපදා තත්වයකට මුහුණදීමට අවශ්‍ය සැලසුම් සහගතභාවයක් ආණ්ඩුවේ ඉහළ සිටම නොතිබුණු බව පෙනී ගියේ ආපදා විෂය භාර අමාත්‍යවරයා, අගමැතිවරයා වැනි ප්‍රතිපත්තිමය තීන්දු ගත යුතු බලධාරීන් රටින් බැහැරව **02 වැනි පිටුවට**




**05 මැදමුලනේ සිහිනය...**



බලයේ පිපාසයෙන් පෙළෙන මැදමුලන රාජපක්ෂවරුන්, මහින්ද වටා සිටිනවා හැර වෙනත් විකල්පයක්...

**07 සමාජවාදය තුළ නිදහස...**



ධනවාදය තුළදී තමන්ගේ රට පාලනය කිරීමට දායකත්වය දැක්වීමට ජනතාවට ඇති අවස්ථාව...

**11 චින්තනය නිදහස්...**



මිනිසාගේ චින්තය සඳහා 'හැම පහසුකමක්ම' සලසා ඇති ධනවාදය...

**12 පාලකයින්ට උක් පැණි...**



අපේ රටේ පාලකයෝ යෝජනා කරන්නෙම පරිසර සතුරු සංවර්ධනයයි. නමුත්...

| | |
|---|---|
| සංවාදය........................ | 03 |
| තරුණ........................ | 04 |
| ආවර්ජනා........................ | 06 |
| ජාත්‍යන්තර........................ | 08 |
| ආර්ථික........................ | 09 |
| කාන්තා........................ | 10 |
| වේදිකාව........................ | 13 |
| විශේෂාංග........................ | 14 |

**යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!**

# ඒතෙර අපි සමුළු



ඉතාලියේ - අනුර, කටාරයේ - විජිත

ඒතෙර අපි සංවිධානයේ විදෙස් සමුළු රැසක් විදේශ රටවල පැවැති අතර පසුගියදා ජවිපෙ නායක අනුර දිසානායක සහෝදරයා සහභාගි වූ ඉතාලියේ රැස්වීම සඳහා විශාල ජනතා සහභාගිත්වයක් සහිත විය. ඉතාලියේ මිලානෝ, රෝමය, ෆිරෙන්සි සහ නාපෝලි නගරවල මෙම රැස්වීම් පැවැති අතර නාපොලි රැස්වීම ප්‍රසිද්ධ ජනතා රැලියක් ලෙස පැවැත්විණි. කටාර් රාජ්‍යයේදී පැවැති මහා සභා සමුළුවට ජ.වි.පෙ. ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා සහභාගි විය.

# ශ්‍රී ලංකා ඉතිහාසය ඕමානයේදී




ඒතෙර අපි සංවිධානයේ ඕමාන ශාඛාව සංවිධානය කළ "ශ්‍රී ලංකා ඉතිහාසය - නව සොයා ගැනීම්" දේශනය කැලණි විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා මහාචාර්ය රාජ් සෝමදේව මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා ඕමානයේදී සාර්ථක ලෙස පැවැත්විණි. මෙහිදී මහජන දේශනයක් ඕමානයේ මස්කට් නගරයේ වදිකබීර් ශ්‍රී ලංකා පාසලේදී පැවැති අතර, පාසල් සිසුන් සඳහා පැවැති දේශනයට ඕමානයේ හා වෙනත් රටවල සිසුන්ද විශාල පිරිසක් සහභාගි වූහ.

# බිමල් රත්නායක - රුසියාවේ නාසි හමුදා පරාජය සැමරුමට..



සෝවියට් සමාජවාදී විප්ලවයේ වසර 100ක් සම්පූර්ණවීම සැමරීම වෙනුවෙන් ඉදිරියේ රුසියාවේ පැවැත්වෙන ලෝක ප්‍රජාතන්ත්‍රවාදී තරුණ සම්මේලනයේ සූදානම් කිරීමේ කටයුතු වෙනුවෙන් පසුගියදා ජවිපෙ දේශපාලන මණ්ඩල සභික බිමල් රත්නායක සහෝදරයා රුසියාවේ සංචාරය කරන ලදී. එහිදී එම සංවිධාන කටයුතු සඳහා රුසියානු ජාතික සූදානම් කිරීමේ කමිටුව සමග කටයුතු කළ අතර, 1945 මැයි 09 දින සෝවියට් හමුදා විසින් නාසි ජර්මන් හමුදා පරාජය කිරීම ජයග්‍රහණ සැමරීමේ උත්සවයකටද සහභාගිවීමට අවස්ථාව ලැබිණි.

# ලෝක වෘත්තිය සමිති සම්මේලනයේ සභාපති මණ්ඩලය කියුබාවේදී




පසුගිය මැයි 03 සහ 04 දිනවලදී කියුබාවේ හවානා නගරයේ පැවති ලෝක වෘත්තීය සමිති සම්මේලනයේ සභාපති මණ්ඩල රැස්වීමට ලංකාව නියෝජනය කරමින් සමාජවාදී කම්කරු සංගමයේ නීතිඥ ජානක අධිකාරී සහෝදරයා සහභාගි විය. දකුණු අප්‍රිකාවේ ඩර්බන්හි පැවති වෘත්තීය සමිති සම්මේලනයේදී ජානක අධිකාරී සහෝදරයා මෙම සභාපති මණ්ඩලයට තේරී පත්වී ඇති අතර, රටවල් 40ක නියෝජිතයින් මෙම සභාපති මණ්ඩලයේ සාමාජිකත්වය දරයි. ලෝක වෘත්තීය සමිති සම්මේලනයේ ආසියා පැසිපික් කලාපීය සමුළුවට පසුගිය මැයි 19 හා 20 දිනවලදී ඉන්දියාවේ චෙන්නායිහිදී පැවැති අතර, එයට සමාජවාදී කම්කරු සංගමයේ මහින්ද ජයසිංහ සහ වතු සේවක සමිති සභාපති සෙල්වරාජ් සහෝදරයාද ජානක අධිකාරි සහෝදරයා සමග මෙයට සහභාගි වූහ.

# ඒතෙර අපි - ප්‍රජා සේවා

## අබුඩාබි - කැනඩා - ඩුබායි



අබුඩාබි, කැනඩා සහ ඩුබායි 'ඒතෙර අපි' සංවිධාන සහ එම රටවල ශ්‍රී ලාංකිකයන් විසින් සංවිධානය කරනු ලැබූ වෙසක් දින වැඩසටහන් සඳහා ප්‍රජා සත්කාර සේවාවන් රැසක් සංවිධානය කර තිබුණි. එම අවස්ථා සඳහා එම රටවල ශ්‍රී ලාංකේය ජනතාවගේ විශාල අවධානයක් සහ ප්‍රතිචාර ලැබී තිබිණි.

# විපතට පත් ජනතාවට ජ.වි.පෙ. මන්ත්‍රී අරමුදලෙන් සහන

ගංවතුරෙන් ආපදාවට පත්වූ ප්‍රදේශ යළි යථාතත්වයට පත්කිරීම සඳහා ජනතා විමුක්ති පෙරමුණේ 'රතු තරුව' සහන සේවා බලකාය මේ වනවිට එම දිස්ත්‍රික්කවලට මැදිහත් වෙමින් සිටියි. කළුතර, ගාල්ල, මාතර හා රත්නපුර දිස්ත්‍රික්කවල මෙන්ම අනෙකුත් ප්‍රදේශවල විපතට පත්වූවන්ට සහන සැලසීම සඳහා මෙම ක්‍රියාන්විතය දියත් වේ. විපතට පත්වූවන් සඳහා අවශ්‍ය සහනාධාර අදාළ දිස්ත්‍රික්කවල රතු තරුව සහන මධ්‍යස්ථාන සඳහා භාර දීමට පියවර ගන්නා ලෙස ජනතා විමුක්ති පෙරමුණ ජනතාවගෙන් ඉල්ලීමක් කරයි.

මේ අතර ජනතා විමුක්ති පෙරමුණේ ජනතා නියෝජිතයින්ගේ මන්ත්‍රී වැටුප් අරමුදලින් විපතට පත් ජනතාවට අවශ්‍ය සහන සැලසීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට ජනතා විමුක්ති පෙරමුණ තීරණය කර තිබේ.

එමෙන් ජනතා විමුක්ති පෙරමුණ ලෙස විපතට පත්වූවන් වෙනුවෙන් මූල්‍යාධාර එකතු කරන බවට සමාජ ජාලවල පැතිර යන ව්‍යාජ ප්‍රවෘත්තිවලට නොරැවටෙන ලෙසද ජනතා විමුක්ති පෙරමුණ ජනතාවගෙන් ඉල්ලීමක් කර සිටී.

## ගංවතුරෙනුත්...

01 පිටුවෙන්

සිටීමෙනි. වෙනත් තැනක නම් මෙවැනි අවස්ථාවක දේශපාලඥයින් පෞද්ගලික සංචාර අවලංගු කර රටට පැමිණෙන නමුත් මෙවැනි හැසිරීමක් තුළ පෙනී ගියේ, විපතට ජනතාව සම්බන්ධයෙන් ආණ්ඩුව තුළ පැවති ආකල්පයය.

විපතට පත් ජනතාව බේරාගැනීමේදී ආරක්ෂක අංශවල පහසුකම් සැපයීමේ ක්‍රියාකාරිත්වයත් රාජ්‍ය නිලධාරීන්ගේ පෞද්ගලික මැදිහත්වීම තිබූ තැනක සිදුවූ විශේෂ මැදිහත්වීමත් හැරෙන්නට මෙම ස්වභාවික ව්‍යසනය හමුවේ ආණ්ඩුවක් ලෙස සිදුකරන ලද මැදිහත්වීම ප්‍රමාණවත් නොවීය. ආණ්ඩුවේ විවිධ මැති ඇමතිවරුන් පෞද්ගලිකව මාධ්‍ය හමුවේ සිදුකරන ලද ආපදා නිරීක්ෂණයන්, ආහාර බෙදාදීම් විපතට පත් සමස්ත ජනතාවගේ ප්‍රමාණයට සාපේක්ෂව ගිණිය නොහැකි තරම් විය.

මේ අතර පසුගිය කාලය පුරාම අහිමි වූ බලය නැවත ලබාගන්නා බවට කියමින් ගිය මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයාද විපතට පත් ජනතාව වෙනුවෙන් කළ මැදිහත්වීමක් ඇත්තේම නැති තරම් වීම ප්‍රකට කරනුයේ ඔහුගේ බලලෝභීත්වය මිස වෙනකක් නොවේ. විපතින් දින ගණනාවකට පසුව වතුරේ බැස සිටින ඡායාරූප නිකුත් කිරීමට වඩා වැඩි දෙයක් කිරීමට, පසුගිය ආණ්ඩුව සමයේ ඇමතිවරුන්ටද ඉහළින් ක්‍රියාත්මක වූ රාජපක්ෂ පුතුන්ද අසමත්ව තිබිණි.

ජනතා විමුක්ති පෙරමුණේ රතු තරුව සහන සේවා බලකාය විසින් දිස්ත්‍රික්ක ගණනාවකදී ජනතාව ආරක්ෂිත ස්ථාන කරා යොමු කිරීම, අත්‍යාවශ්‍ය භාණ්ඩ බෙදාහැරීම, වෛද්‍ය සායන පැවැත්වීම, ගංවතුර බැසයාමෙන් පසු නිවෙස් පිරිසිදු කරදීම වැනි සහන සේවා සිදු කරන ලද අතර ඒ සඳහා මහජනතාවගෙන් ලැබුණු ද්‍රව්‍යමය ආධාර සහ ජ.වි.පෙ. මන්ත්‍රී වැටුප් අරමුදලින් ලබාගත් මූල්‍යමය ආධාර උපයෝගී කරගැනිණි. ආණ්ඩු බලයකින් තොරව මෙවැනි පුළුල් මැදිහත්වීමක් සිදුකිරීමට ජ.වි.පෙ. සමත්වීම මහජනතාවගේ විශේෂ ඇගයීමට පාත්‍රවී ඇති අතර මෙවර මෙහෙයුම පසුගිය දශක දෙකකට ආසන්න ජ.වි.පෙ. රතු තරුව මැදිහත්වීම්වල තවත් දිගුවක් විය.

ආණ්ඩුවක් ලෙස මෙතරම් අසමත්භාවයක් තිබියෙදී ස්වේච්ඡා සංවිධානවල ක්‍රියාකාරිත්වයත් පොදුවේ ජනතාවගෙන් සිදුවූ මැදිහත්වීමත් විපතට පත් ජනතාවට කිසියම්ම හෝ සහනයක් වූ බව එම ජනතාවගේ අදහසයි.

## දැන් රටට...

16 පිටුවෙන්



30 සිට 48 දක්වාත් නියෝජ්‍ය රාජ්‍ය ඇමතිධුර 40 සිට 45 දක්වාත් වැඩි කරන්න. ඒ නිසා මේ ආණ්ඩුව ගොඩනැගුණේම තනතුරු වරප්‍රසාද බෙදා ගැනීම වෙනුවෙන්. කැබිනට් සංශෝධනය හරහාත් ඔප්පු වුණේ එයයි. මේ සංශෝධනයෙන් ඇමතිවරයෙක් සහ රාජ්‍ය ඇමතිවරයෙක් වැඩිවෙනවා. ඔවුන්ගේ කාර්ය මණ්ඩලය වෙනුවෙන් තනතුරු වරප්‍රසාද වෙනුවෙන් බර දරන්න වෙන්නේ ජනතාවටයි. මේ නිසා තවදුරටත් සිදුවන්නේ ආර්ථික අර්බුදය වැඩිවී ජනතාව මත බර පැටවීමයි.

ආණ්ඩුව මාරු කරලා රට හදන්න බැරි වුණ එකේ කැබිනට් එක මාරු කරලා රට හදන්න පුළුවන්ද? තවදුරටත් මේ පාලකයින්ට ඔවුන්ගේ ප්‍රතිපත්තිවලට මේ රට හෝ ජනතාව ඉදිරියට ගෙනියන්න පුළුවන්කමක් නැහැ. ඒ ගමන වෙනස් කළ යුතුයි. ඒ සඳහා පෙරට එන ලෙස ජනතාවගෙන් ඉල්ලා සිටිනවා." ඔහු පැවසීය.

## ආණ්ඩුව ජනවරමට...

16 පිටුවෙන්



පොලීසියට අහුවුණා. ඔහු ගැන සොයා බලද්දී ඔහු රුසියාවේ පෞද්ගලික විශ්වවිද්‍යාලයක වෛද්‍ය පීඨ සිසුවෙක්. සල්ලි නැති නිසා වෛද්‍යවරයෙක් වෙන්න හිටපු සිසුවෙක් අපරාධකාරයෙක් වෙලා. ඒ වගේම යුරෝපා රටවල පෞද්ගලික ආයතනවල ඉගෙන ගන්නා සිසුවියන් දැන්වීම් දාලා ඇඟ විකුණනවා. මේ විදිහට ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට බැංකු කඩන්න, ඇඟ විකුණන්න, කුඩු බිස්නස් කරන්න, පොකට් ගහන්න, සිදු වුණොත් අනාගතයේදී බිහි වෙන්නේ වෛද්‍යවරු නොව අපරාධකාරයින්. ඒ නිසා තමයි අපි නිදහස් අධ්‍යාපනය අහෝසි කරන්න එපා කියලා ආණ්ඩුවට බල කරන්නේ. නමුත් ආණ්ඩුව අත්තනෝමතික හිතුවක්කාරී ලෙස තමයි එයට ප්‍රතිචාර දක්වන්නේ.

අපි ආණ්ඩුවට අනතුරු අඟවනවා. දෙකෙන් එකක් තෝර ගන්න කියලා. සයිටම් තෝරාගෙන ආණ්ඩුවේ පැවැත්ම අත්හරින්න හෝ සයිටම් අහෝසි කර ආණ්ඩුව බේරා ගන්න කියලා අපි ආණ්ඩුවට අවධාරණය කරනවා. නිදහස් අධ්‍යාපනය රැක ගැනීම වෙනුවෙනුත් අධ්‍යාපනය පෞද්ගලීකරණයට එරෙහිවත් ජනතා විමුක්ති පෙරමුණේ අපි සියලු බලවේග එකතු කරනවා."

## විධායක ජනාධිපති ධුරය...

16 පිටුවෙන්

අවතීර්ණ වන බවට අනතුරු ඇඟවූ ඔහු ආණ්ඩුවේ තර්ජනයට එරෙහිව මහා ජන පවුරක් ගොඩනැගිය යුතුව ඇති බවත් එසේ නොවුණහොත් ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අරගල කුඩුපට්ටම් කිරීමට ආණ්ඩුව කටයුතු කරනු ඇති බවත් පෙන්වා දුන්නේය.

"මේ වන විට ආණ්ඩුව මර්දනකාරී පිළිවෙතකට එළඹිලා තිබෙනවා. වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය වෙත අරගල කරන සිසුන් වෙත, ගොවි ජනතාව වෙත, මර්දනය එල්ල කර තිබෙනවා. මේ ආණ්ඩුව මැයි දිනයෙන් ලබාදුන් පාඩම් ඉගෙන ගන්නවාට වඩා අරගල කරන ජනතාව වෙත මර්දනයේ හස්තය දිගු කිරීමට පියවර ගනිමින් තිබෙනවා. එය පරාජය කළ යුතුයි." ඔහු වැඩිදුරටත් පැවසීය.

මෙම අවස්ථාවට ජ.වි.පෙ. මධ්‍යමකාරක සභික පාර්ලිමේන්තු මන්ත්‍රී වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයාද එක්ව සිටියේය.

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත, බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# ජාතිවාදී වෛර වපුරන්නෝ හා හොරට නිදන ආණ්ඩුව

ජාතිවාදය හා ආගමික අන්තවාදය කුමන පැත්තෙන් ආවද එය සමාජ දේහයකට පිළිකාවක් වැනිය. මෙම ජාතිවාදී හා ආගමික අන්තවාදී 'පිළිකා සෛල' ලොව පුරාම මෙන්ම ලංකවේද තිබේ. ජනතාව අතර සමගිය හා සහජීවනය වෙනුවෙන් ඉහත පිළිකා සෛල ඉවත් කළ යුතු වුවත් එහි ප්‍රධාන වගකීම පැවරී ඇති ධනපති ආණ්ඩුව හොර නින්දකට වැටී සිටී. ඉඳහිට නින්දෙන් අවදි වූවාසේ නැගිට ප්‍රකාශයක් කොට යළිත් නින්දට වැටේ. ඒ තත්වය තුළ එක් එක් වර්ගයේ ජාතිවාදයන්, ආගමික අන්තවාදයන් එකිනෙකා පෝෂණය කර ගනිමින් වර්ධනය වේ. එය මානව සමාජයේ පැවැත්මට මාරාන්තික තර්ජනයක් වුවත් නිදහසේ වැඩීමට එයට ඉඩ ලැබී තිබේ. මේ නිසා මෙම බරපතළ ගැටලුවට ජාතිවාදය හා ආගමික අන්තවාදයේ වෛරය වපුරන අය සේම ඊට ඉඩදී දෑස් පියා සිටින ආණ්ඩුවද වගකිව යුතු වේ.

ජාතිවාදයත් ආගමික අන්තවාදයත් ලංකාව තුළ මෙන්ම ලොව පුරාවට පවතී. එය ලොවට, සමාජයට මිනිස් ජීවිතවලට කරන හානිය අපමණය. එහෙත් ජාතිවාදයෙන් හා ආගමික අන්තවාදයෙන් උමතුවූවන්ට එය නොතේරේ. මෙම විනාශකාරී, ප්‍රතිගාමී, මනෝභාවය ලොව තුළ පැවතීමට හේතුවන ප්‍රධාන කරුණු කිහිපක් තිබේ. එනම් ඓතිහාසිකව මිනිසුන් ආගම්වලට, ජාතිකත්වයන්ට, බෙදී සිටීමත් තමන්ගේ ජාතිය හා ආගම අන් අයට වඩා උසස් ලෙස සලකන හා එය ප්‍රචාරය කරන, එය අන් අය මත පටවන මානසිකත්වයක් ජාතික හා ආගමික අනන්‍යතා තුළ කොටු වීමේ මනෝභාවයක් මීට එක හේතුවක් වේ.

අනෙක් අතට ලෝක පරිමාණයෙන් අධිරාජ්‍යවාදයත් ජාතික පරිමාණයෙන් ඒ ඒ රටවල බංකොලොත් ධනපති නායකයෝත් මිනිසාගේ මෙම මනෝභාවය තම දේශපාලන බල අරමුණු වෙනුවෙන් යොදාගැනීමද තවත් හේතුවකි. මැද පෙරදිග කලාපයේ තම දේශපාලන බලය පවත්වා ගැනීමට එක්සත් ජනපදය ඉස්ලාම් අන්තවාදය පෝෂණය කළ බව කවුරුත් දන්නා දෙයකි. ඔවුන් දැනුදු එය කරමින් සිටී. ලංකාව වැනි රටවල ධනපති පක්ෂවල නායකයෝ තමන්ගේ ඡන්ද මලු පුරවා ගැනීමට ජාතිවාදය හා ආගම්වාදය යොදා ගනිති.

එසේම ධනවාදය තුළ ජීවත්වන සාතිශය බහුතරයක් ජනතාව ඉන් පීඩාවට පත්ව සිටී. එහෙත් එම පීඩාවේ හේතුව හඳුනා ගැනීමට ඔවුහු අපොහොසත්ය. ඒ නිසා තම පීඩාවට හේතුව ලෙස විවිධ වැරදි හේතු වටහා ගනිති. එස්ම මෙම පීඩාව සමාජය තුළ වරින්වර පුපුරා යන අතර එසේ පුපුරා යන එක් මාවතක් වන්නේ ජාතිවාදය හා ආගමික අන්තවාදයයයි. එබැවින් ජාතිවාදය හා ආගමික අන්තවාදය ලෙස පුපුරා යන්නේ අන් කිසිවක් නොව ධනවාදයේ පංති පීඩනයයි.

ලංකාවේ අතිතයේ පැවති සිංහල-දෙමළ ජාතිවාදය එහි උච්ඡතම අවස්ථාවට පැමිණියේ 83 කළු ජූලිය සමඟය. එය විසින් බිහි කරනු ලැබුවේ 30 අවුරුදු ජාතිවාදී යුද්ධයකි. එම යුද්ධයෙන් විනාශයට පත්වූයේ ජාතිවාදයන් වැපුරූ අය නොව ඊට ගොදුරු වූ සිංහල, දෙමළ මුස්ලිම් ජනතාවය.

දැන් මෑතක සිට වරින් වර සිංහල-මුස්ලිම් ජාතිවාදයක් ආගමික අන්තවාදී අදහස්ද සමඟ ඇවිළවීමට දෙපැත්තේම පිරිස් කටයුතු කරමින් සිටිති. බුදු දහමේත් ඉස්ලාම් ආගමේත් සැබෑ ඉගැන්වීම් නොසලකා ඒවා විකෘති කරමින් ජාතිවාදී හා ආගම්වාදී උමතු සටනකට මේ අන්තවාදී පිරිස එකිනෙකා හා තරග වදිමින් සිටී. මෙම උමතුව පිටුපස බංකොළොත් ධනවාදී දේශපාලන නායකයෝ මෙන්ම ව්‍යාපාරිකයෝද සිටිති. ඒ අතර සමාජයේ සිදුවන සමහර නීති විරෝධී කටයුතු වැළැක්වීමට ආණ්ඩුව මැදිහත් නොවීම නිසාද ඒවා ජාතිවාදී අර්ථයෙන් විග්‍රහ කරමින් අන්තවාදය පැතිරවීමට අන්තවාදී උමතුවට පත්වූවෝ කටයුතු කරති.

පසුගිය දිනවල විල්පත්තු ප්‍රදේශයේ කැලෑ කැපීම හා අනවසර නිවාස ඉදිකිරීම් පිළිබඳ ප්‍රශ්නයට ආණ්ඩුව වගකීමක් සහිතව මැදිහත් නොවීම නිසා ඉඩම් ඇල්ලීම මෙන්ම ඊට එරෙහි විරෝධයද ජාතිවාදී මුහුණුවරක් සහිතව පැන නැගුණි. එසේම නැගෙනහිර පළාතේ පුරාවිද්‍යාත්මක ස්ථාන පිළිබඳ ප්‍රශ්නයේදීද ආණ්ඩුව මැදිහත් වූයේ නැත. ඉන් වාසි ලබා ගන්නේ, ආගමික අන්තවාදීන්ය. එම අන්තවාදී ප්‍රශ්නවල ප්‍රතිඵලයක් ලෙස ඉස්ලාම් ආගමික ස්ථානවලට, මුස්ලිම් ව්‍යාපාරික ස්ථානවලට පහර දෙන විට, ගිනි තබන විට එයට ආණ්ඩුව මැදිහත් වන්නේද 'අශ්වයා ගියාට පසු ඉස්තාලය වසන' ප්‍රතිපත්තියෙනි.

මේ සියල්ලේ අවසන් ප්‍රතිඵලය වන්නේ, ජන සමාජය තුළ භීතිය නොසන්සුන්කම ඇතිකරමින් යළි ජාතිවාදී හා ආගම්වාදී අන්තවාදී රැල්ලකට ඉඩ විවරවීමය.

ජාතිවාදයත් ආගමික අන්තවාදයත් කුමන හේතුවක් නිසාවත් සාධාරණය කළ නොහැක. එය විසින් අපේ පංතියේ සමගියට ඇති ඉඩකඩ විනාශ කරන අතර ධනපති පාලනයේ පැවැත්මට අනියමින් විශාල සේවයක් කරයි. ඒ නිසා එය මිනිස් චින්තනය තුළින් ඉවත් කිරීමට ජාතික සමගිය අගයන ආගමික නායකයින්, උගතුන්, පෙරමුණ ගත යුතුය. රජයේ ජනමාධ්‍ය ඇතුළු සමාජයට වගකියන ජනමාධ්‍යයද කටයුතු කළ යුත්තේ මෙම අන්තවාදී උමතුවට උඩගෙඩි දීමට නොව එය පරාජයට පත් කිරීමටය. මෙහිදී ආණ්ඩුවට පැවරෙන්නේ විශේෂ වගකීමකි. ජාතිවාදී ලෙස ආගමික අන්තවාදී ලෙස අර්ථකථනය කර ගැනීම ඉඩ තිබෙන සංවේදී ප්‍රශ්නවලදී ආණ්ඩුව වහා මැදිහත් වී සාධාරණය ඉටුකළ යුතු අතර අන්තවාදී අදහස් පතුරවන ගැටුම් නිර්මාණය කරන අය කවුරුන් වුවත් ඔවුන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කළ යුතුය. ඒ හැර මෙම විනාශය වැළැක්වීමට වෙනත් මඟක් නැත.

එබැවින් මනුෂ්‍යත්වයට ගරුකරන හැම දෙනාම හිස එසවීමට උත්සාහ කරන මෙම ජාතිවාදී හා ආගමික අන්තවාදී ප්‍රවණතා පරාජය කොට එය පිළිකාවක් සේ සලකා සමාජ දේහයෙන් ඉවත් කර දැමීමට තම තමන්ට හැකි අයුරින් මැදිහත් විය යුතුය. මානව වර්ගයා යළි ම්ලේච්ඡත්වයට නොවැටීමට නම් එය අපේ යුගයේ අත්‍යාවශ්‍ය කරුණ වන අතර ඒ සඳහා ධනවාදය පැරදවීමද අවශ්‍යම කරුණක් බව වටහා ගත යුතුය.

# බලය තිබෙන්නේ ජනතාව අතේ



## ජනතා විමුක්ති පෙරමුණේ ජාතික සංවිධායක බිමල් රත්නායක සහෝදරයා

***නියමුවා:- ලෝක තරුණ හා ශිෂ්‍ය උළෙලේ සූදානම් කිරීමේ කමිටු රැස්වීම වෙනුවෙන් ඔබ පසුගියදා රුසියාවේ සංචාරයක නිරත වුණා. මේ සංචාරයේ අත්දැකීම් නියමුවා පාඨකයින් සමග බෙදාගත්තොත්.***

*බිමල් රත්නායක සහෝදරයා:-* විශේෂයෙන්ම ගත්තොත් ලෝක තරුණ හා ශිෂ්‍ය උළෙල මෙවර රුසියාවේ පැවැත්වෙනවා. ජනතා විමුක්ති පෙරමුණේ සමාජවාදී තරුණ සංගමයත් සමාජවාදී ශිෂ්‍ය සංගමයත් එහි ප්‍රධාන වගකීමක් උසුලන නිසා එහි සූදානම් කිරීමේ අවස්ථාවක් සඳහා මම සහභාගි වුණා. නමුත් මෙහිදී විශේෂයෙන්ම රුසියාවේ පැවැත්වෙන ලෝක තරුණ උළෙල පිළිබඳව නියමුවා පාඨකයින්ට ඉදිරියේදී ගොඩක් තොරතුරු දැනගන්නට ලැබේවි. ඒ නිසා මම කැමතියි මෙවර සංචාරයේදී මට ලැබුණු විශේෂ අවස්ථාවක් ගැන කථා කරන්න.

මැයි 9 වෙනිදා, රතු චතුරශ්‍රය වශයෙන් හැඳින්වෙන ක්‍රෙම්ලිනය ඉදිරිපිට පැවැත්වුණු, 1945 මැයි 09 දා සෝවියට් රතු හමුදාව අධිරාජ්‍යවාදී නාසිවාදී හිට්ලර්ගේ හමුදාව පරාජයට පත්කිරීම නිමිති කරගෙන පැවත්වුණු උත්සවයට සහභාගිවීමට මට අවස්ථාව ලැබුණා. විශේෂයෙන්ම 1939 ආරම්භවුණ දෙවන ලෝක යුද්ධයේදී ජර්මනිය, ජපානය, ඉතාලිය ඇතුළු පැසිස්ට්වාදී, නාසිවාදී බලවේගය තීරණාත්මකව පරාජයට පත්වුණේ සෝවියට් රතු හමුදාව මගින්. ඒ, සෝවියට් කොමියුනිස්ට් පක්ෂයේ නායකත්වය මත සිදුවූ දැවන්ත දේශප්‍රේමී යුද්ධය තුළ. මෙම සටනේදී ජර්මන් හමුදාව සහමුලින්ම පරාජයට පත්වුණා පමනක් නොව හිට්ලර් අවසානයේදී සියදිවි නසාගෙන ජර්මනිය දෙවන ලෝක යුද්ධය අතහැරදැමුවා.

මෙතන විශේෂත්වය තිබෙන්නේ, සෝවියට් දේශය මෙම මහා දැවැන්ත ජයග්‍රහණය ගත්තේ මිලියන් 27ක් තරම් ජීවිත පරිත්‍යාගයක් කරලා. මුළු දෙවන ලෝක යුද්ධයෙන් මැරුණු මිලියන් 50ක ජනතාවගෙන් මිලියන් 27ක් සෝවියට් පුරවැසියන්. එමනිසා එදා මෙදාතුර මේක දැවැන්ත පරිත්‍යාගයක්. හැම සෝවියට් පවුලකම කෙනෙක්, අදත් රුසියාවේ ජීවත්වන හැම පවුලකම එක් හෝ ඥාතියෙක් මේ මහා යුද්ධයේදී දිවි පුදා තියෙනවා; වින්දිතයන් බවට පත්වෙලා තියෙනවා. එම නිසා 1945 සිටම එදා සෝවියට් දේශය තුළත් අද රුසියාව තුළත් මේ නාසිවාදය පරදවලා සෝවියට් රතු හමුදාව මගින්, කොමියුනිස්ට් හමුදාව මගින් අත්පත්කර ගත්ත, සමාජවාදී රාජ්‍යය මගින් අත්පත්කර ගත්ත මහා දැවැන්ත ජයග්‍රහණය සමරනු ලබනවා. අද විශේෂත්වය තමයි ධනපති රුසියාවක් තියෙන එක. නමුත් රුසියාවේ ධනපති පුටින්ලට පවා එදා රතු හමුදාව කරන ලද දැවැන්ත කාර්යභාරය, සෝවියට් ජනතාව කරන ලද කැපකිරීම ඔවුන්ට ඉතිහාසය තුළ හංගන්න බැහැ. ඔවුන් විවිධාකාරයේ උපාය උපක්‍රම ඒ සඳහා දැනුත් යොදනවා. නමුත් අදත් ඒ සමරු උත්සවයේ අවස්ථා ගණනාවක් තිබෙනවා. එකක් තමා ජනාධිපති ප්‍රධානත්වයෙන් පැවැත්වෙන නිල උත්සවය. විශේෂ ආරාධනා මත අපත් එයට සහභාගිවුණා. එහිදී යුද හමුදා සංදර්ශන පැවත් වුණා. ඉන්පසුව වත්මන් රුසියානු කොමියුනිස්ට් පක්ෂය මගින් පවත්වනු ලැබූ ඔවුන්ගේ පෙළපාළියකටත් සමරු රැස්වීමකටත් අපි සහභාගි වුණා.

නමුත් විශේෂම දේ තමා රුසියානු ජනතාව විසින් අමරණීය රෙජිමේන්තුව නමින් ව්‍යාපාරයක් ගොඩනගාගෙන තිබීම. 'ඉමෝටල් රෙජිමන්ට්'. මෙය සිවිල් ස්වාධීන බිම් මට්මින් මතුවූ ව්‍යාපාරයක්. අද දසලක්ෂ ගණන් සහභාගිවන ව්‍යාපාරයක්. මිනිස්සු දේශපාලන පක්ෂ ආගම් භේදයෙන් තොරව මේ මහා දේශප්‍රේමී යුද්ධයේදී මියගිය සටන් කළ තමන්ගේ සීයා, පියා, මව, මිත්තණිය සිහිපත් කරමින් ඔවුන්ගේ ඡායාරූප රැගෙන මුළු රුසියානු රාජ්‍යය පුරාමත් රුසියානුවන් ජීවත්වන ලෝකයේ වෙනත් නගරවලත් ඇමරිකාවේ නිව්යෝර්ක්වල, ඕස්ට්‍රේලියාවේ මෙල්බන්වල, එංගලන්තයේ ලන්ඩන්වල, පැරිසියෙ ඇතැන්ස් මේ හැමතැනකම මහා දැවැන්ත පෙළපාළි පවත්වනු ලැබුවේ එමගින්. තමන්ගේත් අනාගතය මනුෂ්‍ය වර්ගයාගේත් අනාගතය රැකදීමට මේ දැවැන්ත දේශප්‍රේමී යුද්ධයේදී කටයුතු කරන ලද තමන්ගේ ඥාතීන් සිහිපත් කිරීමට ඔවුන් වීදි බැස්සා. මොස්කව් නගරයේ පැවැත්වූ පෙළපාලියට පමණක් ලක්ෂ අටකට වැඩි ජනතාවක් සහභාගි වුණා.

> ජනතාවගේ නැගිටීමක් නැතිව සැබෑ ලෙසම හොරු පරාජය කර ජනතාවාදී දේශපාලනයක් ගොඩනගා ගැනීම පක්ෂයකට විතරක් කරන්න බැහැ. ජ.වි.පෙ.ට පුළුවන් නායකත්වය දෙන්න පමණයි. ජ.වි.පෙ.ට පුළුවන් කරුණු කියන්න, මෙහෙයවන්න. නමුත් ජනතාව නැගිටිය යුතුයි. සමාජයේ පොදු ජනතා බලවේග දේශපාලන වශයෙන් සක්‍රීය කර මේ ධනපති පාලනය පරාජය කර ගැනීමට අවශ්‍ය ජනතා සන්ධානයක් සාර්ථකව ගොඩනැගීගෙන යනවා.

එහි තියෙන විශේෂත්වය තමයි, වත්මන් ධනපති රුසියාවේ නායකයන් ඒ සමාජවාදයේ ජයග්‍රහණ, බෝල්ෂේවික් වරුන්ගේ කැපවීම යටපත් කිරීමට උත්සාහ කළත් එය මුළුමනින්ම කරන්න ඔවුනට බැහැ. ඒ ඇයිද කියනවා නම්, මිනිසුන් යන පෙළපාළියේ ඔවුන් ගහගෙන යන්නේ, ඔවුන්ගේ සීයාට, තමන්ගේ තාත්තාට රතු හමුදාවෙන් ලැබුණ පදක්කම්, ලාංඡන. එහි තියෙන්නේ ලෙනින්ගේ පිංතූර. එහි තියෙන්නේ දෑකැත්ත මිටිය. අදත් රුසියානු හමුදාවේ ප්‍රධානම ලාංඡනය වශයෙන් දෑකැත්ත මිටිය පාවිච්චි වෙනවා. නමුත් ඒකෙන් දැන් රුසියාව සමාජවාදී රාජ්‍යයක් කියලා අදහස් වෙන්නෙ නැහැ. නමුත් ඒකෙන් පේනවා, ඒ සටන් කළේ රතු හමුදාව, කොමියුනිස්ට් හමුදාව කියන එක. ඒක යටපත් කරන්න බැහැ. තමන්ගේ රටේ අභිමානය රැකදුන් ඒ කොමියුනිස්ට් පක්ෂය ගැන දසලක්ෂ ගණන් රුසියානු ජනතාව උද්දාමයෙන් කථා කරනවා. එය ඔවුන්ගේ අලුත් පරම්පරාවන්ට ලබාදෙනවා. ඒ අපි ඇසින් දැක්ක දේ. මෙය රුසියාවේ අනාගත සමාජවාදී ව්‍යාපාරයට විශාල පිටිවහලක්. මේක වර්තමාන ධනවාදී රුසියාව වැටිල තියෙන තැනත්, ධනපති රුසියාවට අද අත්වී තිබෙන ඉරණමත් එදා සෝවියට් දේශය කොතරම් අභිමානවත්ව රාජ්‍යයක් වශයෙන් පැවතුණාද කියාත් වත්මන් තරුණ රුසියානුවන්ට හොඳම අත්දැකීමක් ලබාගන්නට පුළුවන් අවස්ථාවක් හැටියට තමා අපි දකින්නේ. එසේම අපි දකිනවා රුසියානුවන්ගේ මේ දේශප්‍රේමී හැඟීම තිබෙනතාක් ඇමරිකාව සතුව කුමන න්‍යෂ්ටික මිසයිල තිබුණත් එහි නායකත්වය විසින් පාවාදුන්නොත් හැරෙන්න වත්මන් රුසියාව යටත්කරන්න පහසුවේයැයි අප විශ්වාස කරන්නේ නැහැ.

***නියමුවා:- මෙවර ජ.වි.පෙ. මැයි දින සමරුව බොහෝ අංශවලින් කැපී පෙනෙනවා. වැඩි ජනතා සහභාගිත්වය හැරුණු විට යාපනයේ පළමුවරට මැයි රැලියක් පැවත්වීමත් ජාත්‍යන්තර නියෝජිතයින්ගේ සහභාගිත්වයත් කැපී පෙනුණා. මේ පිළිබඳව ඔබේ අදහස.***

*බිමල් රත්නායක සහෝදරයා:-* මෙවර පක්ෂයේ මැයි දිනය පක්ෂ ඉතිහාසයේ පවත්වන ලද විශාලම මැයි දිනය වශයෙන් සලකන්න වෙනවා. විශේෂයෙන් ගත්තොත් අපි කොළඹ පවත්වන ලද මැයි රැලිය එහි විශාලත්වය, ජන සහභාගිත්වය තුළ පමණක් නෙවෙයි, එහි විශේෂයෙන්ම ගත්තොත් ගුණාත්මක වෙනසක් තිබුණා. මේක ජනතා විමුක්ති පෙරමුණ විදියට මේ වනවිට 2020 පාර්ලිමේන්තු මැතිවරණය ඉලක්ක කරගෙන නව ජනතා බලවේග යක්, නව ජනතා සංධානයක් ගොඩනැගීම වෙනුවෙන් ක්‍රියාමාර්ග සැලසුම් කරගෙන ක්‍රියාත්මක කරන මොහොතක්. අපි මේ වන විටත් විවිධ ජනතා කණ්ඩායම්, සංවිධාන, වෘත්තිකයන් **15 වැනි පිටුවට**



## Yes We Can

තරුණ

# ලෝක සාමය වෙනුවෙන් ශ්‍රී ලංකාවේ සූදානම

*ලෝක ප්‍රජාතන්ත්‍රවාදී තරුණ සම්මේලනය (WFDY) යනු ලොව විශාලතම අධිරාජ්‍යවිරෝධී ප්‍රජාන්ත්‍රවාදී තරුණ සංවිධානයයි. මෙවර එහි ආසියා පැසිපික් කලාපයේ උප සභාපති ධුරය හිමිවී ඇත්තේ, සමාජවාදී තරුණ සංගමයට හා සමාජවාදී ශිෂ්‍ය සංගමයටය. ශ්‍රී ලාංකික සංවිධානයක් එහි ප්‍රධාන නිලයකට තේරී පත්වූ ප්‍රථම අවස්ථාව මෙයයි.*

*කෙසේවුවද WFDY මගින් ලොවපුරා විසිරී සිටින තරුණ හා ශිෂ්‍යයින් ඒකරාශි කරමින් සෑම වසර 04කටම වරක් ලෝක තරුණ හා ශිෂ්‍ය උළෙල (WFDY) පවත්වනු ලබයි. එහි 19වැනි උළෙල මේ වසරේ ඔක්තෝබර් මාසයේ රුසියාවේ සෝචි නුවරදී පැවැත්වීමට නියමිතය. එම උළෙලෙහි 03වැනි ජාත්‍යන්තර සූදානම් කිරීමේ කමිටුව පසුගිය 25,26,27 යන තෙදිනදී ශ්‍රී ලංකාවේ දී පැවැත්විණි. ශ්‍රී ලංකාවේදී මෙවැනි කමිටු රැස්වීමක් සංවිධානය කෙරෙන්නේ ප්‍රථම වතාවටය. ඒ සඳහා රටවල් 50කට ආසන්න ප්‍රමාණයක් නියෝජනය කරමින් නියෝජිතයින් 100කට අධික පිරිසක් සහභාගි වූහ. එසේම මේ සඳහා ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ සියල්ලම නියෝජනය කරමින් එක් ජාතික සූදානම් කිරීමේ කමිටුවක් ගොඩනගා තිබීමද විශාල ජයග්‍රහණයක් විය.*

*පහතින් දැක්වෙන්නේ එම උත්සවයේ විවිධ අවස්ථායි.*




















## සටන තුළ සැබෑ සටන

අප ජීවත්වන ලාංකේය භූමිය මත වත්මන් ආණ්ඩුව එරෙහි සටන් රැසක් නිර්මාණය වී තිබේ. රටේ වැඩ කරන ජනයා මෙන්ම තරුණ, ශිෂ්‍ය ප්‍රජාවන්ද වෙනසකින් තොරව ආණ්ඩුවට එරෙහි සටනට අවතීර්ණ වී ඇත. වත්මන් ආණ්ඩුවට එරෙහි වෘත්තීය ක්ෂේත්‍රයේ අයිතිවාසිකම් දිනා ගැනීම වෙනුවෙන් ඇරඹි සටන් පවතී. ඒ අතර විශේෂිත සටනක් ලෙස සයිටම් සටන හැඳින්විය හැකිය. වෘත්තිකයන් මෙන්ම ශිෂ්‍ය ප්‍රජාව, මෙන්ම රටේ සිවිල් සංවිධාන හා බොහෝ විද්වත්හු මේ සමග බද්ධ වී සිටිති.

මෙම උද්ඝෝෂණ ක්‍රියාමාර්ගවල සිටින ප්‍රගතිශීලී බලවේගයන්ට සැලකිල්ලට ලක්කිරීමට සිදුවෙන කාරණා කිහිපයක් වෙයි. එක් පසෙකින් යළි හිස එසවීමට මාන බලමින් ඕනෑම සටන් පාඨයක එල්ලීමට දතකන මහින්ද රාජපක්ෂ කණ්ඩායම සිටිනු පෙනේ. සයිටම් ආයතනයට මූල්‍ය උදව් පවා ලබාදී එයට උපාධි පිරිනැමීමේ නීතිමය බලය සැපයුවේද රාජපක්ෂ සමය තුළය. එහෙත් අද හුදු බලලෝභය නිසාවෙන්ම එම කණ්ඩායම සයිටම් විරෝධී සටන් පාඨ කියන්නට පටන්ගෙන තිබේ. මොවුන්ගේ විරෝධය සැබෑ විරෝධයක්ද නැතහොත් සයිටම් වෙනුවෙන් පෙනිසිටින කුමන්ත්‍රණයක්දැයි යන්න පිළිබඳව අවධානයෙන් සිටීම වැදගත්වනු ඇත. ඒ අතර සයිටම් විරෝධී සටන තුළ මූලධර්මවාදී අතිවාම යැයි කියාගත් හැඩයෙන් පෙනී සිටින කණ්ඩායම් ඔවුන්ගේ පටු දේශපාලන අවශ්‍යතාවයන් වෙනුවෙන් හා ඔවුන්ගේ පොදු ක්‍රියාවලියේ තිබෙන දුබලකම් හා බැරිකම් වසාගැනීමට සයිටම් සටන යොදා ගැනීමට උත්සාහ ගනිමින් සිටී.

ඒ අතර ආණ්ඩුවේ බලධාරීන් ජනතාවට කොළේ වසමින් සයිටම් අර්බුදය විසඳු බවට ව්‍යාජ විසඳුම් ඉදිරිපත් කරමින් සිටී. සයිටම් අයිතිකරුවන් ඇතුළු ඒ වෙනුවෙන් පෙනී සිටින කණ්ඩායම් ඇති තරම් මුදල් වියදම් කරමින් බිලිබාගත හැකි සියලුදෙනා බිලිබා ගනිමින් කෙසේ හෝ සයිටම් නීත්‍යානුකූල කරගැනීමට අර අඳිමින් සිටී.

මේ පවතින තත්වය තුළ සයිටම් සටන පොදු සමාජ අරගලය සමග බද්ධ කරමින් සැබෑලෙස ජයග්‍රහණය කිරීමට සටන් වැදීම සටනේ සිටින සැබෑ ප්‍රගතිශීලීන්ගේ අභියෝගය වී තිබේ.

සැබෑ පංති ව්‍යාපාරයේ කාර්ය භාරය සතුරන්, අවස්ථාවාදීන්, කට්ටිවාදීන් හෙළි කිරීම හා සටන නිවැරදි මගට ගෙන ඒමය. එහෙයින් පංති ව්‍යාපාරය පොදු සටනේ හිඳිමින් තීරණාත්මක අවස්ථාවේ සටන අතට ගනිමින් හා බොරු සටන්කරුවන්ගේ උපක්‍රම බිඳ හෙළමින් කටයුතු කිරීම පීඩිත පංතියේ දේශපාලන අවශ්‍යතාවය වෙමින් තිබේ.

මෙහිදි විප්ලවාදි ව්‍යාපාරයේ පෙරමුණු කාර්යභාරයත් ඉටුකරමින් සිටින හා ඉටු කළ යුතු තරුණ විප්ලවවාදින්ට විශේෂ කාර්යභාරයක් පැවරේ. ලෙනින් පැවසු පරිදිම ඉතිහාසයේ සටන්කරුවන්ට වඩා හොඳින් වර්තමාන සටන්කරුවෝ සටන් කරමින් සිටිති. ඒ වගේම අනාගත සටන්කරුවන් වර්තමාන සටන් කරුවන්ට වඩා හොඳින් සටන් කරනු ඇත. ඔවුන් ජයග්‍රාහිද වනු ඇත. අනාගතය හිමිකරුවෝ තරුණයෝය. ඔවුන් යන මඟ නිවැරදි විය යුතුය. දේශපාලන අරමුණු සම්බන්ධයෙන් විශේෂ කියවීමක් අවශ්‍යවන්නේ මෙවන් මොහොතකය. සිදුවීම් හෝ ක්‍රියාමාර්ග නොව අරමුණ හදුනාගත යුතුව ඇත. සිදුවීම් හා ක්‍රියාමාර්ගයන්හි පෙනුම පමණක් ප්‍රගතිශීලී වූ පමණින් ක්‍රියාමාර්ග නිවැරදි වන්නේ නැත. ඔවුන්ගේ සැබෑ අරමුණු හඳුනාගත යුතුය. එසේ තේරුම් ගනිමින් වෙනස්කම් සහිතව වුවද එක්ව සටන් කළ හැකි සටන් පෙරමුණක් නිර්මාණය කරගැනීමට සිදුවන අතර ඒ තුළ අවංකවම හා නිවැරදිව සටන් කිරීමෙන් පමණක් සටන ජයග්‍රහණය කළ හැකිවනු ඇත.

### ජනපති මෙහෙයුමටත් ඩෙංගු...

*රටපුරාම ඩෙංගු රෝගය ව්‍යාප්ත වීමත් මරණ සංඛ්‍යාව ඉහල යාමත් හේතුවෙන් නැවතත් ඩෙංගු රෝග නිවාරණය පිළිබඳව කතාබහක් රට පුරා ඇතිවී ඇති අතර පසුගිය මාස පහ පුරාවටම ඩෙංගු රෝගීන් බවට සැක කෙරෙන පුද්ගලයින් 53,234 දෙනෙකු රට පුරා වාර්තා විය.*

*ඩෙංගු මරණ සංඛ්‍යාව 100 ඉක්මවා ගොස් තිබේ. රට පුරා ඩෙංගු උණ වසංගත තත්වයකට පත්ව තිබේ. නමුත් පසුගිය කාලය පුරාවටම රට පුරා ඩෙංගු මර්දන වැඩසටහන් මහා පරිමාණයෙන් ක්‍රියාත්මක කෙරිණි. ජනාධිපති කාර්යය සාධක බලකායන් ඇති කරන ලද අතර මදුරුවන් බෝවන ස්ථාන පවත්වාගෙන යාමේ චෝදනාව මත ජනතාවට දරාගත නොහැකි ලෙස අධික දඩ මුදල් හා නඩු ක්‍රියාමාර්ග ගැනිණි. නමුත් මෙම කිසිදු ක්‍රියාවකින් ඩෙංගු රෝග මර්ධනයක් සිදුව නොමැති අතර එය දිනෙන් දින වැඩි වෙමින් වඩාත් වැඩියෙන් ජන ජීවිතයට බලපෑම් කරමින් තිබේ. මෙම තත්වයට සැබෑ විසදුමක් සෙවීමට නම් මුළු රටම එක් මධ්‍යගත වැඩ පිළිවෙළක් යටතේ සියලු ජනතාව සක්‍රීයව දායක කරගනිමින් මදුරු මර්දන වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතුව තිබේ. ඩෙංගු රෝග මර්දනය පිළිබඳව හොදම උදාහරණය සහ ආදර්ශය අපිට සමාජවාදී කියුබාවෙන් ලබාගත හැකි අතර අවශ්‍ය වන්නේ නිවැරදි දැක්මත් මැදිහත් වීමත් පමණි. එහෙත් එවැනි මැදිහත් වීමත් අපට කිසිදා මෙම ධනපති පාලකයන්ගෙන් බලාපොරොත්තු විය නොහැක.*

### දරිද්‍රතාවය වැඩිවෙයි...

*ලංකාවේ ජනගහණයෙන් දොළොස් ලක්ෂයක් එනම් 6.7% අධික දරිද්‍රතාවයෙන් පෙළෙන බව ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තුමේන්තුව පවසයි. අන්තර් ජාතික දරිද්‍රතා මට්ටම ලෙස පිළිගනු ලබන්නේ දිනකට එක් පුද්ගලයෙකුට හිමි වත්කම ඇ:ඩො 1.9 ක් හෝ ඊට අඩු මට්ටමක පැවතීමයි. ලංකාවේ ගෘහස්ථ ඒකාබද්ධ සමීක්ෂණයට අනුව ලංකාවේදී එය නිර්ණය කරනු ලබන්නේ කිසියම් පුද්ගලයෙකුගේ ඒක පුද්ගල පරිභෝජන වියදම මසකට රු. 3624 කට වඩා පහළ මට්ටමක තිබීම මතයි.*

*නිෂ්පාදන ආර්ථිකය කඩා වැට්ටවීමත්, ආනයන මත යැපීමත් රටට ඇති ආදායම් ලෙස ජනතාව අධික ලෙස බදු බර හා දඩ ගැසීම් වැඩි කිරීමත්, ණය උගුලක රට සිර කිරීමත්, එලෙස රටට ලැබෙන ආදායම් ජනතාව අතර බෙදීයාමේ විෂමතාවයත් නිසා මෙම තත්වය වඩාත් උග්‍ර වී තිබේ.*

*අප මේ අත් දකිනුයේ පසුගිය වසර 70 පුරාවට අපේ රට පාලනය කළ ධනපති පාලකයින් අප රටටත් ජනතාවටත් අත්පත් කර දී ඇති සමාජ ආර්ථික තත්වය වන අතර මෙම තත්වය වැළැක්වීමට නම් පවතින අසාධාරණ ධනේශ්වර සමාජ ආර්ථික ක්‍රමය වෙනස් කිරීම අනිවාර්ය වී තිබේ.*

තමන් ගමන් කළ යුත්තේ, නිර්මාණාත්මක
පරාර්ථකාමීභාවයේ ආලෝකය
තුළින් ද, නොඑසේනම්, විනාශකාරී
ආත්මාර්ථකාමීභාවයේ අඳුර තුළින් ද යන්න,
සෑම මිනිසෙකුම තීරණය කළ යුතුය.

මාටින් ලූතර් කිං

### රුපියල් පහක්....

බිම වැටුණු රුපියල් පහ
අහිඳින්න නැමෙන කොට
යාදිනිය බස් එකේ..
ගැහුවා බ්රේක් "ක්‍රාස්"...
යදින්නෙක් පාර මැද...
"බූරුවෝ... මැරෙන්ඩද හදන්නේ..
අසයි කොන්දොස්තර
ඇස් ලොකුකර..
ඇගේ ඇස් බැගෑපත්ව
මා වෙත..
ඉල්ලයි රුපියලක්..
වෙළෙන්දෙක් කෑගසයි..
"හිවල් ගෑනි.. බැහැපිය..
මටත් බඩගිනි.."
තවත් ඇය බැගෑපත්ව..
දුනිමි රුපියල් පහක්.
මමත් උඹ වගේමයි..
ටයි පොල්ලකුත් බැන්දනම් උඹ..
කෝප්පෙකුත් ගත්තනම් මම..



# මැදමුලනේ සිහිනය හා දේශපාලනයේ යථාර්ථය



2005 සිට 2015 ජනවාරි දක්වා කාලය තුළ දෙවරක් ජනාධිපති ධුරය දැරූ මහින්ද රාජපක්ෂ මහතා 2015 ජනාධිපතිවරණයෙන් පරාජයට පත්වීමෙන් පසු ඊළඟ මහමැතිවරණයේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් ලෙස පාර්ලිමේන්තුවට පැමිණීම විසින් පෙන්නුම් කරනු ලැබුවේ ඔහු බලයට කොතරම් කෑදරද යන්නය. එතැන් සිට මේ දක්වා ගෙවුණු කාලය තුළ ඔහු "යළි බලයට පත්වීමේ" සිහිනයක් දකින අතර, තමා වටා සිටින චෞර කල්ලියත් අන්ධ අනුගාමිකයෝත් එම සිහිනය තුළ සතපවා තැබීමටද උත්සාහ දරමින් සිටී. "ඊළඟ වසරේ ආණ්ඩුව පෙරළනවා" "තව පෝය දෙකකින් ආණ්ඩුව අල්ලනවා" වැනි අතාර්කික බලාපොරොත්තු හදමින් එළුවාගේ මොකක්දෝ වැටෙන තුරු බලා සිටි නරියාගේ කථාව සිහිපත් කරමින් බලය දෙස බලා සිටී.

බලයේ පිපාසයෙන් පෙළෙන මැදමුලන රාජපක්ෂවරුත්, මහින්ද වටා සිටිනවා හැර වෙනත් විකල්පයක් නැති දේශපාලන අනාථයෝත් චෞරකල්ලියත් වලව්වලට ගැතිවීමේ වැඩවසම් මානසිකත්වයෙන් යුත් අතාර්කික මහින්දවාදීහුත් මේ සිහිනයෙන් නිතර සතුටට පත්වෙති. එහෙත් ඒ අතරම දේශපාලනයේ සැබෑවටම පවතින යථාර්ථය දැකීමට ඔවුහු අපොහොසත් වෙති. මේ වනවිට වත්මන් ආණ්ඩුව පත්ව ඇති අර්බුදය හා අරාජිකත්වය ඉහත සිහිනය දැකීම සඳහා රාජපක්ෂවරුන්ට කදිම හේතුවක්ද සපයා ඇත.

වත්මන් මෛත්‍රී-රනිල් හවුල් ආණ්ඩුව අර්බුදයකට මුහුණදී තිබෙන බවත් ආණ්ඩුව දුර්වල බවත් එය සමාජයේ අරාජිකත්වයක් නිර්මාණය කරමින් තිබෙන බවත් සත්‍යය. ඒ නිසාම ආණ්ඩුව ඉක්මනින් කඩා වැටෙනු ඇතැයි සිතීමට ජනතාව පෙළඹ සිටී. එහෙත් ආණ්ඩු කරන කණ්ඩායම් අර්බුද මැද පවා ආණ්ඩුව පවත්වාගෙන යාමට කටයුතු කරමින් සිටියි. ආණ්ඩුවේ අර්බුදයට බලපාන ප්‍රධාන හේතු කිහිපයක් තිබේ. එක් අතකින් ආණ්ඩුව විශාල ආර්ථික අර්බුදයකට, මූල්‍ය අර්බුදයකට මුහුණ පා ඇත. ඒ නිසා රට තුළ මුදල් සංසරණය සිදුවන ඉදිකිරීම් හෝ ආර්ථික ව්‍යාපෘති සිදුවන්නේ නැත. එහි ප්‍රතිඵලය වන්නේ මුදල් සංසරණය අඩුවීම නිසා ආර්ථිකය හැකිළීමත් ඒ තුළ විවිධ ජන කොටස් අර්බුදයට ලක්වීම හා ඒ මගින් ආණ්ඩු විරෝධයක් නිර්මාණය වීමත්ය.

අනෙක් අතට රට තුළ මතුව ඇති උද්ඝෝෂණ රැල්ල විසින් ආණ්ඩුවේ ශක්තියට අභියෝග කර තිබේ. විශේෂයෙන් සයිටම් විරෝධී සටන, ගොවි උද්ඝෝෂණ, වරාය විකිණීමට එරෙහි උද්ඝෝෂණ, ත්‍රිමලේ තෙල් ටැංකි විකිණීමට එරෙහි සටන් ආදිය නිසාත් ඒවාට මුහුණදීමේදී ආණ්ඩුව පෙන්නුම් කරන අපරිණත ස්වභාවය නිසාත් ආණ්ඩුවේ දුර්වලකම ප්‍රකාශ වෙමින් තිබේ. ත්‍රිකුණාමලේ තෙල් ටැංකි විකිණීමට එරෙහි තෙල් සංස්ථා සේවක වැඩවර්ජනය හමුවේ දණගැසීමට ආණ්ඩුවට සිදුවූ අතර, මේ ලෙස වර්ධනය වන උද්ඝෝෂණ හා සටන් විසින් ආණ්ඩුවේ පැවැත්ම අස්ථාවර බවක් පෙන්වමින් තිබේ.

එසේම ආණ්ඩුව කරන පාර්ශ්ව දෙක අතර පවතින ප්‍රතිවිරෝධය හා ආණ්ඩුවේම මැති ඇමතිවරු එකිනෙකා විවේචනය කර ගැනීම මගින්ද ආණ්ඩුවේ දුර්වලතාවය ප්‍රකාශයට පත්වේ. නව කැබිනට් සංශෝධනය මගින්ද පෙන්නුම් කරනු ලැබුයේ මෛත්‍රී පිල හා රනිල්ගේ එ.ජා.ප.ය අතර වන ප්‍රතිවිරෝධයය. ඔවුන් ආණ්ඩුවේ පැවැත්ම වෙනුවෙන් තම කණ්ඩායම් සතුටු කිරීමට දරන උත්සාහය ඉන් පැහැදිලි විය. එහෙත් සිදුවෙමින් පවතින්නේ, මෙකී පාර්ශ්ව දෙකේ සමහරු සතුටු වෙද්දී සමහරු අසතුටට පත්වීමත් ඒ නිසාම ආණ්ඩුවේ අභ්‍යන්තර අර්බුදය වැඩිවීමත්ය.

මෙම සියලු කරුණුත්, මෙරට ජනතාව ආණ්ඩුවෙන් බලාපොරොත්තු වූ වංචා දූෂණ නතර කිරීම, හොරුන්ට දඬුවම් දීම වැනි දේ සිදුනොවීමත් ආණ්ඩුවේ හොරකම හා නාස්තිය වැඩිවීමත් නිසා ආණ්ඩුව ගොඩනැඟූ බලවේගම ආණ්ඩුව කෙරෙහි කලකිරී සිටියි. ආණ්ඩුව කරගෙන යන කණ්ඩායම් දෙක වන එ.ජා.ප.යට හා ශ්‍රීල.නි.ප. මෛත්‍රී පිලට මැයි දිනය සාර්ථක කර ගැනීමට නොහැකිවීම විසිනුත් මෙය ප්‍රකට වේ.

> බලයේ පිපාසයෙන් පෙළෙන මැදමුලන රාජපක්ෂවරුත්, මහින්ද වටා සිටිනවා හැර වෙනත් විකල්පයක් නැති දේශපාලන අනාථයෝත් චෞරකල්ලියත් වලව්වලට ගැතිවීමේ වැඩවසම් මානසිකත්වයෙන් යුත් අතාර්කික මහින්දවාදීහුත් මේ සිහිනයෙන් නිතර සතුටට පත්වෙති. එහෙත් ඒ අතරම දේශපාලනයේ සැබෑවටම පවතින යථාර්ථය දැකීමට ඔවුහු අපොහොසත් වෙති.

ආණ්ඩුව මුහුණ දී සිටින මෙම අර්බුදකාරී තත්වය තුළ ආණ්ඩුව ඉක්මනින් පරදා මහින්දගේ පාලනයක් හැදීමේ සිහිනය වර්ධනය වෙමින් තිබේ. එහෙත් සැබැවින්ම දේශපාලන යථාර්ථය තුළ මහින්දට යළි බලයට ඒමේ මඟක් නැත. මැදමුලන වලව්වේ දාසයෝත් රාජපක්ෂ වටා සිටින චෞර කල්ලියත් නොදකින හෝ නැතිනම් නොදැක්කාසේ සිටින යථාර්ථය එයයි. මහින්ද වටා සිටින පිරිස (මැයි දිනයේද දුටු පරිදි) විචාරයක් නැති, කිසිදු සදාචාරයක් නැති පිරිසකි. ඔවුන් සිටින්නේ පක්ෂයක් වටා, පක්ෂයක් දිනවීමට නොව මහින්ද වටා මහින්ද දිනවීමටය. එවිට මහින්ද රාජපක්ෂ සාධකය මූලික සාධකය වේ. එහෙත් අපේ රටේ 19වැනි ව්‍යවස්ථා සංශෝධනයට අනුවත් දේශපාලනයේ බලවේග පෙළගැසී තිබෙන ආකාරය අනුවත් මහින්දට බලයට ඒමට මඟක් පෙනෙන තෙක් මානයක නොවේ.

රටේ පාලන බලය මාරුකරන අවස්ථාව ලෙස මීළඟට ජනාධිපතිවරණයක් එන්නේ නම් (විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමේ ආණ්ඩුවේ පොරොන්දුව අනුව එවැන්නක් ඒමට ඉඩ නැතත්) එහිදී 19වැනි සංශෝධනයට අනුව මහින්දට තරග කළ නොහැක. එවිට මහින්ද බලයට එන්නේ නැත. රාජපක්ෂ පිලේ වෙන අයෙකුට හෝ මැදමුලනේ වෙනත් කෙනෙකුට මහින්දට ගත හැකි ඡන්දයක් ගැනීමට නොහැක. ඒ නිසා ජනාධිපතිවරණයක් පැවැත්වුවහොත් මහින්දට එයට තරග කළ නොහැකි අතර, එම කල්ලියේ වෙන කෙනෙකුට ජය ගැනීමටද නොහැක. තමන්ට නොලැබෙන බලය තම දරුවන්ට මිස තම කණ්ඩායමේම වුව, වෙනත් කෙනෙකුට ලැබෙනවාට මහින්ද පවා කැමති වන්නේ නැත. මේ නිසා ජනාධිපතිවරණයකින් මහින්දට හෝ මහින්දවාදීන්ට බලයට ඒමට මඟක් නොමැත.

එසේ නැතිව මහමැතිවරණය පැමිණියහොත් මහින්ද රටේම ඡන්දය ඉල්ලන කෙනෙක් වන්නේ නැත. එවිට ඔහුට ඡන්දය ඉල්ලීමට සිදුවන්නේ දිස්ත්‍රික්කයක් තුළ අපේක්ෂකයෙක් ලෙසය. එවිට මහින්දවාදී මනෝභාවයන්ගෙන් වැඩි වාසි අත් නොවේ. මහමැතිවරණයකදී තත්වය වෙනස් වේ. ශ්‍රීල.නි.ප.ය දෙකඩ වී තිබීම, මහින්ද වටා සිටිනවුන් රැසකට වංචා දූෂණවලට සම්බන්ධ නඩු වැටී තිබීම, ඔවුන් ඡන්ද ගතහැකි ආකර්ෂණීය පුද්ගලයන් නොවීම වැනි සාධක නිසා මහින්ද කණ්ඩායමට පාර්ලිමේන්තුවේ බහුතර බලය ලබාගැනීමට හැකි ඉඩක් ඇත්තේම නැත. 2015 මහමැතිවරණයේදී මෛත්‍රී හා මහින්ද එක්ව කටයුතු කරමින් තරග වැදුණු තත්වය තුළත් ආසන 100ක් ගැනීමට ඔවුන්ට නොහැකි විය. දැන් පක්ෂය කැඩී, නඩු වැටී බලවේග දුර්වලව තිබෙන තත්වයක් තුළ පාර්ලිමේන්තු ඡන්දයකින් ආණ්ඩු පිහිටුවීමට කිසිසේත් ඉඩක් නැත.

අනෙක් අතට දේශපාලන ක්‍රියාකාරිත්වය දෙස බලනවිට පෙනෙන්නේ කුමක් ද? ආණ්ඩු විරෝධී දැවැන්ත බලයක්, ආණ්ඩුවක් පැරදවීමට ප්‍රමාණවත් ආණ්ඩු විරෝධී ක්‍රියාකාරිත්වයක් අත්පත් කර ගැනීමට මහින්ද කණ්ඩායම අපොහොසත්ව සිටින බවය. දැනට රටේ සිදුවන ආණ්ඩු විරෝධී උද්ඝෝෂණවලට කිට්ටුවීමට රාජපක්ෂවරුන්ට නොහැකිවී තිබේ. සයිටම් ආරම්භ කළේ මහින්දගේ පාලනය තුළ නිසාත් ඔහු ඊට බැංකු ණය පවා ලබාදී උදව් කළ නිසාත් සයිටම් විරෝධී සටන තම අතට ගැනීමට හෝ ඊට දායකවීමට පවා මහින්දට නොහැකිවී තිබේ. ගොවි සටන්වලදී හා රටේ සම්පත් විකිණීමට එරෙහි සටන්වලදීද රාජපක්ෂවරුන් අදාළ වන්නේ නැත. සයිටම් සටනට වෙනත් කරුණුද එක්කරමින් එම සටන් වේදිකාව මහින්දලාටද විවෘත කිරීම සඳහා රජයේ වෛද්‍ය සංගමයේ නිලධාරී ඇතුළු කීපදෙනෙක් උත්සාහ ගත්තද එයද සාර්ථක වී නැත. රාජපක්ෂවරුන් තවම සිටින්නේ ජනතාවගේ සටන්වලට එකතුවීමට නොහැකිව ඊට පිටිනි.

මෑතකදී

15 වැනි පිටුවට



"එනයින් සමාජය වෙනස්වීමේ දේශපාලන විප්ලවයන් හටගැනීමේ අවසාන හේතුව සෙවිය යුත්තේ මිනිසුන්ගේ මොළ තුළ නොව, එසේත් නැතහොත් සදාකාලික සත්‍යය සහ සාධාරණත්වය ගැන මිනිසුන් ලබන වඩාත් වැඩි වන අවබෝධය තුළ නොව, නිෂ්පාදන ක්‍රමයේ සහ හුවමාරුවේ වෙනස්වීම් තුළය. ඒවා සෙවිය යුත්තේ දර්ශනවාදයෙහි නොව ඒ ඒ යුගයට අනුරූපවන ආර්ථිකයෙහිය."

**එංගල්ස්**
**සමාජවාදය මනෝරාජ්‍යයෙන් විද්‍යාව දක්වා...**
**31-32 පිටු**

# මැයි දිනයට සැබෑ අරුතක්




2017 මැයි පළමුවෙනිදා මෙරට විවිධ දේශපාලන පක්ෂ සහ සංවිධාන පෙළපාලි, රැස්වීම් සහ සම්මන්ත්‍රණ ආදිය පැවැත්වුවද මැයි දිනයේ සැබෑ අර්ථය නිරූපනය වන ආකාරයේ පෙළපාලියක් සහ රැලියක් පැවැත් වූයේ ජ.වි.පෙ. පමණි. එ.ජා.ප.ය, මෛත්‍රී, මහින්ද විසින් පවත්වන ලද දේශපාලන රැලි සැබෑ මැයි දින සැමරුම්ද යන්න වෙනම සලකා බැලිය යුතුය. මේ කාණ්ඩ තුනේම රැස්වීම් සහ පෙළපාලිවල දක්නට ලැබුණේ එකම වර්ගයේ ක්‍රියාකාරකම්ය. බීමතින් සිටිනා මිනිසුන්, තම සංවිධායකයන්ගේ තොප්පි දමා ගනිමින් තම තමන්ගේ නායකයන්ගේ ගුණ වයනා කණ්ඩායම් ආදී විකාර රූපි දසුන්ය.

මෙවන් වට පිටාවක් තුළ යෝධ පියවරක් ඉදිරියට තබමින් වසර 30කට අධික කාලයක් යුදමය වටපිටාවක් තුළද ඉන්පසු රාජපක්ෂ කල්ලියේ පීඩනයටද නතුව තිබූ උතුරු පළාත තුළද ජාත්‍යන්තර කම්කරු දිනය සැමරීමට ජ.වි.පෙ.ට හැකි විය. මැයි පළමුවැනිදා යෙදෙන මැයි දිනයට සමගාමීව අප්‍රේල් 30වැනිදා "ජාතික සමගිය හා සමානාත්මතාවය සඳහා සමාජවාදය" යන තේමාව යටතේ මෙය පැවැත්වුණි. මේ සඳහා ජ.වි.පෙ. නායක අනුර දිසානායක, යාපනය දිස්ත්‍රික් ජ.වි.පෙ. සංවිධායක රාමලිංගම් චන්ද්‍රසේකර් සහ විදෙස් නියෝජිතයින් මෙන්ම උතුරු පළාතේ ධීවර, ගොවි සමිති නියෝජිතයින් සහ විශ්වවිද්‍යාල ආචාර්යවරුද සහභාගී වී සිටියහ. යාපනය මුට්‍රවෙලි පිටියේදී රැලිය පැවැත්වුණු අතර ඒ සඳහා ජ.වි.පෙ. නායකයන් ඇතුළු විශාල පිරිසක් යාපනය දුම්රියපොළ අසල සිට පෙළපාලියකින් පැමිණියහ.

1886 චිකාගෝ නුවර හේමාකට් චතුරස්‍රයේදී පැය අටේ වැඩ දිනයක් ඉල්ලා අරගල කළ කම්කරුවන්ගේ හඬ නියෝජනය කරමින් අති දැවැන්ත රැලියක් සහ පෙළපාලියක් මැයි පළමුවෙනිදා කොළඹදීද පැවැත්වීමට ජ.වි.පෙ. සමත් විය. "ජනතා හඬ - ජනතා බලය දිනවන රතු මැයි රැලිය" යන තේමාව යටතේ දෙහිවල ජයසිංහ ක්‍රීඩාංගණයෙන් පෙළපාලිය ආරම්භ වූ අතර රැලිය කොළඹ බී.ආර්.සී. පිටියේදී පැවැත්විණි. ජ.වි.පෙ. නායක අනුර දිසානායක, ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා ඇතුළු කියුබාව, ඉන්දියාව, ග්‍රීසිය සහ මහා බ්‍රිතාන්‍ය නියෝජනය කරමින් විදෙස් නියෝජිතයෝද මෙයට සහභාගී වී සිටියහ.

මෙයට සමගාමීව ඕස්ට්‍රේලියාව, ස්වීඩනය, ප්‍රංශය, මහා බ්‍රිතාන්‍යය සහ ස්විස්ටර්ලන්තය ආදී රටවල ජ.වි.පෙ. විදෙස් කමිටු එම රටවල වාමාංශික කණ්ඩායම් හා එක්ව ජාත්‍යන්තර කම්කරු දිනය සැමරීමට එක්විය.



# පලස්තීන පෙත්සමට ජ.වි.පෙ. සහය

ධනවාදය එහි අවසාන කාර්තුව වන අධිරාජ්‍යවාදී අවධිය පසු කරමින් සිටින තත්වයක් තුළ එහි අර්බුදය වඩා තීව්‍ර වී තිබේ. එනිසාම අධිරාජ්‍යවාදී කඳවුර තවත් ලෝක යුද්ධයකට අත වනමින් තම අර්බුදය පියමන් කිරීමට කටයුතු කරමින් සිටී.

අධිරාජ්‍යවාදී කඳවුරේ මූලිකයා වන ඇමරිකා එක්සත් ජනපදය තම බෙදුම්වාදී ක්‍රියා මාර්ග පුළුල් කරමින් රටවල් අතර මෙන්ම ඒවා අභ්‍යන්තරයේද විවිධ කණ්ඩායම් යොදාගනිමින් ගැටුම් ඇති කරමින් සිටියි. වර්ෂ 1947 දී පලස්තීන භූමිය තුළ ඊශ්‍රායල රාජ්‍යය ස්ථාපිත කරනු ලැබීමට එක්සත් ජාතීන්ගේ සංවිධානයට සිදුවන්නේද මේ එක්සත් ජනපද වුවමනාවටය. එසේ නොනැවතුණු ඔවුන් ඊශ්‍රායලය හරහා දියත් කළ යුද ක්‍රියාමාර්ග හේතුවෙන් අදටත් පලස්තීන ජනතාවට තමන්ගේම වූ නිල රටක් නැත.

ඊශ්‍රායලය විසින් පලස්තීනයට කරනු ලබන බලපෑම් සම්බන්ධයෙන් නවතම ප්‍රවෘත්තිය වූයේ තම නිදහස වෙනුවෙන් ඊශ්‍රායල් සිරමැදිරි තුළ නිරාහාරව උපවාසයක යෙදී සිටින පලස්තීන සිරකරුවන්ට බලහත්කාරයෙන් ආහාර ලබාදීමට ඊශ්‍රායල බන්ධනාගාර නිලධාරීන් විසින් කටයුතු කිරීමය. විශේෂයෙන් ඊශ්‍රායල් වෛද්‍යවරුන් විසින් පවා මෙසේ බලහත්කාරයෙන් ආහාර ලබා දීම ප්‍රතික්ෂේප කර ඇති තත්වයක් තුළ වෙනත් රටවලින් හෝ වෛද්‍යවරු ගෙන්වා බලහත්කාරයෙන් ආහාර ලබාදීමට ඔවුන් විසින් තීරණය කිරීමත් සමග තත්වය වඩාත් උණුසුම් විය.

මේ අත්තනෝමතික ක්‍රියාවට එරෙහිව මෙන්ම එම සිරකරුවන් වහා නිදහස් කරන ලෙසට ඊශ්‍රායලයට බල කිරීම සඳහා ලෝකය පුරා පලස්තීන තානාපති කාර්යාලවල මහජන පෙත්සම් අත්සන් කිරීමේ වැඩපිළිවෙලක් සංවිධානය කරන ලදී. ජ.වි.පෙ.ද පලස්තීනයේ ස්වාධීනත්වය වෙනුවෙන් දීර්ඝ කාලයක සිට තම සහයෝගය දක්වමින් සිටින අතර ලෝකයේ කවර හෝ රටකට සිදුවන අධිරාජ්‍යවාදී බලපෑම්වලට එරෙහිවද එම රටවල් හා එක්ව පොදු ක්‍රියා මාර්ගවලට එක්ව සිටී.

පසුගිය මැයි මස 07 වෙනිදා ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරමින් එහි ජාතික සංවිධායක බිමල් රත්නායක සහෝදරයා මෙරට පිහිටි පලස්තීන තානාපති කාර්යාලයේදී එම පෙත්මසට අත්සන් තැබූ අතර ඊශ්‍රායලයේ මේ ක්‍රියාව සම්බන්ධයෙන් තම විරෝධතාවය ශ්‍රී ලංකාවේ පලස්තීන තානාපතිවරයා හමුවේද ප්‍රකාශ කර සිටියේය.

# පුළුල්වන ජාත්‍යන්තර සබඳතා



ජ.වි.පෙ. තම දේශපාලනය මෙරට තුළ පමණක් සිදුකරන ව්‍යාපාරයක් නොවේ. එය විදේශයන්හි තම ශාඛා මගින් එම රටවල ප්‍රගතිශීලී ව්‍යාපාර සමගද එයට අමතරව කම්කරු, තරුණ, ශිෂ්‍ය මෙන්ම වෙනත් ප්‍රගතිශීලී ලෝක සංවිධාන හා දේශපාලන පක්ෂ සමග ඍජුවමද ගනුදෙනු කරමින් සිටින ජාත්‍යන්තරවාදී දේශපාලන ව්‍යාපාරයකි. ලෝක වෘත්තීය සමිති සම්මේලනයේ මෙන්ම ලෝක ප්‍රජාතන්ත්‍රවාදී තරුණ සම්මේලනයේද නිලතල සඳහාද ජ.වි.පෙ. අනුබද්ධ සංවිධානවලට ඉඩ කඩ සැලසෙනුයේද මෙවන් පසුබිමක් තුළය.

මේ සම්බන්ධතාව තවදුරටත් තහවුරු කරමින් පසුගිය මැයි පළමුවෙනිදා පැවති ජාත්‍යන්තර කම්කරු දින සමරුවට රටවල් කිහිපයක නියෝජිතයින් එක් වූ අතර සමාජවාදී කියුබාවේ නියෝජිතයෙක්ද මේ හා එක්වීම විශේෂ කරුණක් විය. යාපනයේ මෙන්ම කොළඹදී පැවැත්වූ ජ.වි.පෙ. මැයි දින සැමරුම්වලට සහභාගී වීමෙන් අනතුරුව පසුගිය මැයි දෙවෙනිදා බත්තරමුල්ලේ පිහිටි ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේදී පක්ෂයේ සහ විදෙස් නියෝජිතයින් අතර සාකච්ඡා කිහිපයක් පැවැත්වුණි.

මෙම සාකච්ඡා සඳහා ජ.වි.පෙ. නියෝජනය කරමින් ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා, ප්‍රචාරක ලේකම් විජිත හේරත්, ජාතික සංවිධායක බිමල් රත්නායක, දේශපාලන මණ්ඩල සභික සුනිල් හඳුන්නෙත්ති සහ මධ්‍යම කාරක සභික රාමලිංගම් චන්ද්‍රසේකර් එක්වී සිටියහ. විදෙස් නියෝජිතයින් වන කියුබානු කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරක සභික අබෙලාර්ඩෝ රපායල් කුළුටෝ සොසා සහෝදරයා, ග්‍රීසියේ කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරක සභික යුරෝපා පාර්ලිමේන්තු මන්ත්‍රී කොන්ස්තන්තිනෝ පපාදකිස්, ඕල් ඉන්ඩියා ෆොවර්ඩ් බොලොක් පක්ෂයේ මධ්‍යම කාරක සභික සහ කේරල ප්‍රාන්ත කමිටුවේ ප්‍රධාන ලේකම් වී.රාම් මොහාන් , ඕල් ඉන්ඩියා ෆොවර්ඩ් බොලොක් පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ ලේකම් සහ අන්තර් ජාතික කටයුතු පිළිබඳ ලේකම් ජී.දේවරාජන්, මහා බ්‍රිතාන්‍යයේ මාක්ස් ලෙනින්වාදී කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරක සභික සාම්මි ඊබ්‍රහිම්, ග්‍රීසියේ රෙදිපිළි කම්කරුවන්ගේ සම්මේලනයේ වැසිලායෝස් සටැමුවෙල්ස්, ග්‍රීසියේ ඇතැන්ස් නුවර විදුලිසංදේශ සහ තාක්ෂණ වෘත්තීය සමිතියේ සභාපති ජොජියස් වැසිලැක්ස් යන සහෝදරවරු එම සාකච්ඡාවලට සහභාගී වූහ.



# සාමය, සහයෝගිතාව හා යුක්තිය උදෙසා

"සාමය, සහයෝගිතාව හා යුක්තිය උදෙසා අධිරාජ්‍යවාදයට එරෙහිව සටන් වදිමු - අතීතයට ගරුකරමින් අනාගතය ගොඩනගමු!" යන තේමාව යටතේ පසුගිය මැයි මස 25-27 යන දිනයන්හි 19වැනි තරුණ හා ශිෂ්‍ය උළෙලෙහි 3වැනි ජාත්‍යන්තර සූදානම් කිරීමේ කමිටුව කොළඹ ලක්ෂමන් කදිරගාමර් මධ්‍යස්ථානයේදී පැවැත්වුණි.

ලෝක තරුණ හා ශිෂ්‍ය උළෙල සංවිධානය කරනු ලබන්නේ ලෝක ප්‍රජාතන්ත්‍රවාදී තරුණ සම්මේලනයේ මූලිකත්වයෙනි. එම සම්මේලනය බිහිවීමට බලපෑ ප්‍රධානම කරුණ වූයේ දෙවන ලෝක මහා යුද්ධය නිසාවෙන් සිදුවූ මහා මිනිස් සංහාරයයි. එසේම ලෝක තරුණ හා ශිෂ්‍ය උළෙලේ අරමුණ වන්නේද එවෙනි මිනිස් සංහාරයක් නැවත ඇති නොවිය යුතුය යන්නයි.

1947 චෙකොස්ලොවැකියාවේ ප්‍රාග් අගනුවරදී 17,000ක පමණ තරුණ සහභාගිත්වයෙන් මෙම උළෙල ප්‍රථම වරට පැවැත්වුණු අතර මීළගට පැවැත්වීමට නියමිත 19වැනි ලෝක තරුණ හා ශිෂ්‍ය උළෙල පවත්වනු ලබන්නේ රුසියාවේ සෝචිහිදීය. මෙය ඉලක්ක කරගනිමින් මෙරට පැවැත්වෙන සූදානම් කිරීමේ කමිටුව සඳහා ලෝක ප්‍රජාතන්ත්‍රවාදී තරුණ සමුළුවේ සභාපති නිකොලස් පපාදිමෙත්‍රියෝ, ලේකම් ජොසේ එන්ජල් මච්රි සහ උප සභාපති පුබුදු සමරවීර ඇතුළුව රටවල් 47 ක 100කට අධික විදෙස් තරුණ සංවිධානවල නියෝජිතයෝ සහභාගි වූහ.

සමාජවාදී ශිෂ්‍ය සංගමය, සමාජවාදී තරුණ සංගමය ඇතුළුව තවත් සංවිධාන කිහිපයක් මෙරට නියෝජනය කරමින් ලෝක ප්‍රජාතන්ත්‍රවාදී තරුණ සම්මේලනයේ සාමාජිකත්වය දරන අතර ජ.වි.පෙ.ට අනුබද්ධ සමාජවාදී ශිෂ්‍ය සංගමය එහි උප සභාපති තනතුරක් දැරීම විශේෂ කරුණක් වේ. මෙහි සමාප්ති උළෙල මැයි 27වැනිදා කොළඹ විහාර මහ දේවී එළිමහන් රංගපීඨයේ පැවැත් වීමට කටයුතු යොදා තිබුණද රට තුළ මතුවූ අයහපත් කාලගුණ තත්වය හේතුවෙන් එය කොළඹ ජයවර්ධන කේන්ද්‍රයේදී පවත්වන ලදී.

මේ අවස්ථාව සඳහා ජ.වි.පෙ. නායක අනුර දිසානායක, බිමල් රත්නායක යන සහෝදරවරුද ඇතුළුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, අමාත්‍යවරු ඇතුළු පිරිසක් සහභාගි වී සිටියහ.

# සමාජවාදය තුළ නිදහස

සමාජවාදය තුළදී පුද්ගල නිදහස සහ ප්‍රජාතන්ත්‍රවාදය අහිමි වේය යන්න සමාජවාදයට එරෙහිව මතුකර ඇති තවත් එක් ප්‍රබල මතයකි. ඔවුනට අනුව සමාජවාදය තුළදී වැඩි අවධානය යොමු කරන්නේ, සමාජ ආර්ථික අයිතීන් පිළිබඳව පමණකි. එහෙත් දේශපාලන සහ පුද්ගල අයිතීන් හා නිදහස වඩා වැදගත් වේ. සමාජවාදය තුළදී දේශපාලන හා පුද්ගල අයිතීන්ද නිදහසද අහිමි වේයයි සමාජවාදයට එරෙහිව මත දක්වන්නෝ පවසති. වඩා වැදගත් සමාජ ආර්ථික අයිතීන්ද දේශපාලන අයිතීන්දැයි ඔවුන් ප්‍රශ්න කරති. ඔවුන්ට අනුව වඩා වැදගත් වන්නේ දේශපාලන නිදහසයි.



### වඩා වැදගත් කුමක්ද?

ධනවාදී දෘෂ්ටිවේදීන්ට අනුව වඩා වැදගත් දේශපාලන නිදහසයි. මේ නිසා ඔවුන්ට සමාජයේ සමාජ-ආර්ථික ප්‍රශ්න විසඳීම පසුපසට ඇද දැමිය හැකිය. ඔවුන්ට අනුව සමාජයක් හොඳ හෝ නරක ලෙස වර්ග කරනුයේ සමාජ ආර්ථික ප්‍රශ්න කොතරම් දුරකට විසඳී ඇත්ද දේශපාලන හා අනෙකුත් මානව අයිතීන් කොතරම් දුරට සුරැකී ඇද්ද යන කරනු දෙකම පොදුවේ සලකා බැලීමෙන් නොවේ. හුදෙක් දේශපාලන නිදහස පවතීද යන කරුණය මත පමණි. දේශපාලන පක්ෂ තිබේද, මැතිවරණ පැවැත්වේද ආදි වශයෙනි.

සමාජවාදයේදී සියලු අයිතීන් එක සේ වැදගත් ලෙස සැලකේ. වඩා වැදගත් සමාජ ආර්ථික අයිතීන්ද නැතහොත් දේශපාලන අයිතීන්ද යන ප්‍රශ්නයක් එහිදී පැන නොනගී. සමාජවාදය තුළදී බහුතර ජනතාවගේ සමාජ ආර්ථික අයිතීන්ද දේශපාලන අයිතීන්ද මානව නිදහස හා ගරුත්වයද ආරක්ෂා කිරීම සඳහා සමාජවාදී රජය මැදිහත් වේ.

සමාජවාදී රජය බහුතර ජනතාවගේ ජීවිතයේ ගුණාත්මකභාවය (Quality of life) පිළිබඳ විශේෂ සැලකිල්ල දක්වයි. ජනතාවගේ සමාජ ආර්ථික තත්වය වැඩි දියුණු විය යුතුවා සේම ඔවුන්ගේ දේශපාලන සහ සමාජ නිදහස ඇතුළු මානව අයිතීන්ද එකවිට ආරක්ෂා විය යුතුයයි විශ්වාස කරයි.

'සමාජවාදය ගොඩනගන්නේ එය ගොඩනැගීමට කැමති නිදහස් මිනිසුන් විසින්ය'යි වරෙක කියුබානු විප්ලවයේ නායක ෆිදෙල් කස්ත්‍රෝ සහෝදරයා පැවසීය. සමාජවාදය බලහත්කාරී සමාජ ක්‍රමයක් නොවේ. එය මෙතෙක් සැම සමාජ ක්‍රමයකදීම පැවතුණ ධනවාදය තුළදීද වඩාත් දරුණු ලෙස, සූක්ෂ්ම ලෙස සහ සැඟවී පවතින 'බලහත්කාරීත්වය' හෙවත් රාජ්‍ය බලය නැති කිරීම ඉලක්ක කර ගත් සමාජ ක්‍රමයකි. සමාජවාදය තුළදී සමාජ ආර්ථික දේශපාලන අයිතීන් ඇතුලු සියලු මානව අයිතීන් සහ නිදහස උපරිමයෙන් සහතික කෙරේ.

### මැතිවරණ පැවැත්වේද?

සමාජවාදය තුළදී තෝරා පත් කර ගැනීම්, සිදුවන්නේ නැතැයිද මැතිවරණ නොපැවැත්වෙන්නේ යයිද ප්‍රචාරය කර ඇති මතය බොරුවකි.

සමාජවාදී රටක ධනවාදී රටක මෙන්ම රජයත්, ආණ්ඩුවත් යන ආයතන දෙකම පවතී. ධනවාදයේදී මෙන්ම සමාජවාදයේදීද රාජ්‍ය නිලධාරීන් පත් කර ගනු ලබන්නේ සුදුසුකම් අනුවය. ආණ්ඩුව ගොඩ නැගෙන්නේ ජනතා ඡන්දයෙන් තේරී පත්වන නියෝජිතයන් ගෙනි. සෑම සමාජවාදී රටකම පාර්ලිමේන්තුවක් පවතී. ඊට නියෝජිතයින් තෝරා පත් කර ගනු ලබන්නේ මැතිවරණයකිනි. සෑම සමාජවාදී රටකම සර්ව ජන ඡන්ද බලය ක්‍රියාත්මකය.

සමාජවාදය තුළදී බහුතර ජනතාවගේ සමාජ ආර්ථික ප්‍රශ්න බොහොමයක් විසඳා ඇති හෙයින් මැතිවරණයේදී යමෙකුට රැකියාවක් ලබාදීම, මාරුවීමක් සාදා දීම, උසස් වීමක් ලබාදීම, දරුවා උසස් පාසලකට ඇතුලත් කර දීම ආදී දේ දඩමීමා කරගෙන ජනතාවගේ ඡන්දය කොල්ලකෑමට නොහැකිය. බාර් පර්මිට් ලබාදීම, කොන්ත්‍රාත් ලබාදීම, පානීය ජලය ලබාදීම, නිවසට විදුලිය ලබාදීම ආදී වශයෙන් ඡන්දය කොල්ලකෑමට නොහැකිය. ධනවාදයේදී මෙන් සමාජවාදයේදී ජනතාවගේ ජීවන ප්‍රශ්න උපයෝගී කරගනිමින් ඡන්දය කොල්ලකෑමට නොහැකිය. ඡන්දදායකයා අපේක්ෂකයා ඉදිරියේ අසරණ, බෙලහීන, අයෙකු නොවේ. ඔහුද අපේක්ෂකයා හා සම මට්ටමේ අයෙකු ලෙස ඡන්දය පාවිච්චි කරයි. මේ නිසා බලපෑම්වලින් තොරව සැබෑ ලෙසම ජනතාවට සේවය කළ හැකි ජනතා නියෝජිතයින් හෘදය සාක්ෂියට එකඟව තෝරා පත්කර ගැනීමට අවශ්‍ය නිදහස ජනතාවට ලැබෙන්නේ සමාජවාදය තුළදීය. සැබෑ ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන්නේ එතැනදීය.

ධනවාදය තුළදී මැතිවරණ යනු මුදල් විසිකරන යුද්ධයකි. මත්පැන්, මත්ද්‍රව්‍ය, බත්පැකට්, ඡන්ද මගඩි, කලකෝලාහල, ඊට ආවේණික ලක්ෂණයන්ය. මේ නිසා ධනවාදී රටක මැතිවරණයක් පැවැත්වෙද්දී පුවත්පත්, විද්‍යුත් මාධ්‍ය එවැනි ප්‍රවෘත්තිවලින් පිරීයයි. මැතිවරණයක් පැවැත්වෙන බව කවුරුත් දන ගනිති. සමාජවාදය තුළදී මැතිවරණ යනු සාමකාමී, ප්‍රජාතන්ත්‍රවාදී සහ වගකීම් සහගත ක්‍රියාවලියකි. ජනතාව ආර්ථික හා සමාජයීය ගැටලුවලින් මුදවා ඇති නිසා රැවටීම් හා බලපෑම් මගින් ඔවුන්ගේ ඡන්දය කොල්ලකෑමට ඉඩකඩ නැත. ධනවාදය තුළදී මෙන් ඔවුන් ඡන්දය ප්‍රකාශ කරන්නේ අසරණයින් ලෙස නොවේ. අපේක්ෂකයාගේ අහිංසක ගොදුරක් ලෙස නොවේ. හෘදය සාක්ෂිය අනුව කටයුතු කරන අභිමානවත් සහ නිදහස් පුරවැසියන් ලෙසය.

ධනවාදය තුළදී තමන් තෝරා පත්කර යැවූ මහජන නියෝජිතයෙකු නොගැලපේ නම්, නුසුදුසු නම්, ඔහු ඉවත් කරලීමට ජනතාව අවස්ථාවක් උදා වන්නේ ඊළඟ මැතිවරණයේදීය. එතෙක් ඔහුගේ සියලු වැරදි අඩුපාඩු ජනතාව විසින් ඉවසා සිටිය යුතුය. සමාජවාදයේදී එසේ නොවේ. තමන් පත්කර යැවූ ජනතා නියෝජිතයා නිසි ලෙස ජනතාවට සේවය නොකරන්නේ නම්, ඔහු ඒ සඳහා නුසුදුස්සෙකු නම්, වහාම ඔහු ආපසු කැඳවීමට සමාජවාදය තුළදී ජනතාවට බලය තිබේ. ඒ සඳහා යළිත් මැතිවරණයක් එනතුරු බලාසිටීමට අවශ්‍ය වන්නේ නැත.

> ධනවාදය තුළදී තමන්ගේ රට පාලනය කිරීමට දායකත්වය දැක්වීමට ජනතාවට ඇති අවස්ථාව මැතිවරණයේදී තමන්ගේ නියෝජිතයා තෝරා ගැනීමට ඡන්දය පාවිච්චි කිරීමෙන් අවසන් වේ. ඉන් පසුව රට පාලනය කිරීමට අවශ්‍ය අණ පනත් සාදන්නේ, බදු ප්‍රතිපත්ති සාදන්නේ, ආර්ථික වැඩපිළිවෙළවල් සාදන්නේ ජනතාව නොවේ. ඒ සඳහා ඔවුන් දායක කර නොගනී. එහෙත් සමාජවාදය තුළදී ප්‍රජාතන්ත්‍රවාදය එලෙස සීමා නොකෙරේ; කප්පාදු නොකෙරේ.

### සමාජ ක්‍රියාකාරීත්වයක් තිබේද?

සමාජවාදය තුළදී ජනතාවගේ සමාජ ක්‍රියාකාරීත්වය ධනවාදය තුළදී ඔවුන්ගේ සමාජ ක්‍රියාකාරීත්වයට වඩා පුළුල් වේ; අංගසම්පූර්ණ වේ. ධනවාදය තුළදී ජනතාව මුහුණපාන දෛනික ජීවන ගැටලු විසින් පුද්ගලයා සමාජ ක්‍රියාකාරීත්වයෙන් ඉවතට ඇද දමයි. සෑම දිනක්ම, සෑම පැයක්ම, වැඩි වැඩියෙන් ආදායම් ඉපැයීම් වෙනුවෙන් වෙන් කිරීමට ඔහුට බලකරයි. එවිට ඔහුට එක් මානව අයිතියක් වන සමාජ ක්‍රියාකාරීත්වයට අවශ්‍ය නිදහස නැතිවේ. ඥාතීන්, යහළු යෙහෙළියන්, වෘත්තීය සගයින් ඇසුරු කිරීමට උපන්දින සාද, ප්‍රිය සම්භාෂණ ආදියට සහභාගි වීමට, තම සමීපතමයන්ගේ ලෙඩදුක් බැලීමට, මරණයට, මඟුලට සහභාගී වීමට අවශ්‍ය කාලය, ධනය, හා විවේකය, අහිමි වේ. ධනවාදය තුළදී බහුතර ජනතාවගේ සමාජයීය ජීවිතය ඔවුන්ගේ ආර්ථික හා සමාජයීය ප්‍රශ්න විසින් උදුරා ගැනේ.

එහෙත් සමාජවාදය තුළදී බහුතර ජනතාවගේ ආර්ථික හා සමාජයීය ප්‍රශ්න විසඳීමට සමාජවාදී රජය මැදිහත් වන නිසා ජනතාවට නව සමාජ ජීවිතයක් විවර වේ. සමාජ ජීවිතයක් සඳහා නව අවස්ථා නිර්මාණය වේ. සමාජවාදී සමාජයක වෘත්තීය සමිති, තරුණ සමිති, කාන්තා සංවිධාන, සමුපකාර සමිති, බහුජන සමාජ ව්‍යාපාරයන්, වෘත්තීයවේදීන්ගේ සංවිධාන, ආගමික සංවිධාන, විද්‍යාඥයින්ගේ සංගම්, කලාකරුවන්ගේ සමිති සමාගම් ආදී ලෙස විවිධ සංවිධාන රාශියක් පවතී. ඕනෑම පුරවැසියෙකුට තමන්ට රිසි පරිදි මෙම සංවිධාන තුළ ක්‍රියාකාරී විය හැකිය. ඒ සඳහා අවශ්‍ය විවේකය, කාල වේලාව, සහ අවස්ථා සමාජවාදයේ දී අවශ්‍ය තරම් ලැබේ.

### රට පාලනය කරන්නේ කවුද?

ධනවාදය තුළදී තමන්ගේ රට පාලනය කිරීමට දායකත්වය දැක්වීමට ජනතාවට ඇති අවස්ථාව මැතිවරණයේදී තමන්ගේ නියෝජිතයා තෝරා ගැනීමට ඡන්දය පාවිච්චි කිරීමෙන් අවසන් වේ. ඉන් පසුව රට පාලනය කිරීමට අවශ්‍ය අණ පනත් සාදන්නේ, බදු ප්‍රතිපත්ති සාදන්නේ, ආර්ථික වැඩපිළිවෙළවල් සාදන්නේ ජනතාව නොවේ. ඒ සඳහා ඔවුන් දායක කර නොගනී. එහෙත් සමාජවාදය තුළදී ප්‍රජාතන්ත්‍රවාදය එලෙස සීමා නොකෙරේ; කප්පාදු නොකෙරේ.

සමාජවාදය තුළදී රටට වැදගත් සෑම අණ පනතක්ම, ආර්ථික වැඩපිළිවෙළක්ම කෙටුම්පත් කිරීමෙන් අනතුරුව ජනතා සංවාදයකට ලක්කෙරේ. උදාහරණයක් ලෙස සෑම පස් අවුරුදු සැලැස්මක්ම කෙටුම්පත් කිරීමෙන් අනතුරුව ජනතාව වෙත ඉදිරිපත් කරනු ලැබේ. එකී වැඩපිළිවෙළ වෘත්තීය සමිති තුළ, තරුණ සමිති, කාන්තා සමිති ආදී සෑම සමාජ සංවිධානයක් තුළම සාකච්ඡාවට බඳුන් කෙරේ. ඒවාට අදාළ යෝජනා, අදහස්, විවේචන ඉදිරිපත් කිරීමට ජනතාවට අවස්ථාව සැලසේ. පාර්ලිමේන්තුව තුළ සම්මත කරගනු ලබන්නේ එකී අදහස්, යෝජනා හා විවේචන සලකා බැලීමෙන් පසු සකස් කරන ලද අවසන් සැලැස්මයි. කියුබාව තුළ අවසන් වරට සම්මත කරගත් පස් අවුරුදු සැලැස්ම ජනතා අදහස් හා යෝජනා ද ඇතුළත් කිරීමෙන් පසු එහි මුල් කෙටුම්පතට වඩා 75%කින් පමණ වෙනස් කරන ලදී.

සමාජවාදය තුළදී ජනතාවට රට පාලනය කිරීමට දායක වීමට ඇති අවස්ථාව මහජන නියෝජිතයින් පත් කිරීම සඳහා ඡන්දය ලබාදීමෙන් අවසන් නොවේ. රට පාලනය කිරීමට දායකවීමට ජනතාවට ඇති නිදහස සීමා කරන්නේ ධනවාදය තුළයි. සමාජවාදය තුළදී නිදහස ඊට වඩා පුළුල්ය; අංගසම්පූර්ණය.



"එක් අතකින් ධනපතීන් අත සංකේන්ද්‍රණ ගතවූ නිෂ්පාදන මාධ්‍යයන් අතරත්, අනිත් අතින් ස්වකීය ශ්‍රම ශක්තිය හැරුණු විට, අන් කිසිවක් නැති නිෂ්පාදකයින් අතරත් අති විශාල බිඳීමක් ඇතිවිය. සමාජයීය නිෂ්පාදනය සහ ධනවාදී අයත්කැර ගැනීම අතර ප්‍රති විරෝධීතාවය නිර්ධන පංතිය සහ ධනපති පංතිය අතර ප්‍රතිඝතීතතාවය ලෙස ප්‍රකාශ විය."

**එංගල්ස්**
**සමාජවාදය මනෝරාජ්‍යයෙන් විද්‍යාව දක්වා...**
**37පිටුව**

# පරණ පාරේම යන 'නව' ප්‍රංශය




ප්‍රංශ ජනාධිපතිවරණයේ දෙවන වටය මැයි 07 වන දා අවසන් වූයේ, En Marche පක්ෂයේ අපේක්ෂක ඉම්මානුවෙල් මැක්රෝන්ට ජයග්‍රහණය ලබා දෙමිනි. දෙවන වටයේදී මැක්රෝන්ට 65.82%ක ඡන්ද ප්‍රතිශතයක් ලබාගැනීමට හැකි විය. ඔහුගේ ප්‍රතිවාදියා වූ මැරීන් පෙන්ට ලබාගත හැකි වූයේ 34.18%ක ඡන්ද ප්‍රතිශතයක් පමණි.

මෙවර ප්‍රංශ ජනාධිපතිවරණය විශේෂ ප්‍රවණතා ගණනාවක්ම පෙන්වූ මැතිවරණයක් විය. ප්‍රංශයේ ජනාධිපතිවරණය පැවැත්වූයේ 1958න් පසු උදාවූ බරපතළම සමාජ අර්බුදයක් තුළය. ප්‍රංශය එක් පැත්තකින් ආර්ථික අර්බුදයෙනුත්, අවස්ථා කිහිපයකදී සිදුවූ ත්‍රස්තවාදී ප්‍රහාරවලිනුත්, සංක්‍රමණික ගැටලුවෙනුත්, පීඩාවට පත්ව සිටින මොහොතකදීය. මෙම අර්බුදවලට මෙතෙක් පිළිතුරක් නොලැබී ඇති සහ ඉක්මන් පිළිතුරක් සොයමින් සිටින අවස්ථාවකදීය.

ජෙනරාල් චාර්ල්ස් ඩි ගෝල් 1958දී විධායක ජනාධිපති ධුරය සහිත නව ව්‍යවස්ථාවක් හඳුන්වාදීමෙන් පසුව (අදටත් ක්‍රියාත්මක වන්නේ එම ව්‍යවස්ථාවයි.) ගතවූ වසර 60ක කාලය තුළ ප්‍රංශයේ දේශපාලන බලය හෙබවූයේ ප්‍රධාන පක්ෂ දෙකෙන් එකකි. එක්කෝ රිපබ්ලිකන් පක්ෂයයි, නැතිනම් සමාජවාදී පක්ෂයයි. එහෙත් මෙවර ජනාධිපතිවරණයේදී නව දේශපාලන පක්ෂයක් වූ En Marcheහි ඉම්මානුවෙල් මැක්රෝන් ජනාධිපතිවරයා ලෙස තේරී පත් විය.

ප්‍රධාන පක්ෂ දෙක කෙතරම් පසුබෑමකට ලක්වීද යත් ඔවුන්ගෙන් කිසිවෙකු දෙවන වටයට තේරී පත්වූයේ නැත. අප්‍රේල් 23 වන දින පැවති පළමු වටයේ ඡන්දවලින් ඉදිරියෙන්ම සිටි අපේක්ෂකයන් හතර දෙනාගෙන් තුන් දෙනෙකුම නව දේශපාලන පක්ෂ නියෝජනය කරන අය වීම විශේෂයකි. එම පක්ෂ තුනටම ප්‍රංශ පාර්ලිමේන්තුවේ නියෝජනයක් නොමැත.

2012 වසරේ සිට බලයේ සිටි, ජනාධිපති ධුරය, අගමැති ධුරය, හා පාර්ලිමේන්තු බලය හිමිකර ගෙන සිටි සමාජවාදී පක්ෂය පළමු වටයේදී පස්වන ස්ථානයට පත් විය. එයට ලබාගත හැකි වූයේ 6.36% ක ඡන්ද ප්‍රතිශතයකි. එය අවුරුදු 60ක ඉතිහාසය තුළ සමාජවාදී පක්ෂය ලැබූ දරුණුම පරාජයයි.

Brexit ප්‍රතිඵලයත් එක්සත් ජනපද ජනාධිපතිවරණයෙන් ට්‍රම්ප් ජයග්‍රහණය කිරීමත් ප්‍රංශ දක්ෂිණාංශික ජාතිවාදී ජාතික පෙරමුණ ප්‍රාදේශිය මැතිවරණවලදී ලබා තිබූ ඡන්ද ජයග්‍රහණත් අනුව බොහෝ දෙනෙක් මෙවර ජනාධිපතිවරණයෙන් ජාතික පෙරමුණෙහි අපේක්ෂිකා මැරීන් ලා පෙන් තේරීපත් වෙතැයි අපේක්ෂා කළහ. එහෙත් දෙවන වටයේදී අනෙකුත් පක්ෂ සමග සන්ධාන ගත වීමට ඊට නොහැකි වීම හේතුවෙන් ඇය පරාජයට පත්විය.

මීට වසරකට පෙරදී ඉම්මානුවෙල් මැක්රෝන් ජාත්‍යන්තර වශයෙන් එතරම් ප්‍රකට චරිතයක් වූයේ නැත. ඔහු ප්‍රංශුවා හොලන්දේගේ සමාජවාදී පක්ෂ ආණ්ඩුවේ ආර්ථික, කර්මාන්ත හා ඩිජිටල් කටයුතු පිළිබඳ ඇමතිවරයා විය. පසුගිය වසරේ අගෝස්තුවේදී ඔහු ඇමති ධුරයෙන් හා සමාජවාදී පක්ෂයෙන් ඉවත් වී En Marche සංවිධානය පිහිටුවා ගත්තේය. ඔහුට අනුව එය දක්ෂිණාංශික නොවන වාමාංශිකද නොවන ව්‍යාපාරයකි.

මින් පෙර සිදුවූ ආකාරය අනුව නම්, මෙවර මැතිවරණයේදී වැඩි වාසි හිමි විය යුතුව තිබුණේ රිපබ්ලිකන් පක්ෂයේ අපේක්ෂක ප්‍රංශුවා ෆිලන්ටය. එහෙත් ඔහු වෙත එල්ලවූ දූෂණ චෝදනා හේතුවෙන් ඔහුගේ ජනප්‍රියත්වය පිරිහුණි. අනෙක් අතට මූල්‍ය බලවතුන්ගේත්, ව්‍යාපාරික බලවතුන්ගේත්, මාධ්‍ය ප්‍රධානීන්ගේත් සහය ලැබුණේ මැක්රොන්ටය.

අධිරාජ්‍යවාදයේ කේන්ද්‍රීය රටවල මතුවී ඇති ආර්ථික අර්බුදයත් එයින්ම ජනිත වූ සමාජ අර්බුදයත් විසින් සාම්ප්‍රදායික දේශපාලන පක්ෂ පසුපසට ඇද දමා නව දේශපාලන ව්‍යාපාරයන්ට ඉඩකඩ විවර කර දී ඇති ආකාරය ප්‍රංශ ජනාධිපතිවරණ ප්‍රතිඵලයෙන් පෙනී යයි. එහෙත් නව පෙනුමක් ගත්තද, මැක්රෝන් ගේ En Marche ව්‍යාපාරයද සාම්ප්‍රදායික වැඩපිළිවෙළ වෙනුවෙන්ම පෙනී සිටින්නකි. මැක්රෝන් යුරෝපා සංගම්වාදියෙකි. නව ලිබරල්වාදියෙකි. නිදහස් වෙළඳාම වෙනුවෙන් පෙනී සිටින්නෙකි. මේ නිසා මූල්‍ය ක්ෂේත්‍රයේත් ව්‍යාපාරික ක්ෂේත්‍රයේත් බලවතුන්ගේ සහය ඔහුට ලැබීම විමතිය දනවන්නක් නොවේ.

ප්‍රංශයේ නව ජනාධිපතිවරයාට තවත් අභියෝගයක් තිබේ. එනම් මීළඟ පාර්ලිමේන්තු මැතිවරණයෙන් ප්‍රංශ පාර්ලිමේන්තුවේ බලය තම පක්ෂයට ලබාගැනීමයි. මැතිවරණයේදී ඔහු ජනතාවට දුන් පොරොන්දු ඉටුකරලීමට නම්, ඒ තුළ ශක්තිමත් බලයක් ගොඩනගා ගැනීමද ඔහුට වැදගත් වනු නොඅනුමානය.

## බ්‍රිතාන්‍යය:
### 'මේ' ශක්තිමත් පාර්ලිමේන්තුවක් සොයයි



බ්‍රිතාන්‍ය අග්‍රාමාත්‍ය තෙරේසා මේ විසින් කැඳවූ හදිසි මැතිවරණය ජුනි 08වැනි දිනට යෙදී තිබේ. බ්‍රිතාන්‍යය යුරෝපා සංගමයෙන් ඉවත් වීම සඳහා කෙරෙන සාකච්ඡාවලදී ආණ්ඩුවට නිදහස්ව තීරණ ගැනීම සඳහා ප්‍රබල ජනවරමක් අවශ්‍ය බැවින් මෙසේ මැතිවරණයක් ප්‍රකාශයට පත් කළ බව ඇය පවසයි.

බ්‍රිතාන්‍යය යුරෝපා සංගමයෙන් ඉවත් වීම සඳහා වන පාර්ලිමේන්තු ක්‍රියාවලියට ස්කොට්ලන්ත ජාතිකවාදීන්ගෙන්, බාහිර දේශපාලන බලවේගයන්ගෙන් සහ තම පක්ෂය තුළින්ම බාධා එල්ල වෙනු ඇතැයි ඇය කල්පනා කරයි.

බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව තුළ තෙරේසා මේගේ කොන්සර්වේටිව් පක්ෂයට ආසන 14ක බහුතරයක් තිබේ. එසේ වුවද යුරෝපා සංගමයෙන් ඉවත් වීම පිළිබඳ ප්‍රශ්නයේදී ඇයගේ පක්ෂය තුළ පවා බෙදුන මතයක් පවතී. එබැවින් ඇයට යුරෝපා සංගමයෙන් ඉවත් වීම පිළිබඳව සාකච්ඡාවලදී තමන් සමග එක්ව සිටින ශක්තිමත් කණ්ඩායමක අවශ්‍යතාවයක් පවතින බව ඇය කියයි.

## පුවටෝ රිකෝ:
### දීර්ඝතම දේශපාලන සිරකරුට නිදහස




එක්සත් ජනපදයට අයත් එහෙත් ප්‍රාන්තයක්ද නොවන වෙනම රටක් වන පුවටෝ රිකෝව (Puerto Rico) අත්ලාන්තික් සාගරයේ පිහිටි දූපත් කිහිපයකින් සමන්විත රටකි. පුවටෝ රිකානු නිදහස් අරගලයේ නායකයා වූ ඔස්කා ලොපේස් රිවේරා මැයි 17වැනි දින නිදහස ලැබීය. ඔහු අවුරුදු 36ක කාලයක් එක්සත් ජනපදයේ සිරගත කරනු ලැබ සිටි සිටි අතර එය ලෝකයේ දේශපාලන සිරකරුවෙකු අත්අඩංගුවේ සිටි වැඩිම කාලය ලෙසද වාර්තා වේ.

ඔහුව අත්අඩංගුවට ගැනුණේ 1981 මැයි මස 29 වන දිනය. ඔහු පුවටෝ රිකෝ ජාතික විමුක්ති හමුදාවේ නායකයා විය. එවකට එය රහසිගත සංවිධානයකි. එක්සත් ජනපදය ඔහුට එල්ල කළ චෝදනාව වූයේ පුවටෝ රිකෝවේ පැවති එක්සත් ජනපද ආණ්ඩුව කුමන්ත්‍රණකාරි ලෙස පෙරළා දැමීමට තැත් කිරීමයි. ඒ අනුව ඔහුට අවුරුදු 55ක සිරදඬුවමක් නියම විය. ඉන් අවුරුදු 12ක්ම ඔහුව කිසිවෙකුට මුණ ගැසීමට ඉඩ නොදී හුදෙකලාව සිරගත කොට තැබිණි.

හිටපු එක්සත් ජනපද ජනාධිපති බැරක් ඔබාමා සිය ධුරයේ අවසන් වකවානුවේදී ඔහු නිදහස් කිරීමට තීරණය කළ අතර මෙම වසරේ පෙබරවාරියේදී ඔහු හිරෙන් නිදහස් කර නිවාස අඩස්සියේ තැබිණි.

ඔස්කා ලෝපේස්ගේ නිදහස වෙනුවෙන් කියුබාව, වෙනිසියුලාව හා නිකරගුවාව සිදුකළ අඛණ්ඩ අරගලයේ ප්‍රතිඵලයක් ලෙස ඔහුට මෙසේ නිදහස ලබා ගැනීමට හැකි විය.

## වෙනිසියුලාව:
### රට අස්ථාවර කිරීමට වැඩි 'කුලී' මුදලක්



වෙනිසියුලාව තුළ 'ප්‍රජාතන්ත්‍රවාදය' තහවුරු කිරීමට ඩොලර් මිලියන 5.5.ක් වෙන් කිරීමට එක්සත් ජනපදය තීරණය කර ඇති බව එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව එරට කොංග්‍රස් මණ්ඩලයට ඉදිරිපත් කළ 2017 වසරේ අයවැය වාර්තාවේ සඳහන් කර තිබේ. මෙම මුදල ලබා දෙනු ලබන්නේ වෙනිසියුලාවේ 'සිවිල් සමාජ' කණ්ඩායම්වලටය.

ඒ අනුව මෙම මුදල ලැබෙනු ඇත්තේ, වෙනිසුවෙලාවේ නිකොලොස් මදුරෝගේ පාලනය පෙරළා දැමීමට කටයුතු කරන එරට විපක්ෂය අතටයි. එක්සත් ජනපද හිතවාදී පක්ෂ කණ්ඩායම් මේ වන විට වෙනිසියුලාව තුළ භාණ්ඩ හිගයක් මවා පාමින්, ජනතාව උසි ගන්වමින් රට තුළ ප්‍රචණ්ඩකාරී වටපිටාවක් නිර්මාණය කර තිබේ. මෙම වසරේ අප්‍රේල්, මැයි මාසවලදී පමණක් පුද්ගලයන් 60කට වැඩි පිරිසක් ඝාතනය කර ඇති අතර ගැටුම්වලින් 1000කට ආසන්න පිරිසක් තුවාල ලබා තිබේ.

## එක්සත් ජනපදය:
### ට්‍රම්ප් සහනාධාර කප්පාදුවක



එක්සත් ජනපදයේ ට්‍රම්ප් පාලනය ඔවුන්ගේ ප්‍රථම අයවැය සැලැස්ම මැයි 23 වනදා ප්‍රකාශයට පත් කළේය. ඒ අනුව ඉදිරි දස වසර සඳහා ආණ්ඩුවේ වියදම ඩොලර් ට්‍රිලියන 3.6කින් කප්පාදු කිරීමට තීරණය කරනු ලැබ තිබේ.

මෙහිදී සෞඛ්‍ය රක්ෂණ වැඩසටහන්, ආහාර සලාක වැඩසටහන් සහ ආබාධිත සහන සඳහා වෙන් කර ඇති මුදල බරපතළ ලෙස කප්පාදු කර දමා තිබේ. ඒ පිළිබඳ අදහස් දැක්වූ ධවල මන්දිර නිලධාරියෙකු වූ මයික් මුල්වානි පවසා ඇත්තේ, මෙම අයවැය සැලැස්ම බදු ගෙවන්නන්ට ප්‍රමුඛතාව ලබාදෙන අයවැයක් මිස ආණ්ඩුවෙන් සහන බලාපොරොත්තුවන්නන්ට ප්‍රමුඛතාව ලබා දෙන අයවැයක් නොවන බවයි.

මෙම සැලැස්මට අනුව ඉදිරියේදී අඩු ආදායම්ලාභී සහ ආබාධිත ඇමරිකානුවන් සඳහා වන සෞඛ්‍ය රක්ෂණය සඳහා වෙන්කළ මුදලින් ඩොලර් බිලියන 800ක් කප්පාදු කිරීමට නියමිතය. මිලියන 44ක් වූ පුද්ගලයන් ප්‍රමාණයකට සහන සැලසෙන අතිරේක පෝෂණ ආධාර වැඩසටහනෙන් ඩොලර් බිලියන 193ක් කපා දැමීමට නියමිතය. ඒ අතර ආරක්ෂක නොවන වියදම්වලින් ඩොලර් බිලියන 54ක් කප්පාදු කර ආරක්ෂක වියදම් සඳහා ලබාදීමටද මෙමගින් සැලසුම් කර තිබේ.

# අවුරුදු දෙකක 'යහපාලන' ආර්ථිකයේ බිඳවැටීම

## 2016 මහ බැංකු වාර්තාවේ ඇසින්




වසර දෙකක රනිල් - මෛත්‍රී හවුල් පාලනයේ ප්‍රගතිය දැන් දෙපැත්තෙන්ම පෙනෙන්නට පටන්ගෙන ඇත. එක පැත්තකින් ඇමති හුවමාරුව මගින්ද, අනෙක් අතට ශ්‍රී ලංකා මහා බැංකුව ප්‍රකාශයට පත්කළ මහ බැංකුවේ 2016 වාර්ෂික වාර්තාව පැත්තෙන්ද, ආණ්ඩුවේ ආර්ථික කළමනාකරණයේ ප්‍රගතිය දැකිය හැකිය. 2015 ජනවාරි සිට සැලකුවහොත් පුරා වසර දෙකකුත් 2015 අගෝස්තු සිට සැලකීමේදී අවුරුදු 1 1/2කට වැඩි වශයෙනුත් රටේ පාලනය සහ ආර්ථිකය හසුරුවා ඇත්තේ, 'යහපාලනය' බෝඩ් ලැල්ලෙනි. වසර දෙකක් තුළදී රටේ ජනාධිපතිවරයාට මුදල් අමාත්‍යවරයා මාරු කිරීමට සිදුවිය. නිකම්ම මුදල් ඇමති නොව අග්නිදිග ආසියාවේ හොඳම මුදල් ඇමති මූල්‍ය පාලනයට නුසුදුසු ලෙස සලකා ඉවත් කර, විදේශ කටයුතු ඇමති 'මුදල්' කළේය.

### මුහුණු මාරු කිරීම සහ ආර්ථික නිර්ණායක

විදේශ ඇමති මුදල් ඇමති කිරීමෙන් (මංගල-රවී කිරීමෙන්) ආර්ථිකයේ කඩාවැටෙන නිර්ණායක වෙනස් වීමක් සිදුනොවේ. ආර්ථිකයක ගමන තීරණය කරන්නේ, ඇමති ඔළුගෙ ඩිවලින් නොව ආර්ථිකයේ පැවැත්ම රඳා පවතින ආර්ථික තීරණය මතය. ආර්ථිකයේ ආදායම ඉහළ නැංවීම, අපනයන වර්ධනය, වියදම පාලනය, (ආනයන වියදම අඩු කිරීම) උද්ධමනය පාලනය, පොලී අනුපාත සහ ණය පොලී අනුපාතය, රැකියා උත්පාදනයේ අවස්ථා, දේශීය ඉතිරි කිරීම වර්ධනයේ මට්ටම, ආයෝජන, විදේශ ආයෝජන සහ විදේශ කොටස් ප්‍රාග ්ධන වෙළඳපොළ වර්ධනය, රජයේ ණය හා වියදම කළමනාකරණය වැනි සාධක මත එම ආර්ථිකයේ ගමන්මඟ කවරාකාර වනු ඇතිදැයි නිශ්චය කෙරෙනු ඇත. මුදල් ඇමති රවීද, මංගලද යන්න එවැනි බරපතළ ආර්ථික නිර්ණායක සැලකීමේදී නොවැදගත්ය.

### යහපාලන ඉලක්ක අඳ?

රනිල් - මෛත්‍රී හවුල් පාලනය ආරම්භ කළ ආර්ථික ඉලක්ක සියල්ල සුළු ගණනින් නොව මිලියන බිලියනවලින් විය. මිලියනයක රැකියා බිහිකිරීම ඉන් ප්‍රබල ඉලක්කයකි. සමාජ වෙළඳපොළ ආර්ථික ක්‍රමයක් ගැන කතා ඇතිවිය. ඒ යටතේ අධිවේගී ආර්ථික වර්ධනයක් අපේක්ෂා කරන ලදී. ණය නැති ආර්ථිකයක්, කර්මාන්ත සඳහා විශාල දිරිදීමක්, යටිතල පහසුකම් ව්‍යාපෘති, ප්‍රාග්ධන වෙළඳපොළ යළි ප්‍රතිව්‍යුහගත කිරීම වැනි බොහෝ බරසාර ඉලක්ක ප්‍රතිපත්ති ප්‍රකාශනවල පැවැතිණි. නමුත් වසර දෙකක කෙළවර ප්‍රගතිය කුමක්ද? ඒ පිළිබඳව පැහැදිලි චිත්‍රයක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින්ම ඉදිරිපත් කරන ලද මහා බැංකු වාර්තා දෙකක තොරතුරු (ආර්ථික නිර්ණායක) සැසඳීමෙන් හොඳින් තේරුම් ගත හැකිය.

**සටහන 01** අනුව 2014 සහ 2016 වසර දෙකේ ප්‍රධාන ආර්ථික නිර්ණායක 30ක් සැලකීමේදී ආර්ථිකයේ පසුගිය වසර දෙකක් තුළ ධනාත්මක දර්ශකයක් දක්වා ඇත්තේ, රජයේ ආදායම වැඩිවීම පමණි. එම බලපෑම මගින් සමස්ත හිඟ යේ ප්‍රමාණය අඩුවීමක් ඇත. එයට හේතුව ජනතාවගේ පැත්තෙන් අහිතකරය. එනම් රජයේ ආදායම වැඩිවී ඇත්තේ අන් කිසිවක් නිසා නොව බදු පිට බදු පැනවීමෙන් ගතවූ වසර දෙක තුළදී බදු ආදායම ඉහළ යාමයි. (සටහන 01)

ආණ්ඩුවේ දෙවසරක පාලනයේ අසාර්ථකභාවය මහ බැංකු වාර්තාවේ ලිඛිත වාක්‍ය රටාවෙන්ද පිළිගෙන ඇත්තේ මෙලෙසය. ආර්ථිකය පිළිබඳව පොදු නිරීක්ෂණයන්හි ඔවුන් සඳහන් කර ඇත්තේ, " අපේක්ෂා කරනු ලබන පරිදි ශ්‍රී ලංකා ආර්ථික ඉහළ වර්ධන මාවතක් තුළ ස්ථාවර ලෙස රඳවා ගැනීමට තැබූ ආර්ථිකය තුළ දිගුකාලීනව පවතින ව්‍යුහාත්මක ගැටලු විසඳිය යුතු බව 2016 වසරේ ශ්‍රී ලංකා ආර්ථිකයේ ක්‍රියාකාරිත්වය තුළින් යළි අවධාරණය විය."

ආර්ථිකය අසාර්ථක යැයි නොකියා කියන ආණ්ඩුවේ වාක්‍ය රටාව එලෙස වුවද, කරුණු ලෙස පැහැදිලි කරන සියලු ආර්ථික දත්ත මඟින් ඔප්පු කරනුයේ, නොවෙනස් ආර්ථික ප්‍රතිපත්ති අසාර්ථක වී ඇති බවයි.

### අපනයන කඩා වැටීම සහ විනිමය අර්බුදය

2014 වසරේදී එක්සත් ජනපද ඩොලර් බිලියන 8.08ක්ව පැවති නිල විදේශ සංචිත 2016 වන විට ඩොලර් බිලියන 6.019 දක්වා බරපතළ කඩා වැටීමකට ලක්විය. එසේම, වෙළඳ ශේෂ පරතරය 2015 වසරේදී ඇමරිකන් ඩොලර් මිලියන 8388 (බිලියන 8.3) සිට 2016 වසරේදී ඇමරිකන් ඩොලර් බිලියන 9090 (බිලියන 9.0) දක්වා වැඩිවූ අතර, එය දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස 2015 වසරේදී පැවැති 10.4% සිට 11.2% දක්වා ඉහළ යාමකි.

මහබැංකු වාර්තාව (2016) දක්වන පරිදි, අඛණ්ඩව දෙවන වසරටත් ලංකාවේ අපනයන ආදායම බිඳ වැටීම මෙම තත්ත්වයට ඍජුව බලපා ඇත.

**"ලෝක අපනයනවලින් ශ්‍රී ලංකාවේ අපනයන ප්‍රතිශතය අඛණ්ඩව පහත වැටීම තුළින් පෙන්නුම් කෙරෙන ආර්ථිකයේ තරගකාරිත්වය අඩුවීම සහ මෙරට අපනයන වෙළඳපොළ තුළ පවතින දුර්වලතා හේතුවෙන් ශුද්ධ විදේශීය ඉල්ලුම නාමික වශයෙන් සියයට 9.6 කින් (මූර්ත වශයෙන් 22.5%කින් ) අඩුවිය."** (මහබැංකු වාර්තාව 2016 - 3 පිටුව)

**"කෘෂිකාර්මික සහ කාර්මික අපනයන ආදායම පහළ යෑම හේතුවෙන් 2016 වසරේදී අපනයන ආදායම අඛණ්ඩව දෙවන වසරටත් අඩුවිය"** (මහබැංකු වාර්තාව - 2016 - 9 පිටුව )

ආණ්ඩුව බදු පැනවීම මගින් ආණ්ඩුවේ ආදායම ජනතාව උපයන දේ උදුරා ගැනීමෙන් ලබා ගත්තද රටක් ලෙස, ආර්ථිකයක් ලෙස කඩා වැටීම අඛණ්ඩව සිදුවීම මෙයින් මනාව පැහැදිලි වේ.

### උද්ධමනය- බඩුමිල !

රටේ අපනයන ආදායම අඩුවන විට ආර්ථිකයට ලැබෙන ආදායම අඩුවන අතරම ජනතාවගේ ජීවන මට්ටමද බිඳ වැටීම අනිවාර්යයකි. නමුත් ආණ්ඩුවේ පැවැත්මට පනවන බදු නිසා අත්‍යාවශ්‍ය භාණ්ඩ මිල ඉහළ යාමෙන් උද්ධමනය වැඩිවීම නතර නොවීය. 2015දී පැවති 3.8%ක උද්ධමන අගය 2016 වනවිට 4% ක් දක්වා ඉහළ ගියේය. (එම අගය 2014දී 2.1%)

### ණය

ණය අර්බුදය හා ආණ්ඩුවේ දේශපාලන නායකයින් කවර විග්‍රහයක් ඉදිරිපත් කළද ආර්ථිකයේ ණය තත්වය පිළිබඳ යම් තරමක සැබෑ අදහසක් මහ බැංකු වාර්තාව මෙලෙස එළි දක්වා ඇත.

"මූලික වශයෙන් රජයේ විදේශීය ණය ප්‍රමාණය ඉහළ යාම හේතුවෙන් 2016 වසර තුළදී රටේ මුළු විදේශීය ණය ප්‍රමාණය ඉහළ ගියේය. නොපියවූ මුළු විදේශීය ණය ප්‍රමාණය 2015 වසර අවසානයේදී පැවති ඇමරිකනු ඩොලර් බිලියන 44.8 (දළ දේශීය නි. ප්‍රතිශතයක් ලෙස 55.7%ක) සිට 2016 වසර අවසාන වනවිට එක්සත් ජනපද ඩොලර් බිලියන 46.6ක් (ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස 57.3%) දක්වා ඉහළ ගියේය."

"2016 වසරේදී නොපියවූ විදේශීය ණය සඳහා සිදුකළ පොලී ගෙවීම, 2015 වසරේදී වාර්තා වූ එක්සත් ජනපද ඩොලර් මිලියන 1190 සිට එක්සත් ජනපද ඩොලර් බිලියන 1209ක් දක්වා ඉහළ ගියේය."

"2016 වසරේදී ස්ටර්ලින් පවුම හැර අනෙකුත් ප්‍රධාන මුදල් වර්ගවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය විය." (11 වන පිටුව - ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව 2016)

මේ සියලු කරුණු මගින් පැහැදිලි වන්නේ, දිගු කාලීනව කෙසේ වෙතත් අඩු තරමේ කෙටි කාලීනවවත් මෙම දුර්වල ධනපති පාලකයන්ට තවදුරටත් ආර්ථිකය ධනවාදයේ අවශ්‍යතා වෙනුවෙන්වත් කළමණාකරණයක් කළ නොහැකි බවය.

### සටහන 1

**ප්‍රධාන ආර්ථික දර්ශක 2014-2016 සැසඳීමක්**

| | 2014 | 2016 |
|---|---|---|
| 1. ඒක පුද්ගල ආදායම (ඇ.ඩො.) | 3821 | 3835 |
| 2. ආර්ථික වර්ධන වේගය (%) | 5.0 | 4.4 |
| 3. දළ ජාතික ආදායම (%) | 5.1 | 4.1 |
| 4. විරැකියා අනුපාතය | 4.3 | 4.4 |
| 5. දළ දේශීය ආයෝජන | 32.3 | 31.5 |
| 6. දළ දේශීය ඉතුරුම් | 29.9 | 28.9 |
| 7. පාරිභෝගික මිල දර්ශක වෙනස්වීම (%වෙනස) | 2.1 | 4.1 |
| 8. වෙළඳපොළ පරතරය (ඇ.ඩොලර් බිලියන) | -8.3 | -9.1 |
| 9. අපනයන ආදායම (ඩොලර් බිලියන) | 11.1 | 10.3 |
| 10 ආනයන වියදම (ඩොලර් බිලියන) | 19.4 | 19.4 |
| 11. දළ විදේශ සංචිත (ආනයන සඳහා මාස) | 5.1 | 3.7 |
| 12. ණය ගෙවීම් අනුපාතය (අපනයන %ලෙස | 20.8 | 25.0 |
| 13. රජයේ ණය (දළ දේශීය නිෂ්පාදනයේ % ලෙස) | 71.3 | 79.3 |
| 14. විදේශීය ණය (ද.දේ.නි. % ලෙස) | 30.0 | 34.2 |
| 15. විනිමය අනුපාත වෙනස්වීම (රුපියල හා ඩොලරය පරතරයේ %) | 131.05 | 149.80 |
| 16. රජයේ ආදායම (ද.දේ.නි.%) | 11.6 | 14.2 |
| 17. රජයේ වියදම (ද.දේ.නි %) | 17.3 | 19.7 |
| 18. සමස්ත හිඟය (ද.දේ.නි. %) | -5.7 | -5.4 |
| 19. හිඟය මූල්‍යමය (විදේශීය) ද.දේ.නි. % ලෙස | 2.1 | 3.3 |
| 20. පොලී අනුපාත % | 6.5 | 11.0 |
| 21. ණය දීමේ පොලී අනුපාතය | 6.2 | 11.5 |
| 22. සමස්ත කොටස් වෙළඳපොළ දර්ශකය | 7299 | 6228 |
| 23. කොටස් වෙළඳපොළ කොටස් අලෙවිය සමස්ත (රු. බිලියන) | 340.9 | 176.9 |
| 24. ජාතික නොවන ශුද්ධ මිලදී ගැනීම (රු. බිලියන) | 21.2 | 0.3 |
| 25. වෙළඳපොළ මූල්‍යකරණය (රු. බිලියන) | 3.1 | 2.7 |
| 26. කර්මාන්ත වර්ජන (මිනිස් දින අහිමිවීම) | 37,000 | 104,000 |
| 27. විදේශීය ආයෝජන ගලා ඒම (ඩොලර් මිලියන) | 1528 | 801 |



"ඔබ සාධාරණ නිසා ලෝකය ඔබට සාධාරණ වනු ඇතැයි සිතන්නේනම් ඔබ ඔබවම මෝඩයෙක් කර ගනී. එය හරියටම ඔබ සිංහයන් නොකන නිසා සිංහයන් ඔබව නොකනු ඇතැයි බලාපොරොත්තු වීම වැනිය."

**චානක්‍ය (කෞටිල්‍ය)**

# ස්වාභාවික ආපදා

## විපත් බවට පත් නොවීමට නම්...



අපට ස්වාභාවික ආපදා නැවැත්විය නොහැක. එහෙත් ඇති විය හැකි ස්වාභාවික ආපදා සම්බන්ධයෙන් ප්‍රමාණවත් තරමේ පෙර සූදානමකින් සිටින්නේ නම් ඒවා විපත් බවට පත්වීමට ඉඩ නොදී බොහෝ ජීවිත හානි වළක්වා ගැනීමට හැකි බව නැවතත් අපට පසක් කර දී ඇත. ඒ පසුගිය මැයි මාසයේ අග භාගයේ ඇතිවුණු ගංවතුර ආපදා තත්වයෙනි.

මැයි 29 දින ආපදා කළමණාකරණ මධ්‍යස්ථානයෙන් නිකුත් කළ නිවේදනයකට අනුව මිය ගිය සංඛ්‍යාව 169 දක්වා වැඩි වී ඇති බවත් අතුරුදන්ව ඇති පිරිස 102ක් හා තුවාල ලැබූ පිරිස 88ක් බවත් පැවසේ. මේ වනවිට ලක්ෂ පහකට ආසන්න පිරිසකට ගංවතුර හා නායයෑමේ බලපෑම් එල්ල වී ඇත. නිවාස 400කට අධික සංඛ්‍යාවක් මුළුමනින්ම විනාශ වී ඇති අතර නිවාස 4000කට වැඩි ප්‍රමාණයකට අර්ධ හානි සිදුවී ඇත.

ගංවතුර හා කඳු නායයෑම, කසල කඳු නායයෑම ආදී සිදුවීම් සලකා බැලූවිට මෙම සියලු ආපදා තත්වයන් තුළ දැඩි පීඩනයකට මුහුණ පා ඇත්තේ කාන්තාවන් හා ළමුන්ය. සෞඛ්‍ය, පෝෂණ ගැටලු මෙන්ම රැකවරණය සම්බන්ධ ගැටලුවලදීද මෙවැනි ආපදා තත්වයන් තුළ වැඩි පීඩනයකට ලක්වන්නේ කාන්තාවන් හා ළමුන්ය.

ආපදා තත්වයන් තුළ උන් හිටි තැන් අහිමි වූ ජන ජීවිත මුළුමනින්ම කඩා වැටීමට ලක් වන අතර එම ජනතාව නැවත නගා සිටුවීම සඳහා රටේ පාලකයන් ප්‍රමාණවත් අයුරින් මෙතෙක් මැදිහත් වී නොමැත. එය 2004 වසරේ පැමිණි සුනාමි තත්වයන් තුළද මැනවින් ඔප්පු විය. මෑතකදී වූ මීතොටමුල්ල කුණු කන්ද නායයෑමේ සිදුවීමට පෙර හා පසු බලධාරීන් ක්‍රියාකළ ආකාරයෙන්ද ජනතාවට මේ බව හොඳින් පෙනුණි. වගකිව යුතු බලධාරීන් පැන නැගුණු ගැටලුවලට කඩිනම් විසඳුම් ලබා දෙමින් ජනතාවට සහන ලබා දෙනවා වෙනුවට සිදු කළේ එකිනෙකාට ඇඟිලි දික්කර ගනිමින් තම වගකීමෙන් මිදී තම තමන්ට ලකුණු දමා ගැනීමේ ක්‍රියාවලියක නිරත වීමය. මීතොටමුල්ල කුණු කන්ද අසල අවදානම් තත්වයක් පවතින විටත් ඒ අසල නිවෙස්වල ජනතාව තවමත් ජීවත්වීම තුළ මෙය මැනවින් වටහා ගත හැක.

පැවතුණු හා පවතින ආණ්ඩු, සංවර්ධනය මුවාවෙන් සිදු කළ අමනෝඥ ක්‍රියාකාරකම් සේම ඇතැම් දේශපාලනඥයන් තම බලය අයුතු ලෙස යොදවමින් සිදු කරනු ලබන ගස් කැපීම්, ඉඩම් ගොඩ කිරීම්, පස් කැපීම් ආදී පරිසර විනාශයන් ඇතැම් විට ස්වාභාවික විපත්වල හානිය තිව්‍ර කිරීමට බලපා ඇත.

විවිධ පාරිසරික හා දේශගුණික වෙනස්කම් කල් ඇතුව හඳුනාගත හැකි තාක්ෂණික මෙවලම් ගෙන්වා ගැනීම පසෙකලා ඇති බලධාරීන් වඩා වැඩි ජවයකින් ක්‍රියාත්මක වන්නේ දේශපාලකයන්ගේ සුඛෝපභෝගී ජීවිත තව තවත් ඉහළ නංවා ගන්නේ කෙසේද යන්න ගැනය. කාලගුණික වෙනස්වීම් කල් ඇතිව හඳුනාගෙන ජනතාවට කල් ඇතිව දැනුම් දිය හැකි එවැනි දියුණු තාක්ෂණික උපකරණ තවමත් අපට නොමැත. එවැනි උපකරණ ගෙන්වා ගැනීමට මුදල් වෙන් කිරීම මතකයේවත් නොමැති ධනපති දේශපාලකයන්ගේ ඔළු ක්‍රියා කරන්නේ මැති ඇමතිවරුන්ට සැප වාහන ගෙන්වා ගැනීමට මුදල් වෙන් කරගන්නේ කෙසේද යන්න පිළිබඳවය.

පරිසරය ආරක්ෂා කිරීම, අපද්‍රව්‍ය කළමණාකරණය, ස්වාභාවික ආපදාවන් පමණක් නොව ආර්ථික, සමාජීය, දේශපාලන, සංස්කෘතික ආදී සියලු ක්ෂේත්‍රයන් තුළ මෙම ධනපති දේශපාලකයන් වසර 69ක කාලයක් තුළ දක්වා ඇත්තේ අසමත්කමය. කාන්තාවන් ලෙස අප මෙවැනි දේශපාලකයන් පත්කර යැවීම සම්බන්ධයෙන් ලැජ්ජා විය යුතුය. ලැජ්ජා වීම පමණක් ප්‍රමාණවත් නොවනු ඇත. ඔවුන්ගේ නොහැකියාව දිගු ඉතිහාසය තුළින් වටහා ගත යුතුය. අපේ ඔළු තුළ පුරවාගෙන ඇති ප්‍රතිගාමී සම්ප්‍රදායික බැමි පුපුරුවා හැර යහපත් රටක්, යහපත් සමාජයක් අපේ දරු පරපුරට උරුම කර දීමේ සැබෑ වගකීම අප උර මතට ගත යුතුය.

අප මත ඇති විශාලතම විපත විටින් විට සිදුවන ගංවතුර, නාය යෑම්, නියඟය වැනි ඒවා නොව වසර 70කට ආසන්න මේ තට්ටු මාරු දේශපාලනයය. එම විපතින් මිදීමට අප සූදානම් නම් ස්වාභාවික ආපදාවලින් මිදීම පහසුවනු ඇත.

## ඉටු කරමු යුතුකම වැස්සට නොහැකි වුණ...

යළිත් මහ වැසි වසින
කැළණි කළු ගිං ගලන
කඳු වැටි කඩා හැලෙන
මිහි මව හඬා වැටෙන

බැතිමතුන් වැනසී
සුර රද සමන් කොහි වී
සුදු ඇතු අරා වැජඹී
හිඳියි සුරඹුන් සමඟ තනි වී

සාදු ජන දැහැමී
සැඩ දියෙන් දිවි අහිමී
අහක බැලූ මෙහිමී
උපුල්වන් දෙවිදුනේ නොහොබී

බෝ සමිඳ කළුතර
දැහැමෙන් වෙසෙන ගංතෙර
පිං කැට කරන තර අතර
නොපෙනේද පිංවතුනගේ ගින්දර

ගම් බිම් විසුණු කර
උන් හිටි තැන් අහිමි කර
ගැලූ ගං දිය මත
ලේ උරන ඊරි යක් කැළ
මිනී කඳු මත නැඟ
දකියි සැප රිය සිහින සොඳ

නිරිත දිග සුළඟ
දනියි නම් මේ අවනඩුව
බොල් දෙවොල් සුනු කර
පතිත කරවනු ඇත
නීල වන් ගිරි හිස්
රට කන උන්ගෙ හිස් මත

සොබා දම මිතුරු කර
නොබා මිතු දම් රැක
තබා මේ'සමයට තිත
ඉටු කරමු යුතුකම
වැස්සට නොහැකි වුණ



"වර්ගවාදයෙන් තොර ධනවාදයක් නැත."

මැල්කම් එක්ස්




## කාන්තා හිංසනයට එරෙහිව පිරිමි වීදි බසිති!

මැයි 21 දින දකුණු අප්‍රිකාවේ ප්‍රිටෝරියා අගනුවරට සිය ගණනින් එක් රැස් වූ ජනතාව විරෝධතාවයක යෙදුණි. මරා දැමීම්, ලිංගික අතවරයන් ඇතුළුව කාන්තාවන්ට හා ළමුන්ට සිදුවන හිංසනයන්ට එරෙහිව මෙම විරෝධතාවය පැවැත්විණි.

එම විරෝධතාවයට සහභාගි වූ අය අතරින් වැඩිදෙනා පිරිමින් වූ අතර ''අපේ ලැජ්ජාසහගත ක්‍රියාවන්ට එක්ව ප්‍රතිචාර දැක්විය යුතු කාලයයි මේ.'' එම විරෝධතාවයේ සංවිධායකවරයෙක් එසේ ප්‍රකාශ කළේය.

ලෝකයේ දරුණුම අපරාධ සිදුවන රටවල් අතර දකුණු අප්‍රිකාව ඉදිරියෙන් සිටින අතර කාන්තාවන් හා ගැහැණු ළමුන් දූෂණය කිරීම්, මරා දැමීම් එදිනෙදා ප්‍රවෘත්ති අතර ප්‍රධාන සිරස්තල බවට පත්ව ඇත.

නිල සංඛ්‍යාලේඛණවලට අනුව දකුණු අප්‍රිකාවේ තමා දන්නා හඳුනන අයෙකු විසින් සෑම පැය 8කට වරක් එක් කාන්තාවක් මරා දමනු ලබන බවත් කාන්තාවන් පස් දෙනෙකුගෙන් එක් අයෙක් අඩුම තරමින් ඇගේ ජීවිත කාලය තුළ හිංසාකාරී ක්‍රියාවකට භාජනය වී ඇති බවත් වාර්තා වේ.

## සිව්දෙසින්

## මැයි දින දැක්වූ විරෝධතා...




මෙවර ජාත්‍යන්තර කම්කරු දින සැමරුම් වෙනුවට ඇතැම් රටවල විරෝධතාවන් දක්නට ලැබිණි.

පකිස්ථානයේ තුන්වන වරටත් ජාත්‍යන්තර කම්කරු දිනය සැමරීම තහනම් කෙරුණු අතර එම තහනමට එරෙහිව විරෝධතාවල යෙදුණු පිරිසක් එරට පොලීසිය විසින් අත්අඩංගුවට ගනු ලැබීය.

එක්සත් ජනපදයේ නිව්යෝක් හා ලොස් ඇන්ජලීස් නගරවල දහස් ගණන් ජනතාව සංක්‍රමණික අයිතිවාසිකම් වෙනුවෙන් එක්රැස් වනු පෙනෙන්නට තිබිණි.

ඉන්දුනීසියාවේ අගනුවර ජනාධිපති මන්දිරය ඉදිරිපිටට කම්කරුවෝ 40 000ක් පමණ රැස්ව ආණ්ඩුවේ කම්කරු ප්‍රතිපත්තිවලට විරෝධය දැක්විය. අඩු වැටුප්, ප්‍රමාණවත් නොවන සෞඛ්‍යාරක්ෂණ, අනාරක්ෂිත රැකියා ගිවිසුම් වැනි කාරණාවලට විරෝධය දැක්වූ ඔවුහු 'කම්කරුවන් දිගුකල් දිනේවා' යනුවෙන් හඬ නැගූහ.

දකුණු කොරියාවේ සියොල් නගරයට රැස් වූ කම්කරුවෝ යහපත් කම්කරු කොන්දේසි ඇති කරන්නැයි ඉල්ලා සිටියහ.

ස්පාඤ්ඤයේ කම්කරුවෝ ස්ථිර රැකියා, සාධාරණ වැටුපක්, ප්‍රමාණවත් විශ්‍රාම වැටුපක්, සමාජ ආරක්ෂණ සහ කම්කරු නීති ප්‍රතිසංස්කරණය නතර කරන්නැයි ඉල්ලා විරෝධතාවල යෙදුණහ.

දැනුම, සමාජය හා චින්තනය 17

# චින්තනය නිදහස් වීමට නම්...

කිසියම් නිශ්චිත සමාජයක, එම සමාජයේ ජීවත්වන පුද්ගලයන් තුළ චින්තනය ගොඩනැගීමේදී අතීත සම්ප්‍රදායන් හා අත්දැකීම්, තමා ජීවත්වන වටපිටාවේ බලපෑම හා අප ලබන අධ්‍යාපනය හේතුකාරක වන බව පැහැදිලිය. වර්තමාන සමාජයේ මිනිසුන් 'නිදහස' නැමති සංකල්පයට ඉතාම කැමතිය. මිනිස්සු නිදහස වෙනුවෙන් සටන් කොට දිවි පිදීමට පවා ඉදිරිපත් වෙති. භෞතිකව යටත් පුද්ගලයෙක් ලෙස, යටත් රටක් ලෙස ජීවත්වීමට කිසිවෙකු කැමති නැත. සිරගත වීමට මිනිසුන් අකමැති වන අතර සිරගෙවල්වලින් පලා යාමට පවා පෙළඹෙන්නේ මිනිසාට නිදහස අත්‍යාවශ්‍ය නිසාය. රටවල් අතර යුද්ධ ඇතිවීමට පවා නිදහස පිළිබඳ අවශ්‍යතාවය හේතු වේ. එහෙත් කෙනෙකුට භෞතිකව නිදහස අහිමිවීම දැනෙන ආකාරයෙන් චින්තනයේ නිදහස අහිමිවීම දැනෙන්නේ නැත. විදේශ බලවේගයක් අපේ රට යටත්කරගත් විට දැනෙන හැඟීම වෙනත් බලවේගයක් අපේ චින්තනය යටත්කරගෙන සිටින විට දැනෙන්නේ නැත. මෙය බරපතළ ගැටලුවක් වී තිබේ.





"වැරදීම්, ඒවා සිදුවන මොහොතේ වේදනාකාරීය. නමුත් වසර ගණනාවකට පසු එම වැරදීම්වල එකතුව අත්දැකීම් ලෙස හඳුන්වනු ලබන අතර ඒවා අපට සාර්ථකත්වය සඳහා මඟ පෙන්වයි."

**අබ්දුල් කලාම්**

### යටත් කළ චින්තනයක්

අප ජීවත්වන්නේ පංති සමාජයක් තුළය. දේපළ හිමි පංතිය එහි දේපළවල ආධිපත්‍යය දරයි. ඒ නිසාම එම පංතිය මතවාදය තුළද ආධිපත්‍යය දරයි. ඒ අනුව එම පංතිය අපගේ චින්තනය තුළද ආධිපත්‍යය දරන අතර අපේ චින්තනයේ නිදහස අපට අහිමිකරනු ලැබ තිබේ. මේ සඳහා ඉතාම සූක්ෂම ලෙස ධනවාදය තුළ අධ්‍යාපනය, ආගමික මතවාද, සදාචාරයන්, සම්ප්‍රදායන් යොදා ගැනේ. එවිට මිනිසා කැලයේ සිටින සතෙකු ලෙස නොව සත්ව උද්‍යානයක කූඩුවක සිටින සතෙකුගේ තත්වයට පත්වේ. සත්ව උද්‍යානයක කූඩුවක සිටින සතෙකුට කැලයේ 'නිදහසේ' සැරිසරන සතෙකුට නැති 'පහසුකම්' හා 'වරප්‍රසාද' තිබේ. ඒවා නම් තම කෑමවේල සඳහා වෙහෙස විය යුතු නැති අතර එය තමන්ට ලැබේ. ඒ අනුව කෑමවේල සහතික වී ඇත. වෙනත් සතුන්ගෙන් උවදුරු සිදුවන්නේද නැත. අව්වට වැස්සට ආවරණයක් තිබේ. අසනීප වූ විට ප්‍රතිකාරද ලැබේ. සත්ව උද්‍යාන පාලකයින් සතුන්ව රැකබලා ගනු ලැබේ. ඒ කිසිවක් කැලයේ සිටින සතෙකුට නැත. එහෙත් ඒ සියල්ල ලැබෙද්දී එක් දෙයක් ඌට අහිමිවී තිබේ. ඒ වනාන්තරයේ ගතකරන 'නිදහස්' ජීවිතයයි.

අපගේ චින්තනයට ධනවාදය තුළ සිදුකර ඇත්තේද එයයි. මිනිසාගේ චින්තය සඳහා 'හැම පහසුකමක්ම' සලසා ඇති ධනවාදය ඔහු ධනවාදයට අවශ්‍ය කොටුවක සිරකොට එම කොටුවේ සිට එහි සීමාවක් තුළ සිට සිතන කෙනෙක් බවට පත් කරයි. එවිට ධනවාදය තුළ චින්තනය 'සිරගත කළ' එකක් වේ.

### චින්තනය හා ජනමාධ්‍ය

නිදහස් චින්තනය අහෝසි කිරීමේදී ධනවාදය තුළ ජනමාධ්‍ය විසින් ඉටුකරන කාර්යය ඉතා විශාලය. ධනවාදී අධ්‍යාපනය විසින්, සිරිත් විරිත් හා මතවාද විසින් සකස්කළ මිනිස් චින්තනය යාවත්කාලීන කරමින් පවත්වාගෙන යනු ලබන්නේ ජනමාධ්‍ය විසිනි. වත්මන් ලෝකයේ මිනිසාට නැතුවම බැරි දෙයක් ලෙස ජනමාධ්‍ය ඔවුන්ගේ ජීවිතයට සම්බන්ධ වී තිබේ.

මිනිසා ස්වභාවයෙන්ම තොරතුරු දැන ගැනීමට කැමතිය. තොරතුරු සන්නිවේදනය කර ගැනීම මානව අවශ්‍යතාවයක්ව තිබේ. මිනිසාගේ තොරතුරු දැන ගැනීමේ පිපාසය දැන් සංසිදුවන්නේ ජනමාධ්‍ය විසිනි. මහා ජනමාධ්‍යවල අයිතිකරුවෝ එක්කෝ ධනේශ්වර දේශපාලකයෝය. නැතිනම් දේශපාලන සබඳතා ඇති ප්‍රාග්ධන හිමියෝය. ප්‍රාග්ධන හිමියාගේ අරමුණ ලාභ ලැබීමය. ඒ අනුව තොරතුරු සන්නිවේදනය ලාභ උපයන කර්මාන්තයක් බවටත් දේශපාලන අරමුණු සඳහා ජන මනස සකස් කරන මෙවලමක් බවටත් පත්ව තිබේ. ඒ අනුව ධනවාදය තුළ තොරතුරු වෙළඳාමක් බවට පත්ව තිබේ. තම තොරතුරු සඳහා වැඩිම පාරිභෝගිකයන් ප්‍රමාණයක් ඇතිකර ගැනීම අවශ්‍ය නිසා ජනමාධ්‍ය ආයතන සිය ශ්‍රාවකයන් හෙවත් පාරිභෝගිකයන් ප්‍රමාණය

> අපගේ චින්තනයට ධනවාදය තුළ සිදුකර ඇත්තේද එයයි. මිනිසාගේ චින්තය සඳහා 'හැම පහසුකමක්ම' සලසා ඇති ධනවාදය ඔහු ධනවාදයට අවශ්‍ය කොටුවක සිරකොට එම කොටුවේ සිට එහි සීමාවක් තුළ සිට සිතන කෙනෙක් බවට පත් කරයි. එවිට ධනවාදය තුළ චින්තනය 'සිරගත කළ' එකක් වේ.

වැඩිකර ගැනීම උනුන් හා තරඟයකද නියැලේ. අසන්නන්ට නරඹන්නන්ට සල්ලි හා තෑගි දෙමින් මහා ප්‍රචාරක වැඩසටහන් කරන්නේ ඒ නිසාය. එහි රහස නම් වැඩිම කියවන අසන නරඹන ප්‍රමාණයක් ඇති මාධ්‍ය ආයතනවලට වැඩිපුර වෙළඳ දැන්වීම් ලැබීමය.

### වාර්තාකරණයේ සීමාව ඉක්මවීම

මෙලෙස විවිධ උපක්‍රම හරහා මිනිසුන් තම ග්‍රහණයට ගෙන තම ජනමාධ්‍යවල 'වහලුන්' බවට පත්කර ගන්නා ජනමාධ්‍ය මිනිසුන් වෙත තම මුද්‍රිත හෝ විද්‍යුත් ජනමාධ්‍ය හරහා තොරතුරු සන්නිවේදනය කිරීම හා සමාජ විග්‍රහයන් ඉදිරිපත් කිරීම සිදුකෙරේ. එහිදී ඔවුන්, තමන් තොරතුරු වාර්තා කරන අපක්ෂපාතී ආයතනයක් බවට ප්‍රකාශ කළද සත්‍ය ලෙසම අපක්ෂපාතීව හා නිදහස්ව තොතුරු වාර්තා කරන්නේ නැත. ඒ වෙනුවට ඔවුහු තම දේශපාලන හෝ ආර්ථික අරමුණු මත පිහිටා ඊට ගැලපෙන ලෙස තෝරාගත් තොතුරු තමන් සිටින ආස්ථානයට අනුව ඊට ගැලපෙන ලෙස අර්ථකථනය කරමින් ඉදිරිපත් කරති. එමගින් මිනිසුන්ගේ චින්තනය තමන්ට අවශ්‍ය ලෙස හැසිරවීමේ යතුර තමන් අතට ගනිති. මිනිස් චින්තනය ස්වාධීන නොවන්නේ නිදහස් නොවන්නේ මේ තත්වය තුළය. මෙහිදී ජනමාධ්‍ය විසින් අසත්‍ය තොරතුරු, අර්ධ සත්‍ය තොරතුරු වාර්තා කිරීමට අමතරව තමන් වාර්තා කරන තොරතුරු තමන්ට අවශ්‍ය ලෙස විග්‍රහයකට ලක්කොට එම 'සදා නිමකළ' අදහස ජනතාව තුළට ඇතුල් කරනු ලැබේ. මෙහිදී ජනමාධ්‍ය ඇසුරු කරන ජනතාවට සිදුව තිබෙන්නේ කුමක්ද? ජනමාධ්‍ය ආයතන කැමති, ඔවුන්ට අවශ්‍ය ප්‍රමාණයට හා අවශ්‍ය ආකාරයට ලබාදෙන තොරතුරුවලින් සෑහීමකට පත් වීමටය. මෙයට ලංකාවේ හොඳම උදාහරණය විද්‍යුත් මාධ්‍ය මගින් උදෑසන පුවත්පත් වාර්තා කියවීම ගත හැක. යම් පුද්ගලයෙක් පුවත්පතක් බලන්නේ නම් ඔහු එහි ඇති සියලු ප්‍රවෘත්ති, පින්තූර ලිපි ආදිය දෙස බලා තමන් කියවන්නේ කුමන ප්‍රවෘත්තියද අවධානය යොමු කරන්නේ කුමකටද යන්න තමාම තීරණය කර ගනී. එහෙත් විද්‍යුත් මාධ්‍යවල පුවත්පත් කියවද්දී එය එසේ නොවේ. එහිදී අපට දැන ගැනීමට සිදුවන්නේ අදාල රූපවාහිනී හෝ ගුවන්විදුලි නාලිකාවේ හිමිකරුවන් විසින් ඔවුනට අවශ්‍ය ලෙස තෝරාගත් ප්‍රවෘත්ති පමණි. ඒ අතර එම ප්‍රවෘත්තියට විවිධ විග්‍රහ එකතු කිරීමටද නිවේදකයා කටයුතු කරයි. මේ අනුව අනුන්ගේ අවශ්‍යතාවයට ඉදිරිපත් කෙරෙන ප්‍රවෘත්තිවලින් සෑහීමකට පත්වීමට ජනතාවට සිදුවන අතර එය පුද්ගල චින්තනය පටු කිරීමටද හේතු වේ.

මේ පිළිබඳව වරක් ෆිදෙල් කැස්ත්‍රෝ සහෝදරයා මෙසේ පැවසීය. **"මාධ්‍ය මගින් කරන්නේ බොරු කියන එක පමණක් නොවේ. සාවද්‍ය පරාවර්තනයක් ඇතිකිරීමයි. බොරුව හා සාවද්‍ය පරාවර්තනය යනු වර්ග දෙකකි. බොරුව දැනුම මත ඍණාත්මක බලපෑමක් ඇති කරයි. සාවද්‍ය පරාවර්තනයක් චින්තනය මත ඍණාත්මක බලපෑමක් ඇති කරයි. එය තොරතුරු වසන් කිරීමට හෝ විකෘති කිරීමට සමාන නැත. එමගින් සිදුවන්නේ සිතීමට ඇති හැකියාව මොට කිරීමය."**

මේ නිසා නිදහස් චින්තනයක් ඇතිකර ගැනිමට නම්, ධනවාදය තුළ පවත්නා මෙම තත්වය වටහාගෙන ධනවාදී මතවාදයෙන් මෙන්ම ධනවාදී මත හදන මෙවලම්වලින්ද චින්තනය නිදහස් කර ගත යුතු වේ. මිනිස් චින්තනය ධනේශ්වර හිර කූඩුවලින් නිදහස් කර ගැනීම ඉතාම වැදගත් වන තර ඒ සඳහා අලුත් සිතීමක් අවශ්‍ය වේ. ඒ සඳහා තාර්කික බුද්ධියක් නිවැරදි දාර්ශනික මඟපෙන්වීමකුත් අවශ්‍ය වන අතර ලෝකය වෙනස් කළ හැකි වන්නේ එලෙස තාර්කිකව සිතන තම චින්තනය ධනේශ්වර 'සිරකූටි'වලින් නිදහස් කරගත් අයට පමණි.

# පාලකයින්ට උක් පැණි රස වුණාට ජනතාවට තිත්තයි

## ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යමකාරක සභික සමන්ත විද්‍යාරත්න සහෝදරයා

*පසුගිය 08වැනිදා ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලද මාධ්‍ය හමුවකදී ජ.වි.පෙ. මධ්‍යමකාරක සභික සමන්ත විද්‍යාරත්න සහෝදරයා උක් වගාව නාමයෙන් ඌවේ සිදුකිරීමට යන ඉඩම් කොල්ලය පිළිබඳ තොරතුරු රටට අනාවරණය කළේය. එම මාධ්‍ය හමුවේ පළවූ ඔහුගේ අදහස් කාලීන වැදගත්කම සලකා මෙසේ පළ කරමු.*

පහුගිය ආණ්ඩුව 2006 ගේන්න හදලා අසාර්ථක වුණු ව්‍යාපෘතියක් වර්තමාන ආණ්ඩුව ඌව වෙල්ලස්සේ බින්තැන්නට ගේන්න හදනවා. මේ වනවිට උක් වගාකරන ව්‍යාපෘතියක් ආරම්භ කරන්න කැබිනට් අනුමැතිය අරගෙන කර්මාන්ත ශාලාවට මුල්ගල තියන්න යොදාගෙන තිබෙනවා. 2006 දෙසැම්බර් මාසයේ මිල්රෝයි ප්‍රනාන්දු ඇමතිවරයා කැබිනට් අනුමැතියක් අරගෙන ඌව වෙල්ලස්ස ඉඩම් අක්කර 65,000ක් බ්‍රිතාන්‍යයේ බූකර් ටේට් සමාගමට දෙන්න ගියා. මොනරාගල පැල්වත්ත සීනි කර්මාන්ත ශාලා ආරම්භ කළෙත් මේ සමාගමයි. 2006 මෙම ඉඩම් ලබාදීමට එරෙහිව ජනතා විරෝධයක් පැන නැගුණා. 2006-2007 වකවානුවේදී බිබිල, මැදගම, මඩුල්ල, බඩල්කුඹුර, රිදීමාලියද්ද, මීගහකිවුල, ලුණුගල, කන්දකැටිය, පදියතලාව, මහඔය යන ප්‍රදේශවලින් ඉඩම් අක්කර 65,000ක් දෙන්න ආණ්ඩුව කටයුතු කර තිබුණා. එයට විශාල විරෝධයක් පැන නැගුණා. උගතුන්, බුද්ධිමතුන් මහජන පෙත්සම් අත්සන් කළා. ජ.වි.පෙ. අපි පාර්ලිමේන්තුවේ එක්දින විවාදයක් පැවැත්වුවා. එදා ධර්මදාස බණ්ඩා ඇමතිවරයා තමයි ව්‍යාපෘතිය සම්බන්ධව කටයුතු කළේ. එදා නැවතුණු ව්‍යාපෘතිය අද නැවතත් ඇවිත් තිබෙනවා.



### මාදුරුඔය රක්ෂිතයෙන් ඉඩම්

මෙම ව්‍යාපෘතියේ ලංකාවේ නියෝජිතයා එදා වගේම අදත් අයි.එම්.එස්. හෝල්ඩින් සමාගමයි. නමුත් මේ ව්‍යාපෘතියේ බූකර් ටේට් සමාගම හංගන්න ආණ්ඩුව උත්සාහයක ඉන්නවා. මෙම ව්‍යාපෘතියෙන් උක් වගාවත් ගිනිසීරියා වගාවත් සහ කිරි ගම්මානත් යෝජනා කර තිබෙනවා. මුල් ව්‍යාපෘතියේ අක්කර 65,000 වෙනුවට දැන් අක්කර 62,500ක් යෝජනා කර තිබෙනවා. තායිලන්තය, චීන වැනි සමාගම් ගැනත් කියවෙනවා. මුල් ව්‍යාපෘතියේ නිල්ගල රක්ෂිතයෙන්, ගල්ඔය රක්ෂිතයෙන්, මාදුරුඔය රක්ෂිතයෙන් ඉඩම් ගන්න යෝජනා කර තිබුණා. දැන් ගල්ඔය, නිල්ගල අත්හැරලා මාදුරුඔය රක්ෂිතයෙන් ඉඩම් ගන්න යනවා.

එදා ජනතා උද්ඝෝෂණ නිසා මේ සම්බන්ධයෙන් ආණ්ඩුවේ අවධානය යොමුවුණා. මේ ගැන සමීක්ෂණ කරන්න කමිටු පත්කළා. 2006 මාර්තු මාසයේ ක්ෂේත්‍ර නිරීක්ෂණයක් කළා. එම නිරීක්ෂණයට අනුව අයි.එම්.එස්. හෝල්ඩින් සමාගම ඉල්ලලා තිබුණු නිල්ගල, ගල්ඔය සහ මාදුරුඔය රක්ෂිතයෙන් ඉඩම් ලබාදීම ප්‍රතික්ෂේප කරලා තිබුණා. ගල්ඔය ඖෂධ සම්පත් සහ සවානා තෘණ භූමියකින් සමන්විත වූ නිසාත් ගල්ඔය රක්ෂිතය තැනිතලා භූමියක් සහ ඉගිනියාගල ජල පෝෂක ප්‍රදේශයක් වීම නිසාත් ගල්ඔය පෝෂණය කරන මීගල මහවෙල, වලහතැන්නකඳුර සීතලකඳුර, දහමල්ඔය. වැනි ජල ධාරා නිසාත් ඉඩම් ලබාදීම ප්‍රතික්ෂේප කෙරුණා. ස්වභාවික වන ආවරණයක් තිබූ මාදුරුඔය ජල පෝෂක ප්‍රදේශයක් බැවින් මාදුරුඔය රක්ෂිතයෙන් ඉඩම් ලබාදීමත් ප්‍රතික්ෂේප වුණා. කොහොම වුණත් මාදුරුඔය රක්ෂිතයෙන් එදා ලබාදීමට යෝජනා වූ ඉඩම් අක්කර 373ක ප්‍රදේශයත් දැන් ගෙනත් තිබෙන ව්‍යාපෘතියේ අඩංගු වෙනවා. කර්මාන්ත ශාලාව හදන්න යෝජනා කරලා තිබෙන්නේ එම ප්‍රදේශයේයි. වන රක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මේ ප්‍රදේශය දෙන්න බැහැ කිව්වා. නමුත් මේ ආණ්ඩුව වෙන වෙන වාර්තා හදලා ඉඩම් ටික බදු දෙන්න යනවා. මීට කලින් ඇමරිකානු ඩෝල් සමාගමට ලබාදුන් ඉඩම්වලින් මේ වනතෙක් කිසිදු බදු මුදලක් අයකරගෙන නැහැ. එසේ තිබියදී තමයි මේ විදිහට නැවතත් ඉඩම් විදේශ සමාගම්වලට ලබාදෙන්න යන්නේ.

ඒ විතරක් නෙවෙයි මෙම ප්‍රදේශවල පුරාවිද්‍යාත්මක වටිනාකමත් තිබෙන පුරාවස්තු තිබෙනවා. නිල්ගල, දඹාන වැනි ප්‍රදේශවල අපේ පැරණි මුතුන්මිත්තන් ජීවත් වූ නිසා ප්‍රාග් ඓතිහාසික වටිනාකමක් තිබෙනවා. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ට එරෙහිව පළමු වෙඩි මුරය පත්තු වුණේ ඌව වෙල්ලස්ස කැරැල්ලෙන්. එසේ තිබියදී ඌව වෙල්ලස්සේ ඉඩම් අද හොර රහසේ බ්‍රිතාන්‍ය කොම්පැනිවලටම ලබාදෙන්න යනවා. එම ප්‍රදේශයේ කටාරම් සහිත ලෙන්, ස්වභාවික ලෙන්, පැරණි ගොඩනැගිලි අවශේෂ, ස්ථූප ගොඩනැගිලි, පැරණි වැව් පිහිටි ස්ථාන, පැරණි සොහොන් කොටස් සහ පැරණි ගල්බැම් යන පුරා විද්‍යාත්මකව හඳුනාගත් ස්ථාන රැසක් තිබෙනවා. මේවා පිළිබඳව සියුම් පුරාවිද්‍යාත්මක ගවේෂණයක් කරනවා වෙනුවට මෙම ප්‍රදේශ ඩෝසර් කරලා කර්මාන්ත ශාලාවක් හදන්න ඉඩ දී තිබෙනවා. ජූනි 05 වැනිදා පරිසර දිනය දවසේ අපේ රටේ පරිසර ඇමති වන මෛත්‍රීපාල ජනාධිපතිවරයා පරිසරයම විනාශ කරන ව්‍යාපෘතියකට මුල්ගල තියන්න සැලසුම් කර තිබෙනවා. ඒක සමහර විට තවත් ලෝක වාර්තාවක් වේවි. අපි කියනවා ජනාධිපතිතුමාට මේ පරිසර විනාශකාරී ව්‍යාපෘතියට මුල්ගල තියන්න එන්න එපා කියලා.

### අනිවාර්ය උක් වගාව

ආණ්ඩුව ප්‍රදේශයේ ඉඩම් කොම්පැනිවලට දෙන්න යන්නේ හංගලා. ආණ්ඩුව කියන්නේ ගොවියන්ට කැමති නම් උක් වගා කරන්න පුළුවන් කියලා. මීට කලින් පැල්වත්තේ, සෙවනගල, හිඟුරාන, කන්තලේ උක් වගා කෙරුවේ ආණ්ඩුවේ ඉඩම්වලයි. ගොවියන්ගේ පෞද්ගලික ඉඩම් උක් වගාකරන්න දුන්නේ නැහැ. ව්‍යාපෘති වාර්තාවට අනුව මෙම සම්පූර්ණ ව්‍යාපෘතියට රු. කෝටි 2800ක් වෙන්කර තිබෙනවා. පිටරට සමාගම් මේ තරම් මුදලක් යොදලා පාඩු ලබන්න කර්මාන්ත ශාලා හදන්නේ නැහැ. ඒ නිසා ආණ්ඩුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අරමුණින් ගොවියන්ට ඉඩම් බෙදා දීමත් යෝජනා කරනවා. ඒ කියන්නේ ආණ්ඩුව කොහෙන් හෝ ඉඩම් ලබාගන්නවා කියන එකයි. එක ගොවියෙක් සඳහා හෙක්ටයාර දෙක හමාරක ඉඩම් කැබැල්ලක් ලබාදෙන්න නියමිතයි. මහඔය, පදියතලාව, බදුල්ල, රිදීමාලියද්ද, මහියංගනය, ලුණුගල, මොනරාගල, බිබිල, මඩගල්ල යන ප්‍රදේශවලින් ඉඩම් ලබාගන්න ආණ්ඩුව සැලසුම් කර තිබෙනවා. මෙම ව්‍යාපෘතියේ ඉලක්කය ගොවි පවුල් 8,000ත් 10,000ත් අතර ප්‍රමාණයක්. ඒ අනුව හෙක්ටයාර් 25,000ක (අක්කර 62,500) මෙම ව්‍යාපෘතිය සඳහා ඉඩම් ලබාග න්න නියමිතයි. ගොවියන්ට ඉඩම් ලබාදීමේ ප්‍රධාන කොන්දේසියක් වන්නේ, මෙම ඉඩම් කැබැල්ලේ හෙක්ටයාර

> "අපේ රටේ පාලකයෝ යෝජනා කරන්නෙම පරිසර සතුරු සංවර්ධනයයි. නමුත් ඒ සංවර්ධනය පාලකයින්ට මිතුරුයි. උමාඔය ව්‍යාපෘතිය, කොළඹට ගේන මෙගා ව්‍යාපෘති පරිසර සතුරු සංවර්ධනයයි. පරිසරය විනාශ කරලා දිනකට ඩොලර් 02ටත් අඩු ආදායමක් ගේන ව්‍යාපෘති තමයි ආණ්ඩුව යෝජනා කරන්නේ."

2ක ප්‍රමාණයේ අනිවාර්යයෙන් උක් වගා කිරීමයි. අපේ රටේ ගොවි ජනතාව කොම්පැනියක කුලී කම්කරුවන් කරන්නයි මේ ආණ්ඩුව හදන්නේ. 80 දශකයේ පැල්වත්ත, සෙවනගල, හිඟුරාන ප්‍රදේශවල කරපු දේම අදත් කරන්න හදනවා. කොන්දේසිවලට යටත් නැති ගොවි ජනතාව ඉඩමෙන් එළවලා දානවා.

අපි මේ සමාගමට එදත් කිව්වා, උක් වගා කරන්න ඕන නම් කන්තලේට යන්න කියලා. කන්තලේ ජලාශයෙන් උක් වගා කරන්න වතුර දෙනවා. ඕන තරම් පහසුකම් තිබෙනවා. සේනානායක සමුද්‍රයෙන් වතුර දෙන හිඟුරානට යන්න කිව්වා. උඩවලව ජලාශයෙන් වතුර දෙන සෙවනගලට යන්න කිව්වා. නමුත් ඒ සමාගම් එම ප්‍රදේශවලට යන්නේ නැහැ. ඔවුන්ගේ ඉලක්කය රක්ෂිත ඉඩම් අල්ලා ගැනීමයි. එම ප්‍රදේශවල උක් වගා කරන්න වතුර නැහැ. නළ ළිං ගහලා තමයි වතුර ගන්න හදන්නේ. එම ව්‍යාපෘතියට දිනකට වතුර ලීටර් 2,980,000ක් ඕන වෙනවා. නළ ළිං ගහලා වතුර ගත්තාම මාදුරුඔය ඉහත්තෑවට මොකද වෙන්නේ? පහුගිය කාලයේ ගෙනාපු උක් වගා කිරීමේ ව්‍යාපෘති නිසා මේ වනකොට තණමල්විලට, බුත්තලට, බොන්නවත් වතුර නැතිවෙලා. දැන් මේ ප්‍රදේශවලටත් උක් ව්‍යාපෘති ගෙනල්ලා ජනතාවට බොන්න තියෙන වතුර ටිකවත් නැති කරන්නයි මේ ආණ්ඩුව හදන්නේ. උක් වගාව කොම්පැනිවලට, පාලකයින්ට පැණි රස වුණාට ජනතාවට තිත්තයි.

උක්ගහ කියන්නේ පොළොවේ තියෙන වතුර ටික උරලා සීනි හදන ගහක්. එයින් විශාල පරිසර හානියක් සිදුවෙනවා. දැනට ලංකාවේ ඉඩම් අක්කර 40,000ක ප්‍රමාණවක්වත් උක් වගාවට යට කර නැහැ. එසේ තිබියදී තවත් අක්කර 62,500ක අලුතින් උක් වගා කරන්න හදනවා. මේ ප්‍රදේශයේ උක් වගාව සඳහා නළ ළිං 30,000ක් පමණ අවශ්‍ය වෙනවා. මේ නිසා වාරි කර්මාන්තවලට ඉදිරියේදී විශාල බලපෑමක් එල්ල වෙනවා. මේ ප්‍රදේශවල හේන්, කුඹුරු, ගෙවතු වගාකරන ගොවීන්ගේ ශ්‍රමය සූරාකන්නයි, මේ කොම්පැනි බලාගෙන ඉන්නේ. බහුජාතික සමාගම්වලට අපේ රටේ ජනතාව බිලි දිය යුතු නැහැ. ආණ්ඩුව කියනවා මේ ව්‍යාපෘතියෙන් විශාල ලාභයක් රටට එනවා කියලා. ඒක බොරුවක්. සාමාන්‍යයෙන් හෙක්ටයාරයකින් වාර්ෂිකව උක් ලබාගත හැක්කේ ටොන් 65යි. හෙක්ටයාර් දෙකකට ටොන් 130යි. උක් ටොන් එකක් සාමාන්‍ය මිල රු. 5000යි. වගාව නෙළිය හැක්කේ වසරකට එක් වරක් පමණයි. හෙක්ටයාර් දෙකක උක් වගාව සඳහා ගොවීන් 07 දෙනෙකුගේ ශ්‍රමය අවශ්‍ය වෙනවා. ඒ අනුව එක ගොවියෙකුගේ දිනක ආදායම වන්නේ රු. 254යි. උක් ටොන් 130 සඳහා රු. 5000 ගණනේ වාර්ෂික ආදායම දින 365න් බෙදා, 7න් බෙදූ විට එක් ගොවියෙකුගේ දිනක ආදායම ලැබෙනවා. මේකද මේ ආණ්ඩුව කියන සංවර්ධනය?

### පරිසර හිතකාමී විය නොහැකිද?

අපේ රටේ තිබෙන්නේ කුඩා භූමි ප්‍රමාණයක්. එම භූමිය කළමනාකරණය කරලා අඩු පරිසර හානියකින් වැඩි ලාභයක් ලබාගන්න ආණ්ඩුව කටයුතු කළ යුතුව තිබෙනවා. සංවර්ධනය පරිසර මිතුරු සහ පරිසර සතුරු ලෙස වර්ග කොට තිබෙනවා. අපේ රටේ පාලකයෝ යෝජනා කරන්නෙම පරිසර සතුරු සංවර්ධනයයි. නමුත් ඒ සංවර්ධනය පාලකයින්ට මිතුරුයි. උමාඔය ව්‍යාපෘතිය, කොළඹට ගේන මෙගා ව්‍යාපෘති පරිසර සතුරු සංවර්ධනයයි. පරිසරය විනාශ කරලා දිනකට ඩොලර් 02ටත් අඩු ආදායමක් ගේන ව්‍යාපෘති තමයි ආණ්ඩුව යෝජනා කරන්නේ. නමුත් අගමැතිවරයාම කියනවා, අපේ රටේ ජනතාවගෙන් 48%ගේම දිනක ආදායම ඩොලර් 02ට අඩුයි කියලා.

ඒ විතරක් නෙවෙයි, අපේ රටේ අලි මිනිස් ගැටුම එන්න එන්නම වැඩියි. මේකට හේතුව අලින්ගේ වාසභූමි මිනිසුන් විසින් ආක්‍රමණය කිරීමයි. පාලකයින් කොයි තරම් අලි වැටවල් ගැහුවත් මේකට විසඳුමක් නැහැ. පැල්වත්ත, හිඟුරාන, කන්තලේ අලි ගහලා මිනිස්සු මැරෙනවා. මේ ප්‍රදේශවලට අලි එන්නේ උක් වගාව නිසයි. බුත්තල, වැල්ලවාය, තණමල්විල මිනිස් ජීවිත අහිමි වෙන්නේ උක් පැණි රසට වල් අලි ඇදී එන නිසයි. ආණ්ඩුව දැන් උක් වගා කරන්න යෝජනා කරන ඇකිරියන්කුඹුර ප්‍රදේශයත් අලි කොරිඩෝ එකක් ලෙසයි හඳුනාගෙන තිබෙන්නේ. ඒ ප්‍රදේශයේ උක් කර්මාන්ත ශාලාවක් දානවා කියන්නේ අනෙක් ප්‍රදේශවල අලි මාදුරුඔය ප්‍රදේශයටත් එනවා කියන එකයි. ඉදිරියේදී එම ප්‍රදේශවල ජනතාවටත් වල් අලි ප්‍රශ්නය එන්න නියමිතයි.

අපි එදා ඌව වෙල්ලස්ස ජන අයිතීන් සුරකීමේ සංවිධානය ගොඩනැගුවා. අදටත් ඒ සංවිධානය තිබෙනවා. ඒ සංවිධානය මගින් නැවතත් සටනක් ආරම්භ කරනවා. එදා මේ රටේ ජනතාව අත්සන් දෙලක්ෂයක් මෙම ව්‍යාපෘතියට එරෙහිව එකතු කළා. එවැනි ජනතා විරෝධයක් තිබියදී මේ ව්‍යාපෘතිය ගෙන්න හදන්නේ ඇයි? අපි මීට අවුරුදු 10කට කලින් පාර්ලිමේන්තුවේ මේකට විරුද්ධව කතා කළා; සම්මන්ත්‍රණ තිබ්බා; උද්ඝෝෂණ කළා; පෙත්සම් අත්සන් කළා; පොත් ගැහුවා. දැන් අවුරුදු 10කට පස්සෙත් නැවතත් ඒවා එළියට ගන්න සිදුවෙලා තිබෙනවා. අපි මේ ව්‍යාපෘතිය ගේන්න ඉඩ දෙන්නේ

15වැනි පිටුවට

ජනතා විමුක්ති පෙරමුණේ මහජන නියෝජිතයින් විසින් පළ කළ අදහස් වෙනුවෙන් නියමුවා වේදිකාව වෙන්වෙයි.

2017 මැයි 03

# කැලණි ගඟ පවිත්‍ර කිරීමේ ක්‍රියාවලියක් වහාම ඇරඹිය යුතුයි

පාර්ලිමේන්තු මන්ත්‍රී
වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයා

**(කැලණි ගඟ දූෂණය වැළැක්වීම සඳහා මැදිහත්විය යුතු බවට වන කල්තැබීමේ යෝජනාව ඉදිරිපත් කරමින්)**

අපි කවුරුත් දන්නා කැලණි ගඟ කියන්නේ හෝර්ටන් තැන්නෙන් එහෙම නැත්නම් සමනළ කඳුවැටියෙන් ආරම්භ වෙලා අපේ රටේ මධ්‍යම, සබරගමු



පළාත්වලින් ඇවිත් බස්නාහිරින් මුහුදට වැටෙන ගංගාවක්; අපේ රටේ නුවරඑළිය, රත්නපුර, කෑගල්ල, කොළඹ සහ ගම්පහ කියන දිස්ත්‍රික්ක තෙත් කරමින් ගලා බසින කිලෝ මීටර් 145ක් පමණ දිග ගංගාවක්. ලංකාවේ දිගින් හතරවන තැනට වැටෙන ගංගාවත් කැලණි ගංගාවයි. කැලණි ගඟ තවත් විශේෂත්වයක් ගන්නේ කොළඹ සහ ගම්පහ කියන ඉතාම ජනාකීර්ණ දිස්ත්‍රික්ක මැදිකරගෙන ගලා යෑමෙනුයි. ඒ වගේම, කිලෝමීටර් 145ක් දිග මේ කැලණි ගංගාව පෝෂණය කරන්නට අතු ගංගා 20ක් පමණ දායක වෙනවා. යටියන්තොටින් මී ඔය, රුවන්වැල්ලෙන් රිටිගහ ඔය සහ ගුරුගොඩ ඔය, දැරණියගලින් සීතාවක ඔය, හංවැල්ලෙන් පුස්වැලි ඔය සහ වක් ඔය, කඩුවෙලින් හෙට්ටිගේ ඔය වාගේ ප්‍රධාන අතු ගංගාවලින් පෝෂණය ලබලා තමයි කැලණි ගඟ මුහුදට වැටෙන්නේ.

අදත් කොළඹ දිස්ත්‍රික්කයේ පානීය ජල සැපයුමෙන් සියයට 80ක් සහ ගම්පහ දිස්ත්‍රික්කයේ පානීය ජල සැපයුමෙන් සියයට 30ක් සපයන ගංගාව ගැලණි ගඟයි. ඒ අනුව මා දන්නා හැටියට අඹතලේ ජල පවිත්‍රාගාරයෙන් දිනකට ගැලුම් මිලියන 110ක් පමණ, කැලණිය පට්ටිවිල ජල පවිත්‍රාගාරයෙන් ගම්පහ දිස්ත්‍රික්කයට දිනකට ගැලුම් මිලියන 40ක් පමණ, නවගමුව පවිත්‍රාගාරයෙන්, ගැලුම් මිලියන 15ක් පමණ, පානීය ජල අවශ්‍යතාව සඳහා නිකුත් කරනවා. ඒ වාගේම කැලණි ගඟෙන් අපේ පානීය ජල අවශ්‍යතාව සම්පූර්ණ කරන්නට වැලිවිට-පට්ටිවිල දෙවෙනි අදියර විධියට ජල පවිත්‍රාගාරයක් යෝජනා කරලා තිබෙනවා.

> කැලණි ගං මිටියාවතේ තිබුණු කොකාකෝලා සමාගමට එරෙහිව ජල සම්පපාදන හා ජලාපවහන මණ්ඩලය පැවරූ නඩුවේදී කොකොකෝලා සමාගමට සිද්ධ වුණා රුපියල් කෝටි 6කට ආසන්න ප්‍රමාණයක් ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට වන්දි ලෙස ගෙවන්නට. බැර ලෝහ නිසා ඒ යන්ත්‍ර අකර්මණ්‍යවීමෙන් යන්ත්‍රවලට වුණු හානියට ඒ කොම්පැනිය ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට එවැනි මුදලක් ගෙව්වා. යන්ත්‍රවලට එවැනි හානියක් සිද්ධවෙලා තිබෙනවා නම් මේ ජලය පානය කරන මේ ප්‍රදේශයේ ජනතාවට කොතරම් හානියක් සිද්ධ වෙන්නට පුළුවන්ද? බැර ලෝහ තැන්පත්වීමෙන් ඒ අයගේ අවයව ක්‍රමානුකූලව අක්‍රිය වෙන්න බැරිද?

කෙසේ නමුත් ඉතාම සංකීර්ණ, ඉතාම ජනාකීර්ණ දිස්ත්‍රික්ක දෙකක් මැදින් ගලන කැලණි ගං මිටියාවතේ, කැලණි ගඟ සහ ප්‍රධාන අතු ගංගා ආශ්‍රිතව කර්මාන්තශාලා 9,000කට ආසන්න ප්‍රමාණයක් තිබෙනවා. විශේෂයෙන්ම හංවැල්ල සිට මෝදර දක්වා ඉතා අධික කර්මාන්තශාලා ප්‍රමාණයක් ස්ථානගත වෙලා තිබෙනවා. කොකාකෝලා, පෙප්සිකෝලා සහ බියර් කොම්පැනි වාගේ කර්මාන්ත ශාලා තමයි තිබෙන්නේ. ඒ වාගේම සීතාවක කර්මාන්ත පුරයෙන්, හෝමාගම කර්මාන්ත පුරයෙන් සහ බියගම නිදහස් වෙළඳ කලාපයෙන් අතු ගංගා හරහා කැලණි ගඟට අපද්‍රව්‍ය බැහැර කෙරෙනවා.

පසුගිය කාලයේදී කැලණි ගඟට ඉතා විශාල ලෙස අපද්‍රව්‍ය බැහැර කිරීම පිළිබඳව විවිධ විශ්වවිද්‍යාලවල ආචාර්යවරු, මහාචාර්යවරු පරීක්ෂණ කළා. ඒ අතරින් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මහාචාර්ය පද්මලාල් මහතා මීට මාස 6කට පමණ කලින් ප්‍රකාශ කළා කැලණි ගඟේ අධික බැර ලෝහ සාන්ද්‍රණයක් තිබෙනවා කියලා. ආසනික් යම් ප්‍රමාණයක් තිබෙනවා වාගේම මේ ජලයේ ඇලුමිනියම් ලෝහ ඉතා අධික වශයෙන් සාන්ද්‍රගත වෙලා තිබෙනවා කියලාත් ඔහු සොයා ගත්තා. මේ ජනතාවට පානීය ජලය සැපයීමේදී ක්ලෝරීන් දාලා විෂබීජ හරණය කරන්නට ක්‍රමවේදයක් තිබුණාට බැර ලෝහ ඉවත් කරන්නට ක්‍රමවේදයක් නැහැ. මේ බැර ලෝහ තැන්පත්වීම අපි සාකච්ඡා කරන වකුගඩු රෝගය ව්‍යාප්ත වීමටත් ප්‍රධාන වශයෙන් බලපා තිබෙනවා. මේ කලාපය තුළත් වකුගඩු රෝග සහ පිළිකා රෝග ව්‍යාප්තිවීමේ අවදානමක් තිබෙනවා. මේ 15වැනි පිටුවට

2017 මැයි 05

# අඩි 100ක් යට බිම්ගෙයක් තුළදී වුවත් නිවැරදි ප්‍රතිපත්තියක් රැකිය යුතුයි!

පාර්ලිමේන්තු මන්ත්‍රී
බිමල් රත්නායක සහෝදරයා

**(විදේශ අමාත්‍යාංශයේ තානාපති වරප්‍රසාද පිළිබඳ පනත යටතේ නියමයන් පිළිබඳ විවාදයට එක්වෙමින්)**

අද මෙම මාතෘකාවට ඍජුව සම්බන්ධ නැති වුණත් විදේශ ප්‍රතිපත්තියට සම්බන්ධ දෙයක් මම කියන්න කැමැතියි. ශ්‍රී ලංකා ආණ්ඩුව තමන්ගේ පලස්තීනය පිළිබඳ ප්‍රතිපත්තිය පැහැදිලිව, නිශ්චිත වශයෙන් වෙනස් කර තිබෙනවා. අපි මේ රටේ ජනතාවට ඒ බව දන්වනවා.



පලස්තීනයේ ජෙරුසෙලම් නගරයේ සියලුම ආගම්වලට විශේෂයෙන්ම ඉස්ලාම් ආගමට, කතෝලික ආගමට සහ යුදෙව් ආගමට අයත් පොදු සිද්ධස්ථානයක් වශයෙන් සැලකෙන භූමියක් තිබෙනවා. ඒක අල්-අක්සා පල්ලිය කියලාත් හඳුන්වනවා. එම පල්ලියට- ආගමික මධ්‍යස්ථානයට- එරෙහිව එය විනාශ කිරීම අරමුණු කරගෙන ඊශ්‍රායලය විසින් අවුරුදු ගණනක් තිස්සේ කරන්නා වූ දේවල්වලට විරුද්ධව එක්සත් ජාතීන්ගේ සංවිධානය තුළත්, යුනෙස්කෝ එක තුළත් 1907 වර්ෂයේ ඉඳලා ලෝකයේ ජාතීන් අතිවිශාල ප්‍රමාණයක් එක දිගට කියා තිබෙනවා. මෙය ඓතිහාසික උරුමයක්; මෙය විනාශ කරන්න එපා කියලා.

1907 වර්ෂයේ හේග්වල තිබුණු ලොව පළමු ලෝක සංස්කෘතික වටිනාකම් රැක ගැනීම පිළිබඳ සමුළුවේ සිට අවුරුදු සියයකට වැඩි කාලයක් තිස්සේ - අන්තවාදී කොන්වුණු කණ්ඩායම් දෙක තුනක් හැර - ලෝකයේ බහුතර ජාතීන් මෙය විනාශ කිරීමට විරුද්ධව ඡන්දය ලබාදෙමින් ඉන්නවා. දැන් එම ස්ථානයේ කරන්නේ මොකක්ද?

ඊශ්‍රායල ආණ්ඩුව කරන්නේ එම පල්ලිය යටින් උමං හාරන එකයි. උමං සිය ගණනක් දැනට හාරා තිබෙනවා. ඔවුන් කියන්නේ, "එම පල්ලිය හදන්න කලින් එතැන යුදෙව් පල්ලියක් තිබුණා, එය සොයන්න තමයි මෙසේ හාරන්නේ" කියලායි. එහෙම තිබුණාද, නැද්ද කියලා මම දන්නේ නැහැ.

දළදා මාළිගාවට යටින් ඉස්ලාම් පල්ලියක් තිබෙනවා, එහෙම නැත්නම් කතෝලික පල්ලියක් තිබෙනවා. එහෙමත් නැත්නම් සූර්ය දෙවියන්ට වන්දනා කරපු කාලයේ තිබුණු මොකක් හරි ප්‍රාථමික දෙයක් තිබෙනවාය කියලා කවුරු හරි කිව්වොත්, එසේ කියා එතැන හාරන්න පටන් ගත්තොත්, මේ රටේ බෞද්ධයන්ගේ හදවතට එය කොපමණ දැනෙනවාද? ඉස්ලාම් පල්ලියක් තිබෙනවා කියලා මඩු පල්ලිය යට හාරන්න පටන් ගත්තොත්, එය කොතරම් දැනේවිද?

චෛත්‍යයක් තිබෙනවාය කියලා නල්ලූර් කෝවිල යට හාරන්න පටන් ගත්තොත් මොකද වෙන්නේ? අන්න ඒ වාගේ වැඩක් තමයි මේ කරන්නේ. එමනිසා ලෝකයේ ජීවත් වන ශිෂ්ට සම්පන්න හැම ජාතියක්ම මේක එපාය කියලා තිබෙනවා. ලංකා ආණ්ඩුවත් අවුරුදු ගණනාවක් තිස්සේ මේක එපා කියමින් ආවා. නමුත්, පසුගිය ඔක්තෝබර් මාසයේ ලංකාව මේ සම්බන්ධයෙන් යුනෙස්කෝ සංවිධානයේ යෝජනාවේදී ඡන්දය දීමෙන් වැළකී සිටියා. වැළකී සිටියාට පස්සේ ඒක විශාල රාජතාන්ත්‍රික පටලැවිල්ලක් බවට පත්වුණා.

ලංකාවේ සිටින මුස්ලිම් රටවල් නියෝජනය කරන තානාපතිවරු 18දෙනෙක් ගිහින් ජනාධිපතිතුමා මුණ ගැහුණා. මුණ ගැහිලා එතුමාට කිව්වා, "

ඇමෙරිකාවට යට වෙලා; ඇමෙරිකාවේ ලණු කාලා කන පරිප්පු තමයි මේ. අපේ දිගුකාලීන මිත්‍රයෝ කවුද? තීරණාත්මක තැන්වලදී කවදාවත් ඇමෙරිකා එක්සත් ජනපදය ලංකාවට පක්ෂව ඡන්දය දීලා නැහැ. ඒකයි සත්‍යය. මේ ගොල්ලන් ඇමෙරිකාවේ ඉගෙනගෙන ඇති. හැබැයි, අපි මේ තත්වය තේරුම් ගන්න ඕනෑ. ලංකාවේ මෙන්ම ඇමෙරිකාවේත් පුරවැසිභාවය තිබෙන ලොක්කෝ දෙදෙනෙකු පසුගිය ආණ්ඩුවේ සිටියා. හිටපු ජනාධිපතිතුමාගේ මල්ලිලා දෙදෙනාම ඇමෙරිකාවේ පුරවැසියෝ වෙලා සිටියා. එමනිසා ඇමෙරිකාව අපට උදවු කළා ද?

මේක කරන්න එපාය කියලා අපි ඉල්ලා සිටිනවා" කියලා. මොකද ලංකාව මැද පෙරදිග රටවල් සමග දිගුකාලීන මිත්‍රත්වයක් තිබෙන නිසා. ඔවුන් අපට අමාරු වූ හැම වෙලාවකම ඡන්දය දීලා තිබෙනවා.

ඒත් නැවත වතාවක් මැයි මාසයේ තුන්වෙනිදාත් ලංකාණ්ඩුව ඡන්දය දීමෙන් වැළකිලා තිබෙනවා. දැන් පලස්තීනයට විරුද්ධව ලෝකයේ ඡන්දය දෙන්නේ කවුද? පලස්තීනයට විරුද්ධව ඡන්දය දෙන්නේ, නැත්නම් ඊශ්‍රායලයට පක්ෂව ඡන්දය දෙන්නේ ලෝකයේ ඇමෙරිකාවයි, ඊශ්‍රායලයයි පමණයි. අපි ලෝකයත් එක්ක යනවා කියලානේ දැන් මේ ආණ්ඩුව කියන්නේ. ලෝකයත් එක්ක යනවා කිව්වාට ඔබතුමන්ලා පලස්තීන ප්‍රශ්නයේදී ඉන්නේ ලෝකයත් එක්ක නොවෙයි. ඔබතුමන්ලා ඉන්නේ රටවල් දෙකක් එක්කයි. ඊශ්‍රායලය වෙනුවෙන් ඡන්දය දෙන්නේ රටවල් දෙකයි.

මම පසුගිය කාලයේ දිගටම කිව්වේත්, දැන් කියන්නේත් එකම තර්කයයි. ඇමෙරිකාවට යට වෙලා; ඇමෙරිකාවේ ලණු කාලා කන පරිප්පු තමයි මේ. අපේ දිගුකාලීන මිත්‍රයෝ කවුද? තීරණාත්මක තැන්වලදී කවදාවත් ඇමෙරිකා එක්සත් ජනපදය ලංකාවට පක්ෂව ඡන්දය දීලා නැහැ. ඒකයි සත්‍යය. මේ ගොල්ලන් ඇමෙරිකාවේ ඉගෙනගෙන ඇති. හැබැයි, අපි මේ තත්වය තේරුම් ගන්න ඕනෑ. ලංකාවේ මෙන්ම ඇමෙරිකාවේත් පුරවැසිභාවය තිබෙන ලොක්කෝ දෙදෙනෙකු පසුගිය ආණ්ඩුවේ සිටියා. හිටපු ජනාධිපතිතුමාගේ මල්ලිලා දෙදෙනාම ඇමෙරිකාවේ පුරවැසියෝ වෙලා සිටියා. එමනිසා ඇමෙරිකාව අපට උදවු කළා ද?

අපේ රටේ රාජ්‍යතාන්ත්‍රික දේපොළ කියලා කියන්නේ, අවුරුදු 70ක් තිස්සේ මේ රට නිදහස්, ස්වෛරී රාජ්‍යයක් විධියට, නොබැඳි රටක් විධයට ලෝකයෙන් දිනාගෙන තිබෙන ගෞරවයයි; අපට පක්ෂව කථා කරන්න ලෝකයේ රටවල් 100ක්, 150ක් ඉන්න එකයි. ඒකටයි මේ ගහන්නේ. ඒකයි දැන් මේ විනාශ කරන්නේ. ඔබතුමන්ලා හිතනවාද, පලස්තීනයට විරුද්ධවෙලා මැදපෙරදිග ඡන්ද ලබාගන්න පුළුවන්ය කියලා ? සදාම් හුසේන් එල්ලා මරද්දී කිව්වේ මොකක්ද? "ඉරාකයට ජයවේවා!"යි කියලා කිව්වාද? නැහැ. ඔහු කිව්වේ, "පලස්තීනයට ජයවේවා!"යි කියලායි. මට වඩා මේ මන්ත්‍රීතුමන්ලා ඒවා දැනගන්න ඕනෑ. ඒ නිසා අපි කියන්නේ, එක්සත් ජාතික පක්ෂයේ අධිරාජ්‍ය ගැතිකම්, ඇමෙරිකන් ගැතිකම් තබා ගන්න; ඔබතුමන්ලා අලුතින් එක ඡන්දයක්වත් හම්බ කර ගන්නේ නැතුව මැදපෙරදිග කලාපයේ අපේ දිගුකාලීන මිත්‍රයන් අහිමි කර ගන්න එපාය කියලායි අපි කියන්නේ. එහෙම කරගන්න අයිතියක් නැහැ. ඒ විතරක් නොවෙයි. මේක සාධාරණ ප්‍රශ්නයක්. අඩි 100ක් යට බිංගයෙක් ඇතුළේදී වුණත් නිවැරදි ප්‍රතිපත්තියක් රකින්න ඕනෑ.

කාටවත් පක්ෂ වන්නේ නැහැයි කියන එක උත්තරයක්ද? ඒ කියන්නේ අපට කිසිම ප්‍රතිපත්තියක් නැහැයි කියන එකයි. නිවැරදි දේ හොඳයි කියන්න කොන්දක් තිබෙන්න ඕනෑ.

කවුළුව හැරම් තබමි

# ඔවුහු සිසු බව ඉක්මවා ගියෝය...



ඔවුහු ශිෂ්‍යයා නම් වූ කුඩා භූමිකාවට පමණක් කොටු නොවූහ. මේ සමාජ ක්‍රමය විසින් ශිෂ්‍යයන්ට උරුම කරදී තිබෙන සිහින පැකේජයට ඔවුහු කොටු නොවූහ. ඒවා සුනුවිසුණු කරගෙන ඔවුන් අලුත් මාවතක් සොයා ගියෝය. එහෙත් ඒ ස්වාර්ථයේ මාවත නොව පරාර්ථයේ මාවතයි. සිය දිවි පරදුවට තබා උපන් දේශයටත් රටේ ජනතාවටත් සිය යුතුකම් ඉටුකිරීම අපරාධයක් ලෙස සැලකූ පාලකයෝ ඔවුන් අමු අමුවේ මරා දමනු ලැබූහ. එහෙත් ඔවුන් දැල්වූ පහන් තවමත් ආලෝකය දෙමින් දැල්වෙමින් තිබේ. එම පහන්වලින් තව තවත් පහන් දැල්වේ.

මේ නරුම සමාජය විසින් උරුමකරදුන් ස්වාර්ථකාමය නමැති කූඩුව තුළ සිරගත නොවූ ඔවුන් අන්කවරෙකුවත් නොව හැම වසරකම ජූනි 20වැනි දින අප විසින් අනුස්මරණය කරනු ලබන විරු සිසුවන්ය. ඔවුන් දිවි පිදුවේ හුදු අධ්‍යාපන අයිතිය පමණක් වෙනුවෙන් නොවේ. මවුබිමේ ස්වාධීනත්වයත් ජනතාවගේ අයිතීනුත් වෙනුවෙනි.

හුදු ශිෂ්‍යයා යන මනෝභාවයෙන් ඔබ්බට පා එසවීමට තරම් ඔවුහු ධෛර්ය සම්පන්න වූහ. ශිෂ්‍යයා සුරක්ෂිත වන්නේ සමාජය සුරක්ෂිත වුවහොත් පමණක් බව ඔවුහු දැන සිටියහ. ඒ සඳහා පවතින සමාජක්‍රමය වෙනස් කළ යුතුය. පළමු කාර්යය එයයි. ඔවුහු ඒ සත්‍යය දැඩිව විශ්වාස කළෝය; ඒ වෙනුවෙන් කැපවූහ. ඔවුහු සමාජ අරගලයට ඉහළින්ම දායක වූහ. ඔවුනට සිය දිවි අහිමි වූයේ ඒ ගමනේදීය. එහෙත් ඔවුන් දැල්වූ ගිනිසිළු නොනිවී දැල්වෙමින් තිබේ.

# නාටක මාරයි - නමය හමාරයි



ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මෙන්ම ඇමති මණ්ඩල සංශෝධනයද දැන් තනිකර ජෝක් වැඩකි. රටට ශාපය, ශෝකය මෙන්ම විහිළුද සපයන ආයතනය බවට මේ වන විට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව පත්වී තිබේ.

රටේ විශාල ආන්දෝලනයක් ඇතිකර දැවැන්ත මාධ්‍ය ප්‍රචාරයක් ලබාගනිමින් පසුගියදා යහපාලන ආණ්ඩුව 'මාර' ඇමති මණ්ඩල සංශෝධනයක් කළේය. මුදල් ඇමතිකම රවීගෙන් අරගෙන මංගලට දී මංගලගේ විදේශ ඇමතිකම රවීට ලබාදීම ඒ ඇමති මාරු රංගනයේ ප්‍රධානම ජවනිකාව බව මාධ්‍යවලින් උලුප්පා පෙන්වන ලදී. රටේ සකලවිධ දෝෂ, රෝග, ප්‍රශ්න, ගැටලුවලට ප්‍රත්‍යක්ෂ විසඳුම මේ ඇමති මාරුව බව දැන් යහපාලකයින් විසින් කියන්නට පටන්ගෙන ඇත. කෙසේ වුවද මේ ඇමති මාරුවේ තිබෙන ලොකුම පුදුමය නම් ලෝකයේ හොඳම මුදල් ඇමතිට මුදල් ඇමතිකම අහිමි වීමය. රට අර්බුදයකට යනවිට පාලකයෝද අර්බුදයට යති. තම බල ව්‍යාපෘතිද දෙදරීමට පටන් ගනී. එවිට පාලකයෝ රටේ මූලික ප්‍රශ්න යටගසා අතුරු ප්‍රශ්න මවා රටේ ජන අවධානය නොමඟ යවති. හැමදාමත් මේ පාලකයින් විසින් කළේ මේ නාටකයමය. බූරු කුට්ටම අනන්නාසේ එකම කොළ ටික අනා තවදුරටත් ජනයා රැවටීමට මේ පාලකයින් විසින් උත්සාහ ගන්නේ නම් එය කෙළවර වන්නේ විහිළුවකින් නොව ඊට වඩා බරපතළ තැනකිනි.

එළ හරක්, කුළු හරක්, මී හරක් කීවද උන් ඔක්කොම හරක් බව ජනතාවට තේරුම් ගැනීම අපහසු විය නොහැක.

# හකු පනින දේශප්‍රේමය

හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ වරක් චිත්‍රපටයකද රඟපෑවේය. ඔහුගේ රංගනය උච්ඡස්ථානයට පත් වූයේ ජනාධිපතිකම කරන කාලයේය. දැන් ඔහු කරමින් සිටින්නේ ගරු රඟපෑම්ය. මොහු ඩබල්ගේම් රංගනයන්ට කවදත් දක්ෂය. ඔහු දැන් රඟන්නේ සියල්ල අමතක වී ආකාරයෙනි. එසේම රටේ ජනයාටද ඒ සියල්ල අමතක වී ඇති බව සිතාගෙනය. රටේ සම්පත් ඉන්දියාවට සහ චීනයට විකිණීම සම්බන්ධයෙන් හද පැලෙන දේශප්‍රේමයෙන් යුතුව දැන් ඔහු බෙරිහන්දීමට පටන්ගෙන ඇත.

කොළඹ වරායේ කොටසක් චීනයට පවරා ගෝල්ෆේස් පිට්ටනියේ අක්කර 20ක් ශැංග්‍රිලා සමාගමට පැවරුණේ ඔහු පාලන කාලයේය. කල්පිටියේ දූපත් විකුණා දැමුවේද ඒ කාලයේය. ඊට අමතරව රටේ ඉඩම් චීනයට, ඉන්දියාවට, ඇමෙරිකාවට කුණුකොල්ලයට විකුණා දැමීමට කටයුතු කළේද ඔහු ප්‍රමුඛ ඔහුගේ නඩයයි. ඉන්දීය සමාගම්වලට ලංකාවේ නිවාස ව්‍යාපෘති භාරදුන්නේද ඔහුගේ ඇමති මණ්ඩලයේ නිවාස ඇමති වූ විමල් වීරවංශය. එසේ කළ මොව්හු දැන් මේ ආණ්ඩුවද ඔවුන් මෙන් රට විකුණා කනවිට විපක්ෂයේ සිට මහා දේශප්‍රේමීන් මෙන් හැසිරෙති. අවුරුදු 69ක් පුරාම මේ පාලකයින් මාරුවෙන් මාරුවට කළ එකම දෙය රට කෑමය; වැනසීමය.

ඉදින් මේ ව්‍යාජය එළිපිටම පෙනෙද්දීත් රටේ ජනතාව තවදුරටත් රැවටීමට ලක්විය යුතුද?



# පෝලිටිකල් පංතිය

පොලිටික්කා සති දෙකක්ම පංතියට ආවෙ නැතුව ඉඳලා මැයි දිනෙන් පස්සෙ දවසක ආවා, යුරෝපෙ දිනපු නැපෝලියන් වගේ.

"ගුඩ් මෝනිං සර්...සර්" අනුරුද්දියයි වසන්තියයි දෙන්නම තරගෙට වගේ එක පාර කිවුව.

"ගුඩ් මොනිං ළමයිනේ" පොලිටික්ක කිවුවෙ කණ්ණාඩිය යටින් හොරැහින් පංතිය දිහා බලන ගමන්.

"ඇයි සර් අද?" කනිය ඇහුවෙ නාවනම් හොඳයි කියනව වගේ.

"එහෙම නෙමෙයි නේද ළමයිනේ අහන්න ඕනෙ?" පොලිටික්කට ලැජ්ජ හිතුණ.

"සමාවෙන්න සර්... ඇයි අද එන්න හිතුණෙ?" කනිය කලින්ට වඩා හපන් විදිහට නිවැරදි කළා.

"ඔය කිවුවෙ..." පොලිටික්කට තදත් වුණා. ඒත් කියන්න ආපු දේ කිවුවෙත් නැති හින්ද ඇකිළුව. "ළමයිනේ අහන්න ඕනෙ ඇයි ආවෙ නැත්තෙ කියල නේද?"

"ඇත්තටම ආවෙ නැත්තෙ ඇයි සර්?" වසන්තිය හිතුව ඒක ලකුණු දෙන ප්‍රශ්නයක් කියල.

"මම වැදගත් වැඩ වගේක හිටිය ළමයිනේ..." පොලිටික්ක නැති රැවුලක් අතගෑවා, මුහන්දරම් ලුක් එකක් එක්ක. "... මැයි දිනේ සංවිධාන වැඩ"

"ගොල්ෆේස් එක පුරවන්න සර්වත් දිවෙව්වද?" මංජුව ඇහුවෙ පොලිටික්ක ගැන අනුකම්පාවෙන් වගේ.

"දිවෙව්ව නෙමෙයි ළමයො. අපි දිවුව." පොලිටික්ක හැරෙන තැපෑලෙ නිවැරදි කළා. "දැක්කනෙ ප්‍රතිඵලේ." පොලිටික්ක කොලර් එක අතගෑව.

"දැන් ආණ්ඩුව පෙරළන්නද යන්නෙ සර්?" අනුරුද්දිය ඇහුවෙ පොලිටික්කගෙ මූණෙ පෙනුමට බයවෙලා.

"පෝය දෙකයි නේද සර් මහින්ද මහත්තයා කියල තිබුණෙ" මංජුව ඇහුවෙ කිංඩියට හින්ද පොලිටික්ක පසුබෑව.

"ගිය අවුරුද්ද පුරාමත් එහෙම කිවුව නේද?" චමිය මංජුව දිහා බලාගෙන පොලිටික්කට බෝලෙ දැම්ම.

"පෝය දෙකයි කියල පස්සෙ කතාව වෙනස් කළා නේද?" සමනත් හීනියට කතාවට එන්ටර් වුණා.

"ඇයි පෝය දෙකයි කියල පස්සෙ විසි දෙකයි කිවුවද?" මංජුව පැන්න.

"නැහැ, මහින්ද මහත්තය ගණන් වැරැද්දුවෙ නැහැ" සමන කියද්දි මෙනව වුණත් සමන වැඩේ ගොඩදායිද කියලත් පොලිටික්කට හිතුණ.

"එහෙනම් ඒවා 'පෝය' නෙමෙයි අවුරුදු කියල කිවුවද?" චමියටත් කුතුහලේ.

"ඒත් නැහැ. තව වෙසක් පෝය දෙකකින් කියල කතාව වෙනස් කළා!... කොහොමත් දෙදාස් විස්සෙ ඡන්දෙනෙ" සමන පෝය ප්‍රශ්නය විසඳද්දි පොලිටික්කගෙ මූණ ඇකිළුණා අපරාදෙ සෙනඟ අදින්න මහන්සි වුණේ කියන්න වගේ.

"නැහැ ළමයිනේ... මහින්ද මහත්තය කිවුවෙ මිනිස්සුන්ට ඕනෙනම් ආණ්ඩුව පෙරළන්න පෝය දෙකකුත් ඇති කියල" පොලිටික්ක අලුත් දේශපාලන විග්‍රහයක් හැදුව ජාමෙ බේරගන්න.

"පෙරළන්න ඕනෙ වෙන්නෙ මිනිස්සුන්ටනම් මහින්ද මහත්තය මොකටෙයි දින කියවන්නෙ?" මංජුව ගේමම ඉල්ලුව.

"ඇත්ත කතාව මිනිස්සුන්ට වඩා මහින්ද මහත්තයට හදිස්සියිනෙ. මිනිස්සු මොනවද දන්නෙ බලේ තියෙන වටිනාකම. මොකද මිනිස්සු කවදාවත් ඕක පාවිච්චි කරල තියෙන එකක්යෑ. මහින්ද මහත්තගෙ ගෙදර කෝකියත් දන්නව රාජ්‍ය බලෙන් මොනවද කරන්න පුළුවන් කියල... නැද්ද සර්" සමන 'නැද්ද සර්' කියල ඇහුවට පොලිටික්කට දෙන්න උත්තරයක් තිබුණෙ නෑ.

## මැදමුලනේ සිහිනය... 05 පිටුවෙන්



ඉන්දියානු විරෝධයක් පෙන්වා, 'දේශප්‍රේමය' අවුස්සා ජනමතයක් හැදීමට රාජපක්ෂ කල්ලියේ ඇතමුන් උත්සාහ කළද මහින්ද රාජපක්ෂ මහතා ඉන්දීය අගමැතිවරයාගේ ලංකා සංචාරයේදී සාකච්ඡාවක් ඉල්ලාගෙන ගොස් ඔහු හමුවීම නිසා ඉන්දියානු විරෝධයක් නිර්මාණය කිරීමේ උත්සාහයද අසාර්ථක විය. පසුගිය අවුරුදු දෙක තුළ රාජපක්ෂවරුන්ට අලුතින් එකතුවූ කිසිවෙකුත් නැත. සියලු කරුණු අනුව පෙනෙන්නේ මීළඟට බලය ගැනීම සඳහා රාජපක්ෂවරුන් දකින සිහිනය සිහිනයක් පමණක්ම බවය.

අනෙක් අතට රටේ දේශපාලනයේ වත්මන් අර්බුදය විසිනුත් ලංකාවේ වසර 70ක දේශපාලන ගමන්මගේ අත්දැකීම් විසිනුත් දැන් ඉල්ලා සිටින්නේ, නැවත වරක් සරල ආණ්ඩු මාරුවක් නොව සමාජ ක්‍රමයේ ගැඹුරු වෙනස්කම් කළ හැකි පාලනයකි. ධනේශ්වර පංතියේ තනි, ශක්තිමත් පාලනයේ කාලය දැන් අවසන්ව ඇත. රටේ ප්‍රබල වෙනසක් කිරීමට ජනතාව අසමත් වුවහොත් යළි බිහිවන්නේද ධනපති හවුල් ආණ්ඩුමය. විශේෂයෙන්ම 19වැනි සංශෝධනය මඟින් අමාත්‍ය ධුර සංඛ්‍යාව සීමාකර ඇති නිසා වැඩිදුර ඇමතිකම් ගැනීමට නම් හවුල් ආණ්ඩු ඇටවිය යුතුමය. එම කරුණු නිසාද ඉදිරියේ ධනපති ආණ්ඩු හවුල් ආණ්ඩු ගොඩනැගීමේ ඉඩ වැඩිය. එහෙත් මෙරට ජනතාවත් ප්‍රගතිශීලී බලවේගත් රට ගෙනයා යුත්තේ, එම බේදවාචකය වෙත නොවේ. දැන් රටට ගැඹුරු දේශපාලන සමාජ වෙනසක් අවශ්‍යය. ධනවාදයේ අර්බුදයත්, ධනපති ආණ්ඩුවේ දුර්වලතාවයත් ධනපති ශ්‍රීල.නි.ප.යේ බෙදීමත් එ.ජා.ප.යේ දුබල බවත් විසින් නිර්මාණය කර ඇති දේශපාලන තත්වය වඩා වාසිදායක වන්නේ විකල්ප බලයක් සඳහා කටයුතු කරන විකල්ප දේශපාලන ව්‍යාපාරයකටය.

එබැවින් වර්ධනය වෙමින් පවතින ධනේශ්වර අර්බුදය හමුවේ හෙට දවසේ බිහිකළ හැකි වන්නේත් බිහිකළ යුතු වන්නේත්, තට්ටුමාරු දේශපාලනයේම දිගුවක් ලෙස තවත් ධනපති කණ්ඩායමක පාලනයක් නොව රට වෙනස්කරන වමේ හා ප්‍රගතිශීලී බලවේගයන්ගේ නායකත්වයෙන් ගොඩනැගෙන නව පාලනයකි. ඒ සඳහා මැදිහත්වීම කාගේත් වගකීම වී තිබේ.

## කැලණි ගඟ පවිත්‍ර කිරීමේ... 13 පිටුවෙන්



වන විටත් රජයේ ආයතන මේ අවදානම හඳුනාගෙන තිබෙනවා.

කැලණි ගං මිටියාවතේ තිබුණු කොකාකෝලා සමාගමට එරෙහිව ජල සම්පපාදන හා ජලාපවහන මණ්ඩලය පැවරූ නඩුවේදී කොකොකෝලා සමාගමට සිද්ධ වුණා රුපියල් කෝටි 6කට ආසන්න ප්‍රමාණයක් ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට වන්දි ලෙස ගෙවන්නට. බැර ලෝහ නිසා ඒ යන්ත්‍ර අකර්මණ්‍යවීමෙන් යන්ත්‍රවලට වුණු හානියට ඒ කොම්පැනිය ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට එවැනි මුදලක් ගෙව්වා. යන්ත්‍රවලට එවැනි හානියක් සිද්ධවෙලා තිබෙනවා නම් මේ ජලය පානය කරන මේ ප්‍රදේශයේ ජනතාවට කොතරම් හානියක් සිද්ධ වෙන්නට පුළුවන්ද? බැර ලෝහ තැන්පත්වීමෙන් ඒ අයගේ අවයව ක්‍රමානුකූලව අක්‍රීය වෙන්න බැරිද?

ඒ නිසායි අපි යෝජනා කරන්නේ කැලණි ගඟ පවිත්‍ර කිරීමේ ක්‍රියාවලියක් වහාම ආරම්භ කරන්නට ඕනෑ කියලා. මේ කර්මාන්තශාලා ආරම්භ කිරීමේදී පළාත් පාලන ආයතන පරිසර බලපත්‍රයක් ලබාදෙනවා. ඒ පරිසර බලපත්‍රය ලබා ගැනීමේදී මේ හැම කර්මාන්තශාලාවක්ම අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රියාවලියේදී යම්කිසි ආකාරයක පිරිපහදුවක් කරනවා කියලා පොරොන්දු වෙනවා. ඔවුන් සමහර යන්ත්‍ර සවි කරනවා. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ මේ යන්ත්‍රවලට දමන රසායනික ද්‍රව්‍යවලට යන වියදම වැඩියි; යන්ත්‍ර ක්‍රියාත්මක කරන්නට යන වියදම වැඩියි. එමනිසා යන්ත්‍රය ඔහේ තියලා, කැලණි ගඟට අපද්‍රව්‍ය මුදා හරිනවා. ඒක තමයි, මෙතැන මතුවී තිබෙන ප්‍රශ්නය. මධ්‍යම පරිසර අධිකාරියේ හෝ පළාත් පාලන ආයතනයේ රාජ්‍ය නිලධාරීන් ගිහින් බලනකොට ඒ මොහොතේ විශේෂයෙන්ම මළ අපද්‍රව්‍ය සහ වෙනත් අපද්‍රව්‍ය කාලයක් තිස්සේ බැහැර කිරීම නිසා ඒ ජලයේ ඔක්සිජන් සාන්ද්‍රණය අඩුවෙලා, එහි ජීවයක් පවතින්න බැරි මත්ස්‍යයන්ට ජීවත් වෙන්න බැරි තත්ත්වයට පත්වෙලා තිබෙන්නේ. එමනිසා ඒ ජනතාව අද ධීවර කර්මාන්තයෙන් ඈත් වෙලා තිබෙනවා. අද මේ ජල කඳ එන්න එන්නම, පානයට එදිනෙදා පරිහරණයට නුසුදුසු තත්වයකට පත්වෙමින් යනවා. දැනටමත් මධ්‍යම පරිසර අධිකාරිය සහ අපේ රටේ විවිධ විද්වතුන් පෙන්නුම් කරනු ලැබූ විධියට මේ බරපතළ අනතුර තේරුම් අරගෙන, වේගවත් මැදිහත්වීමක් කරලා, කැළණි ගඟ පවිත්‍රකරණය කිරීමේ වැඩ පිළිවෙළක්, එම ජලය ජනතාවට පාවිච්චියට සුදුසු තත්ත්වයට පත් කිරීමේ වැඩ පිළවෙළක් කඩිනමින් දියත් කරන්න කියන යෝජනාව ඉදිරිපත් කරනවා.

## පාලකයින්ට උක් පැණි රස වුණාට... 12 පිටුවෙන්



නැහැ. ඊට එරෙහිව දැවැන්ත ජනතා විරෝධතාවයක් ගොඩනගනවා.

සමහරු අපිට කියන දෙයක් තමයි, ජේ.වී.පී. එක හැම දේටම විරුද්ධ වෙනවා, විකල්පයක් යෝජනා කරන්නේ නැහැ කියලා. ඒත් මේ උක් ව්‍යාපෘතිය වෙනුවට ඕන තරම් විකල්ප තිබෙනවා. බිබිල දොඩම්වලට ප්‍රසිද්ධයි. දැන් දොඩම් වගාව විනාශ වෙලා ගිහින්. එම ප්‍රදේශවල ගම්වලට නම් තිබෙන්නේ දෙහිගම, දොඩම්ගල්ල, දොඩම්වත්ත වැනි ඇඹුල් සහිත නම්. එම ප්‍රදේශවල දෙහි, දොඩම්, නාරං, අන්නාසි, පැපොල්, රඹුටන්, වැනි වගාවන් ආරම්භ කළ හැකියි. කළු ගම්මිරිස් කිලෝවක් රු. 1500යි. සුදු ගම්මිරිස් වගා කරලා අපනයන කරන්න පුළුවන් නම් කිලෝ එක රු 8000ට දෙන්න පුළුවන්. කුරුඳු, රබර් වගා කරන්න පුළුවන්. එම කිසිම වගාවක් පරිසරයට, සතුන්ට අහිතකර වෙන්නේ නැහැ. මේ වගාවන්වලින් ගොවියන්ට විශාල ලාභ ගන්න පුළුවන්. හැබැයි පාලකයින්ට ලාභ ගන්න බැරි නිසා කොම්පැනිවලට ඉඩම් දෙන්න යනවා. පාලකයින්ට ඩොලර්, යුරෝ එන්නේ කොම්පැනිවලට උදව් කළාම.

මේ ආණ්ඩු පහුගිය කාලේ මුං ඇට, රට මෑ, කව්පි, අත්තික්කා, දොඩම්, ලංකාවට ආනයනය කළා. ජමනාරං, සියඹලා, මිරිස් පවා අපේ රටට ආනයනය කළා. මේවා වෙනුවෙන් රු. කෝටි ගණන් වියදම් කරලා තිබෙනවා. මේවා ලංකාවේ වගා කළොත් ගොවියන්ට විශාල ලාභයක් ගන්න පුළුවන්. ඒ නිසා අපි පසුගියදා මේ ප්‍රදේශවල ජනතාව රැස් කරලා මෙම ව්‍යාපෘතිය ගැන දැනුවත් කළා. නැවතත් අපි ප්‍රබල සංවිධානයක් ගොඩනගනවා. ඌව වෙල්ලස්සේ එක් බිම් අඟලක්වත් කොම්පැනිවලට දෙන්න අපි ඉඩ දෙන්නේ නැහැ. මේවා ජනතාවට අයිති සම්පත්.

## බලය තිබෙන්නේ... 03 පිටුවෙන්

විශාල පරිමාණයෙන් ඒකරාශි කරමින් ඉන්නේ. නමුත් මැයි දිනය ගත්තොත් අපිට මැයි දිනයේදී පෙණුන දේ තමා ජනතා විමුක්ති පෙරමුණ වටා පොදු ජනතාව ඒකරාශි කරගන්න පුළුවන් කියන විශ්වාසය ඇතිව අපි කරගෙන යන වැඩපිළිවෙළ නිවැරදියි කියන එක පිළිබඳව පැහැදිලි පණිවිඩයක් තමා මෙවර මැයි දිනයේදී ලැබුනේ. මෙවර මැයි දිනයට සහභාගිවූ සුවිශාල ජනතාව අතරේ විශාල වශයෙන් අලුත් බලවේග හිටියා. අලුත් තරුණ අය සිටියා. ගම්වල කිසිදාක රැස්වීම්වලට සහභාගි නොවුණ අය සිටියා. එම නිසා ගියවර මැයි රැලියට වඩා මෙවර මැයි රැලියේ වර්ධනය ගත්තොත් හරියටම 40% කින් පමණ වැඩිවී තිබෙනවා. මෙය විශාල වර්ධනයක්. මේ රටේ පොදු ජනතාව ජනතා විමුක්ති පෙරමුණ වටා ඒකරාශි කරගැනීම සඳහා ඉලක්ක කරගෙන යන වැඩපිළිවෙළ නිවැරදියි සාර්ථකයි කියන එක මෙමගින් පැහැදිලි වෙනවා.

දෙවන එක තමා මෙවර මැයි දිනයට ජාත්‍යන්තර නියෝජිතයින් සහභාගි වුණා. මෙවර සහභාගි වූ ජාත්‍යන්තර නියෝජිතයින්ගෙන් අද ලෝකයේ පවතින පවතින ප්‍රධානම සමාජවාදී රාජ්‍යය ලෙස නම්කරන්න පුළුවන් කියුබානු කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ සහෝදරයෙක් සහභාගි වුණා. ප්‍රථම වරට තමා කියුබානු කොමියුනිස්ට් පක්ෂයේ නායකයෙක් අපේ පක්ෂයේ මැයි දිනයට සහභාගි වුණේ. ග්‍රීසියේ කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ සාමාජිකයෙක් සහ යුරෝපා පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක් සහභාගි වුණා. අද ග්‍රීසියේ කොමියුනිස්ට් පක්ෂය ලෝක කොමියුනිස්ට් ව්‍යාපාරයේ ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයේ බර දරන ප්‍රධානම මෙහෙයුම්කරුවා වශයෙන් අපට හඳුන්වන්න පුළුවන්. ලෝකයේ දැනට ක්‍රියාත්මක වන ජාත්‍යන්තර කොමියුනිස්ට්වාදී වෘත්තීය සමිති, සංවිධාන, තරුණ සංවිධාන, පක්ෂ සංවිධාන මේ අති බහුතරයක සුවිසාල කැපවීමක් ග්‍රීසියේ කොමියුනිස්ට් පක්ෂය විසින් කරනවා. එය ඉතාම සටන්කාමී, ඉතාම විනයගරුක කොමියුනිස්ට් පක්ෂයක්. එහි නායක මණ්ඩලයේ සාමාජිකයෙක් මෙවර මැයි දිනයට සහභාගිවීම තුළින් ජවිපෙ පිළිබඳව ඔහුට පුළුල් අවබෝධයක් ලබා ගැනීමට හැකිවීම අපි දකිනවා විශේෂත්වයක් ලෙස. ඊට අමතරව එංගලන්තයේ මාක්ස් ලෙනින්වාදී කොමියුනිස්ට් පක්ෂයෙනුත් ඉන්දියාවේ අපේ සහෝදර පක්ෂයක් ලෙස සලකන ෆෝවර්ඩ් බ්ලොක් පක්ෂයේ නායකයනුත් මෙයට සහභාගි වුණා.

ඊට අමතරව විශේෂත්වය තමා, මෙවර ජනතා විමුක්ති පෙරමුණේ මැදිහත්වීමෙන් යාපනයේ මැයි දිනයක් පැවැත්වුණා. යාපනයේ මැයි දිනය පැවැත්වූයේ ජ.වි.පෙ. සහ විවිධ වෘත්තීය සමිති, ධීවර සංවිධාන, පොදුජන සංවිධාන වෘත්තිකයන් මේ සියලුදෙනාගේම ඒකාබද්ධ මැයි රැලියක් වශයෙන්. මෙහි විශේෂත්වය තමා, අපි යාපනේ වාමාංශික බුද්ධිමතුන්ගෙන් දැනගත් පරිදි 1960 ගණන්වල ෂන්මුගදාසන් මහතාගේ මූලිකත්වයෙන් වාමාංශික පක්ෂවලින් තමා යාපනයේ ප්‍රසිද්ධ මැයි රැලියක් පවත්වා තිබෙන්නේ. ඊට අවුරුදු 50කට පසුවයි මෙවර ජනතා විමුක්ති පෙරමුණේ මූලිකත්වයෙන් අනිකුත් කණ්ඩායම්ද ඒකරාශි කරගෙන අපිට පුළුවන්කම ලැබුණේ යාපනයේ නගරය තුළ විශාල පෙළපාළියක් සහ මැයි රැලියක් පැවැත්වීමට. යාපනය තුළ විදේශ නියෝජිතයන්ද සහභාගිත්වයෙන් කුමන හෝ මැයි රැලියක් පවත්වපු ප්‍රථම අවස්ථාවද මෙය බවයි, එයට සහභාගිවූ යාපනේ විද්වතුන්ගේ අදහස.

තුන්වන කරුණ තමා අපට හැකියාව ලැබුණා, උතුරු පළාතේ ජනතා සහභාගිත්වයෙන් පමණක් (යාපනයේ සහ කොළඹ මැයි රැලි දෙකක් පවත්වන එක පහසු කටයුත්තක් නෙමෙයි.) මැයි දින රැලියක් පැවැත්වීමට. උතුරේ පැවත්වූ විශාලම මැයි දින පෙලපාලිය සහ රැලිය ජනතා විමුක්ති පෙරමුණේ සහභාගිත්වයෙන් පැවත් යාපනයේ පැවත්වූ මැයි රැලිය බවත් කිව යුතුයි. මෙම මැයි රැලියේ තිබෙන අනික් ඓතිහාසික කරුණ නම් අපට ඕනකම තිබුණේ උතුරු පළාතේ ජනතාව සිංහල, දෙමළ, මුස්ලිම් කියන බෙදීම වෙනුවට ඔවුන් ගොවියන් වැඩකරන ජනතාව වෘත්තිකයන් ශිෂ්‍යයන් පොදු ජනතාව වශයෙන් එකහා සමාන ප්‍රශ්න තිබෙන අය වශයෙන් එකම වේදිකාවට ගෙනඑන්න. යාපනයේ වේදිකාව ඉතා පුළුල් වේදිකාවක්. උතුරු පළාතේ ධීවර සංගම්, සමුපකාර සමිති නායකයෝ, ගොවි සංගම් නායකයෝ, වාමාංශික බුද්ධිමතුන්ගේ නායකයෝ, යාපනයේ කුල පීඩිතයන්ගේ නායකයෝ මේවාගේ පුළුල් පිරිසක් සහභාගි කරවා ගන්න අපට හැකිවුණා.

උතුරු පළාතේ යුද්ධයෙන් පීඩාවට පත් කොටසක් සිටින නමුත් අද ඔවුන් පීඩාවට පත්වන්නේ මේ පවතින ධනපති ආර්ථික ක්‍රමය මගින්. ඔවුන් යුද්ධයෙන් බැටකා ඉන්න නිසා මේ ධනපති ආර්ථික ක්‍රමයෙන් සිදුවන පීඩාව තව වැඩියි. ඒනිසා අපට ඕනෑකම තිබුණේ හැමදාම යුද්ධයේ ප්‍රශ්නය පමණක් අවධානය යොමුකරමින් ඉන්නවා වෙනුවට උතුරු පළාතේ වැඩකරන ජනතාව වශයෙන් මූණදෙන පීඩාවන් ගැටලු පිළිබඳව උතුරු පළාතෙන් හඬක් රටට ඉදිරිපත් කරන්න. අපි විශ්වාස කරනවා එය සාර්ථක වුණාය කියලා. ඉදිරි කාලයේදී මෙයට වඩා පුළුල් ජනතා සහභාගිත්වයෙන් මැයි රැලියක් පැවත්වීමට හැකිවේයැයි අපි විශ්වාස කරනවා.

***නියමුවා:- ආණ්ඩුව මුහුණ දෙන ආර්ථික හා දේශපාලන අර්බුදයයත් සමග ලාංකේය දේශපාලනය නැවත වරක් උණුසුම් වෙමින් පවතිනවා. පොදුවේ ධනේශ්වර දේශපාලනය තමන්ගේ අසාර්ථකත්වය පෙන්නුම් කරද්දී සහ පැවති පාලනයට සම්බන්ධ දූෂිතයින් නැවත වරක් ජනතාව රැවටීමට කැස කවනවා. මේ දේශපාලන තත්වය ජනතා විමුක්ති පෙරමුණ තේරුම් ගන්නේ කොහොමද? අභියෝග ජයගැනීම සඳහා වන සූදානම කොහොමද?***

***බිමල් රත්නායක සහෝදරයා:-*** ධනපති දේශපාලනයේ තිබෙන ස්වභාවයම තමා එය ඉතාමත් බංකොලොත් ඉතාමත් අසාර්ථක එකක් නිසා රටකට එක අඟලක් හෝ ඉදිරියට යන්න බැරිකම. ඔබ දන්නවා, රාජපක්ෂ පාලනය බිඳදැමීම මේ රටේ ජනතාව කරපු ලේසි පහසු කටයුත්තක් නොමෙයි. ඔවුන් පෙරළා දමා හැදුණු ආණ්ඩුවට මේ රාජපක්ෂ පාලනය විනාශකරපු තැනින් එක අඟලක් ඉස්සරහට රට ගෙනියන්න බැරිවෙලා තිබෙනවා. එය තමා ලෙනින් සහෝදරයා ඉතාම නිවැරදිව කීවේ ධනපති ක්‍රමයට තව එකම දශමයක්වත් යහපතක් හොඳක් කරන්න බැහැ කියලා. මෙය තමා අපි හැම ක්ෂේත්‍රයකම දකින්නේ. වර්තමාන පාලනයත් ප්‍රශ්න තවත් කුණුකර ගන්න එක හැරෙන්න වෙනත් කිසිවක් කරන්න බැහැ. ඒනිසා හැමවිටම ඒ පැරණි හොරු, පැරණි දූෂිතයො, මිනීමරුවො, රට පාවා දුන්න පුද්ගලයො නැවත වතාවක් විවිධ සළුපිළි ඇඳගෙන එක ලංකාවට පමණක් ආවේණික දෙයක් නොමෙයි. ලෝකෙම ධනපති දේශපාලනය පරාජය කරගන්නට බැරිවූ හැම රටකම ජනතාව මුහුණදීල තිබෙන බේදවාචකයක්. අනික් පැත්තෙන් ජනතාව ඉදිරියේ තිබෙන අභියෝගයක්. හොරු පන්නන්න ජනතාව ඉගෙන තියෙනවා. හොරු වෙනුවට ප්‍රගතිශීලී, වාමාංශික දේශපාලන නායකත්වයක් පත්කර ගැනීමට ලෝකය පුරා ජනතාවගෙන් වැඩි ප්‍රමාණයක් අසමත්වෙලා තියෙනවා.

මේ දිනවල සාකච්ඡාවක් තිබෙනවා රාජපක්ෂගේ මැයි රැලියට විශාල සෙනඟක් ආවා කියලා. අපි දැක්ක ආණ්ඩු පක්ෂයේ රැස්වීමට වඩා, ආණ්ඩු පක්ෂයේ මෛත්‍රීපාලගේ රැස්වීමට වඩා සෙනග රාජපක්ෂගේ රැස්වීමට ඇවිල්ල තිබෙනවා. නමුත් ඒ ඇවිල්ල තියෙන පිරිස දිහා බැලුවහම අපට පේනවා ඔවුන් රාජපක්ෂත් එක්ක හැමදාම හිටපු පිරිසම තමා. අලුත් කිසිම මූණක් අලුත් බලවේගයක සලකුණක්වත් නැහැ. ඒ පරණ හොරුමයි වේදිකාවේ සිටියේ. ඒ අරක්කු ටිකට කසිප්පු ටිකට බත් පැකට් එකට විකිණිච්ච රාජපක්ෂ සමග සිටිය පිරිසමයි සිටියේ. රාජපක්ෂලට බලය ගැනීම අපහසු වැඩක්. ආණ්ඩු පක්ෂයට වඩා රාජපක්ෂට ජනතාව පැමිණීමෙන් පේන්නේ ආණ්ඩුව කෙරෙහි ජනතාව කලකිරීමෙන් සිටිනවා. ඒ කලකිරීමෙන් සිටින ජනතාව මත රාජපක්ෂ විසින් පැරණි සබඳතා, පැරණි මාධ්‍ය සබඳතා, කොල්ලකාගත් පැරණි මුදල් කන්දරාව යොදාගෙන යම් මතයක් ගොඩනගන්න උත්සාහ කරනවා.

ඇත්තටම ගත්තොත් මේක අභියෝගයක්. මේක අභියෝගයක් වෙන්නේ, රටේ ඇතැම් මිනිසුන් පුටුවල වාඩිවෙලා ටීවී බලන ගමන්, සනීපෙට දේශපාලනය කථා කරන ගමන් හොඳ රටක් හැදෙයි කියලා බලාගෙන ඉන්න නිසා. අපි දේශපාලන වෙනසක් බලාපොරොත්තු වෙන හැමෝටම කියන්න ඕනෑ, මිනිසුන් සූදානම් නැතිතාක් රටේ දේශපාලන වෙනසක් වෙන්නේ නැති බව. සාධාරණ දේශපාලන වටපිටාවක් සකස්කර ගන්න අවශ්‍ය නම් මිනිසුන් වශයෙන් අපිට යම් කැපකිරීමක් කරන්න වෙනවා. ජනතාව දේශපාලන වශයෙන් සක්‍රීය විය යුතුයි. ඔවුන් වෘත්තීය සමිතිවල සංවිධානය විය යුතුයි. 'අනේ අපේ වැඩක් බලන් ඉන්නවා' කියන්නේ නැතිව ගමේ පොදු ප්‍රශන වෙනුවෙන් ඉස්සරහට එන්න වෙනවා. ජනතා විමුක්ති පෙරමුණ වශයෙන් අපි මේ සත්‍යය ජනතාවට කියනවා. අපි දිසා සමුළු පවත්වමින් දිසා මෙහෙයුම් පවත්වමින් ගම්මට්ටමට යමින් අපි දිගටම මේ ප්‍රශ්නය කියනවා.

මීතොටමුල්ල කුණු කන්ද කඩන් වැටෙන විට, රටේ තවත් කුණු කඳු තියෙනවා. නුවර කුණු කන්දක් තියෙනවා. ගාල්ලේ තියෙනවා. රටේ හැමතැනම තියෙනවා. ජනතාවගේ නැගිටීමක් නැතිව සැබෑ ලෙසම හොරු පරාජය කර ජනතාවාදී දේශපාලනයක් ගොඩනගා ගැනීම පක්ෂයකට විතරක් කරන්න බැහැ. ජ.වි.පෙ.ට පුළුවන් නායකත්වය දෙන්න පමණයි. ජ.වි.පෙ.ට පුළුවන් කරුණු කියන්න, මෙහෙයවන්න. නමුත් ජනතාව නැගිටිය යුතුයි. සමාජයේ පොදු ජනතා බලවේග දේශපාලන වශයෙන් සක්‍රීය කර මේ ධනපති පාලනය පරාජය කර ගැනීමට අවශ්‍ය ජනතා සන්ධානයක් සාර්ථකව ගොඩනැගීගෙන යනවා.

නියමුවා මගින් අපේ රටේ ජනතාවගෙනුත් විශේෂයෙන් මෙය කියවන ජ.වි.පෙ. සාමාජිකයන්ගෙනුත් ඉල්ලා සිටින්නේ, බලය තිබෙන්නේ ජනතාව අතේ. ඔවුන් නැගිට්ටවා ගන්නේ නැතිව පක්ෂය නැගිට්ට පමණින් බලය ගන්න බැහැ. ඒ නිසා ජනතාවයි නැගිටවිය යුත්තේ. ඒ නැගිටින ජනතාවට නායකත්වය දීම ජ.වි.පෙ.ට කළ හැකියි. ඒ වෙනුවෙන් ජ.වි.පෙ. අපි උපරිම කැපවීමෙන් ඉතාමත්ම විශ්වාසවන්තව සුභවාදීව කටයුතු කරගෙන යනවා.

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com







මැයි දිනය කොළඹදී...



මැයි දිනය යාපනයේදී...




ස්විට්සර්ලන්තයේදී...




පැරීසියේදී...




ඉතාලියේදී...

# දැන් රටට අවශ්‍ය ප්‍රතිපත්ති මාරුවක්

**ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා**



කැබිනට් සංශෝධනය රනිල්-මෛත්‍රී හවුලේ ව්‍යාජ රංගනයක් පමණක් බවට ප්‍රකාශ කළ ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා කෙසේ වුවද මේ වන විට රටට අවශ්‍ය වී තිබෙන්නේ ඇමති මාරුවක් නොව අනුගමනය කරන ප්‍රතිපත්තිවල මාරුවක් බවත් අවධාරණය කළේය.

ඔහු මෙම අදහස් පළ කළේ පසුගිය 22වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය හමුවකදීය.

"මේ ආණ්ඩුව බලයට පත්වෙන විට වංචාවට දූෂණයට හවුල් වූවන් අත්අඩංගුවට ගෙන විභාගයට ලක්කොට දඬුවම් ලබාදීමට පොරොන්දු වුණා. අපේ රටේ තරුණයින්ට ජීවත්වීම වෙනුවෙන් තමන්ගේ අධ්‍යාපනයට සරිලන වැටුපක් සහිත රැකියාවක් ලබාදෙන්න ආණ්ඩුව අසමත් වෙලා තිබෙනවා. ඒ වගේම ණය උගුලක හිරවෙලා තිබෙන රට ඒ උගුලෙන් ගොඩගන්නවා කිව්වා. නමුත් ඒ වෙනුවට තවදුරටත් ණය උගුලක රට හිර කොට තිබෙනවා. නීතියේ විධානයේ ආධිපත්‍ය තහවුරු කරනවා කිව්වට එය කඩාවට්ටලා තිබෙනවා. කුඩු ඇතුළු මත්ද්‍රව්‍ය, අපරාධ අඩු කරනවා වෙනුවට තවදුරටත් වර්ධනය වෙමින් තිබෙනවා. එනිසා මේ ආණ්ඩුව වසර දෙකහමාරක් ගතවන විට ඔප්පු කර තිබෙනවා ජනතාවට ලබාදුන් පොරොන්දු එකගතා බිඳ දමා තිබෙන බව.

මේ වනවිට විශ්වවිද්‍යාලවල ඇතැම් පීඨ වසා දමලා මාස තුනහතරක් වෙනවා. කිසිදු විසඳුමක් නැහැ. පාතාලය පොලිසිය අතර වෙඩි තැබීම්වලින් දරුවන් මරණයට පත්වෙනවා. සාමාන්‍ය ජනතාවට ජීවත්වීමට නොහැකි තරමට බඩුමිල ඉහළ දමා තිබෙනවා. වංචාව දූෂණය ඉහවහා ගිහින් තිබෙනවා. ජනතාවගේ ප්‍රශ්න විසඳනවා වෙනුවට ජනාධිපතිවරයා සහ අගමැතිවරයා ඇමති මණ්ඩල සංශෝධනය නැමැති රංගනයක් රටට ඉදිරිපත් කරලා. ඇමති මණ්ඩල සංශෝධනයෙන් පස්සේ ජනාධිපතිවරයා කළායැයි කියන ප්‍රකාශයක් මාධ්‍යවල තිබෙනවා. 'ජනතාව තුළ නව බලාපොරොත්තු ඇතිකිරීම අපේ අරමුණයි' කියලා. මේවා කවදාවත් ඉටු නොවන බලාපොරොත්තු.

19වැනි සංශෝධනයට අනුව ආණ්ඩුවේ ඇමතිධුර සංඛ්‍යාව 30කටත් නියෝජ්‍ය, රාජ්‍ය ඇතිධුර 40කටත් සීමා කරන යෝජනාවක් සම්මත කරගත්තා. ශ්‍රීලනිපය, එජාපය එකතු වීම මත 2015 සැප්තැම්බර් 01වැනිදා පාර්ලිමේන්තුවේදී තීරණය කළා, ඇමතිධුර 02 වැනි පිටුවට

# ආණ්ඩුව ජනවරමට පයින් ගසා කළු කඩයක් රකිනවා

**ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා**



පසුගිය 17වැනි දින පැවැත්වූ සයිටම් විරෝධී ශිෂ්‍ය පාගමනට පොලීසිය යොදා පහරදීම හෙළා දකිමින් ජ.වි.පෙ. පසුගිය 18වැනිදා ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේදී මාධ්‍ය සාකච්ඡාවක් සංවිධානය කරන ලදී. එහිදී අදහස් දැක්වූ ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා මෙසේ අදහස් පළ කළේය.

"සිසුන්ගේ ඉතාම සාධාරණ ඉල්ලීමක් ඉටුකර ආණ්ඩුව ප්‍රශ්න විසඳනවා වෙනුවට ශිෂ්‍යයින්ට අපරාධකාරයින්ට වගේ ප්‍රහාර එල්ල කළා. එයින් ශිෂ්‍යයන් 20ක් පමණ තුවාල ලැබුවා. මේ වනවිට 10කට ආසන්න පිරිසක් බන්ධනාගාරගත කොට තිබෙනවා. සිසුන්ගේ මෙම සාධාරණ අරගලයට පොලීසිය ලවා අමානුෂික ලෙස එල්ල කළ ප්‍රහාරය අපි දැඩි ලෙස හෙළා දකිනවා. ඒ වගේම බන්ධනාගාරගත කොට සිටින සිසුන් සියලු දෙනා කොන්දේසි විරහිතව නිදහස් කරන ලෙස ආණ්ඩුවෙන් ඉල්ලනවා.

සයිටම් ආයතනය අහෝසි කරන ලෙස ජ.වි.පෙ. ඇතුළු දේශපාලන පක්ෂත් වෘත්තීය සමිති, ශිෂ්‍යයන්, වෛද්‍යවරුන්, දෙමාපියන් අරගලයක් දියත් කළේ එම ආයතනය කළු කඩයක් වූ නිසයි. ආණ්ඩුව ජනතාවට ඇහුම්කන් දෙනවා වෙනුවට මේ කළු කඩය ආරක්ෂා කිරීමේ උත්සාහයක නිරත වෙලා ඉන්නවා. ජනතාවගේ විරෝධතාවයන් මර්දනයෙන් යටපත් කරන්න හදනවා. මෙය ජනතාවගේ සටනක්. ආණ්ඩුව මෙම ප්‍රශ්නයට ඇහුම්කන් නොදෙන නිසා තමයි ව්‍යවස්ථානුකූලව තහවුරු කරලා තිබෙන ජනතාවගේ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය පාවිච්චි කරලා උද්ඝෝෂණ කරන්නේ. එහෙම උද්ඝෝෂණය කරන සිසුන්ට ප්‍රහාර දියත් කරන්නේ හිතක් පපුවක් නැති අමානුෂික ආණ්ඩුවක් විදිහටයි. එහෙම කරමින් ආණ්ඩුව සයිටම් ආයතනය රකිනවා. සයිටම් කියන්නේ කළු කඩයක්. දෙමාපියන්ට, ශිෂ්‍යයින්ට බොරු කියලා, වංචා කරලා පවත්වාගෙන යන කඩයක්.

රටක අධ්‍යාපනය පුද්ගලීකරණය වුණාම ඉන් ලැබෙන ප්‍රතිවිපාක බරපතළයි. අපේ රටේ බහුතරයක් තවමත් ජීවත් වෙන්නේ ආණ්ඩුවේ ආධාරවලින්. රටේ ජනගහනයෙන් බහුතරයකගේ දෛනික ආදායම ඩොලර් දෙකකට ආසන්නයි. එවැනි රටක ජීවත් වෙන බොහෝ දෙනාට ළමයින්ගේ අධ්‍යාපනය වෙනුවෙන් රුපියල් ලක්ෂ 120-125ක් හොයාගන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා මේ ආණ්ඩුව රටේ අනාගතයක් එක්කයි සෙල්ලම් කරමින් ඉන්නේ. පුද්ගලික අධ්‍යාපනය නිසා ඇතිවුණු සිදුවීම් පසුගියදා අපිට අසන්නට ලැබුණා. තරුණයෙක් බැංකුවක් කඩලා 02 වැනි පිටුවට

# විධායක ජනාධිපති ධුරය අහෝසි කරගැනීමේ සටනකට අවතීර්ණ විය යුතුයි

**ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා**



2015 ජනවාරි 08 වැනිදා රනිල්-මෛත්‍රී රට හමුවේ තැබූ ප්‍රධාන පොරොන්දුවක් වන්නේ ජනාධිපති ධුරය අහෝසි කිරීමේ පොරොන්දුව බව මතක්කර දුන් ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයාට ජනවරම ලැබුණේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමට බවත් එබැවින් විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමේ අරගලයට ජනතා විමුක්ති පෙරමුණ ඉදිරියේදී අවතීර්ණ වෙන බවත් අවධාරණය කළේය.

ඔහු මෙම අදහස් පළ කළේ පසුගිය 03වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලද මාධ්‍ය හමුවකදීය. එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ අනුර සහෝදරයා මෙසේද කීය.

"නව ව්‍යවස්ථාවක් ලෙස හෝ සංශෝධනයක් ලෙස හෝ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම නව ඡන්ද ක්‍රමයක් සකස් කිරීම සහ ජනතාවගේ අයිතීන් තහවුරු කිරීම සඳහා ව්‍යවස්ථානුකූල රැකවරණයක් ලබාදීම අනිවාර්යයෙන් සිදුකළ යුතුයි. ඒ නිසා අපි මේ වන විටත් දෙමළ ජාතික සන්ධානය, මුස්ලිම් කොංග්‍රසය, කොමියුනිස්ට් පක්ෂය සමග මේ සම්බන්ධයෙන් සාකච්ඡා සිදුකොට තිබෙනවා. ඒ වගේම ඉතා ඉක්මනින් ජනාධිපතිවරයා හමුවී මේ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට අප බලාපොරොත්තු වෙනවා. මොකද ඔහු ලබාදුන් එකගතාවයට මේ වන විට වසර දෙකක් ගතවී හමාරයි. මේ වෙනුවෙන් පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකේ බහුතරය ලබා ගැනීම සහ ජනමත විචාරණයකට යෑම යන කඩඉම් තිබෙනවා. එනිසා මේ සම්බන්ධයෙන් එකගකර ගත හැකි සියලු පක්ෂ හා සංවිධාන සමග සාකච්ඡා ආරම්භ කිරීමට අපි සූදානම්."

මෙම මාධ්‍ය හමුවේදීම ආණ්ඩුව මුහුණ දෙන ආර්ථික අර්බුදයේ තීව්‍රතාවය මත ඔවුන් නිසැක ලෙසම ප්‍රජාතන්ත්‍රවාදය හැකිළීමේ ක්‍රියාමාර්ගවලට 02 වැනි පිටුවට








බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.



# රළ

ද්විමාසික කලා සංස්කෘතික
සඟරාමය අතිරේකය
සමාජවාදී කලා සංගමයේ ප්‍රකාශනයකි.
නව සංස්කරණය 2017 ජුනි
08 වන කලාපය

# ශ්‍රමය වෙළෙඳ භාණ්ඩයකි...!



සාමාන්‍යයෙන් වෙළෙඳ භාණ්ඩයක් ලෙස නම් කළ විට කාටත් හැඟෙන්නේ එදිනෙදා මුදල්දී ලබා ගන්නා භෞතික දෙයකි. ඒ සඳහා මිලක් නියම වේ. එකී මිල ගෙවීමෙන් භාණ්ඩය ලබා ගත හැක. මාක්ස්වාදී ඉගැන්වීමට අනුව මිනිස් ශ්‍රමයද වෙළෙඳ භාණ්ඩයකි. එයට මිලක් ඇත. පැය ගණනට, දින ගණනට ශ්‍රමය සපයන කොටසේ ප්‍රමාණයට යනාදී වශයෙන් එහි මිල තීරණය වෙයි. භෞතික භාණ්ඩයක් මිලදී ගැනීමේදී එකී අවස්ථාවේම ඒ වෙනුවෙන් මිල ගෙවිය යුතුය. නමුත්, ශ්‍රමය නමැති වෙළෙඳ භාණ්ඩයට ගෙවීම කරනු ලබන්නේ එයට වෙනස් ආකාරයෙනි. ශ්‍රමයේ ඵලය ලබා අවසන්වී තිබුණද, ඒ සඳහා ගෙවීම කරන්නේ කාලයක් ඉකුත්වීමෙන්ද පසුවය. සමහර විට මාසයක්ද, දෙකක්ද, තුනක්ද අවසන්වීය. භාණ්ඩයක් විකුණන තැනැත්තා බොහෝ විට එහි මිල තීරණය කරයි. නමුත්, ශ්‍රමය නමැති වෙළෙඳ භාණ්ඩය විකුණන තැනැත්තාට එහි මිල තීරණය කිරීමේ ඉඩකඩ අහිමිවී ඇත. ශ්‍රමය මිලදී ගන්නා විසින් තීරණය කරනු ලබන මිලට ශ්‍රමය ලබා දීමට සිදුවී ඇත. ධනේශ්වර ක්‍රමය තුළ ධනපතියාට ශ්‍රමය සූරාකෑමට වඩාත් ඉඩ සැලැසී ඇත.

ධනපතියාගේ ලාභය යනු ශ්‍රමයට නොගෙවා ඉතිරි කර ගත් කොටසයි. ධනවාදී නිෂ්පාදන ක්‍රමයේ ස්වභාවය වන්නේ මෙම ශ්‍රමයට ගෙවිය යුතු කොටස නොගෙවා රැස් කරන අතිරික්ත වටිනාකම ප්‍රාග්ධනය ලෙස එකතු වීමයි. නිෂ්පාදන මාර්ග අහිමි, දේපළ අහිමි පන්තිය කුමන ස්වරූපයෙන් තම ශ්‍රමය වැය කළද, අතිරික්ත වටිනාකම් එකතු කිරීමට ක්‍රියා කරයි.

කලාව බිහි වන්නේ මිනිසා බිහිවීම සමඟ වුවත්, එය විෂයක් ලෙසින් පෝෂණයවී නිර්මාණ කලාවක් බවට පත් වන්නේ පන්ති සමාජයේය. වහල් හිමි සමාජයෙන් පෝෂණයවූ කලාව අද ධනේශ්වර සමාජයේ විවිධ වාද-විවාද ඔස්සේ කතිකා වන කලාවක් ඇත. කලාව නමැති පොදු සංකල්පයට දේශපාලනයක් නැතිවද පන්ති සමාජයක් තුළ පවත්නා ඕනෑම කලා කෘතියක් තුළ කුමන හෝ දේශපාලනයක් පවතී. එකී කලාවට අවශ්‍ය ද්‍රව්‍යමය සම්පත් සපයන්නේ වැඩ කරන මිනිසුන්ය. කායිකවද, මානසිකවද නිර්මාණ උදෙසා දායක වන්නේ ශ්‍රම ශක්තියයි. දේපළ හිමි මහා නිෂ්පාදන මාර්ග සමඟින් කටයුතු කරන අතිරික්ත වටිනාකම් එකතු කර ගන්නා ව්‍යවසායකයා (ප්‍රාග්ධන හිමිකාරිත්වය) ලාභය පසෙකලා කටයුතු නොකරයි. කලාව සඳහා යොමුවූ නිෂ්පාදන මාර්ග අහිමි ශ්‍රමය සපයන්නාට මෙම සත්‍යතාවයෙන් එපිට ස්ථානගත වීමට වෙනත් කවර හෝ තැනක් නොමැත. ඔහු හෝ ඇය අයත් වන්නේ මෙම සන්දර්භය තුළටමය. එහෙයින්, ඇත්තන් සහ නැත්තන් අතර එනම්, ධනපතීන් හා වැටුප් ලබන කම්කරුවන් අතර ඇති සමාජයේ ප්‍රධාන ලක්ෂණය වන සතුරු ප්‍රතිවිරෝධය කලාවට සම්බන්ධ වන මෙම පාර්ශ්වයන් අතර නොපවතීද? එය තීව්‍ර වන ගැටුම පවතින්නේ මහා පරිමාණ නිෂ්පාදන මාර්ග අහිමි කලාව වෙනුවෙන් වෙහෙසෙන අර්ථපතියා මත නොවේ. ශ්‍රමයට නියමිත මිල නොගෙවා අතිරික්ත වටිනාකම් එකතු කරන ප්‍රාග්ධන හිමියා හා නිර්මාණ දායකත්වය සපයන වැඩ කරන කලාකරුවා හෙවත්, ශ්‍රමිකයා අතර බරපතළ ලෙස බාහිරට නොපෙනෙන නිරන්තර ගැටුමක් පවතී. ක්ෂේත්‍රයට සම්බන්ධ තමන් වැටුප් ශ්‍රමිකයකු බව පිළිගැනීමට මැලිකමක් නොදක්වන කාටත් එය තේරුම් ගත හැක.

රූපවාහිනී මාධ්‍ය කලාවට සම්බන්ධ ප්‍රාග්ධන හිමිකාරිත්වය සොයා ගැනීමට හැකි නම්, මෙය යම් දුරකට තේරුම් ගත හැක. ඒ මහා ප්‍රාග්ධන හිමිකාරිත්වය තුළ කටයුතු කරන සියලු දෙනා කම්කරුවන්ය; වැටුප් ශ්‍රමිකයන්ය. විටෙක නිවේදකයෙකි; නිවේදිකාවකි. තවත් විටෙක නළුවෙකි; නිළියකි. වැටුප් ලබන කම්කරුවෙකි. ප්‍රාග්ධන හිමිකාරිත්වය ලබන ලාභය වන්නේ එකී ක්ෂේත්‍රය තුළින්ම නොවේ. තම සමාගම් ජාලයක ලාභ එකතුවකට තමන්ගේ රූපවාහිනී මාධ්‍යය ආධාරකයක් කර ගනී. එකී සමාගම් ජාලයක සූරාකෑමේම ප්‍රතිඵලයක් බවට 'තරුව' මගින් ඉටු කර ගන්නේද වැටුප් ශ්‍රමිකයකුගේ කාර්යයම මිස අනෙකක් නොවේ. එකී 'තරුව' තමන් වැටුප් ශ්‍රමිකයකු බව තේරුම් ගැනීමට මැලි වුවද, වෙළෙඳ භාණ්ඩයකි.

# ජෝන්ද සිල්වා රඟහල විකිණීමේ සූදානමට සමාජවාදී කලා සංගමයේ විරෝධය

අලුතින් ඉදි කිරීම සඳහා කඩා ඉවත් කරනු ලැබූ ජෝන්ද සිල්වා සමරු රඟහල පරිශ්‍රය පුද්ගලික අංශයට පැවරීමේ ආණ්ඩුවේ සූදානමට සමාජවාදී කලා සංගමය විරෝධය පළකරයි.

දශක ගණනාවක් තිස්සේ තමන් ජෝන්ද සිල්වා සමරු රඟහලේ නාට්‍ය රඟදක්වා ඇති කලාකරුවකු වන බවත් ජීවිත හා සමාන මෙම රඟහල කඩා ඉවත් කිරීමට සූදානම් වූ මුල් අවස්ථාවේ සිට මේ රඟහල පරිශ්‍රය නාට්‍යකරුවන් වෙනුවෙන් රැකගැනීමට තමන්ද පෙරට ආ බවත් ප්‍රවීණ රංගන ශිල්පී චන්ද්‍රසෝම බිංදුහේවා මහතා පවසයි. පසුගිය ආණ්ඩුව වගේම මෙම යහපාලන ආණ්ඩුවද කලාකරුවන් රවටමින් ජෝන්ද සිල්වා සමරු රඟහල පුද්ගලික අංශය සඳහා පැවරීමට කටයුතු කරමින් සිටින අතර ආණ්ඩුවේ මෙම සූදානමට එරෙහිව සියලුම කලාකරුවන් විද්වතුන් මෙන්ම ප්‍රේක්ෂක ජනතාවද පෙළ ගැසිය යුතු බව ඔහු වැඩිදුරටත් පවසයි.

මේ සම්බන්ධයෙන් අදහස් දක්වන ප්‍රවීණ රංගන ශිල්පී වසන්ත විට්ටච්චි මහතා පවසන්නේ ජෝන්ද සිල්වා සමරු රඟහල නාට්‍යකරුවන් වෙනුවෙන් රැකගැනීම අප සතු වගකීමක් ලෙස සලකන බවයි. ජෝන්ද සිල්වා සමරු රඟහල නැවත කලාකරුවන් අතට පත් නොකරන්නේ ආණ්ඩුවට මුදල් නොමැති නිසාවත් ප්‍රතිපාදන නොමැති නිසාවත් නොව විශේෂයෙන් නාට්‍යකරුවන් කලාවෙන් ඈත්කර තබන්නට ආණ්ඩුවට ඇති වුවමනාවේ ප්‍රතිඵලයක් ලෙස බවද ඔහු පවසයි.




අවස්ථා කිහිපයකදී වත්මන් ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා කලාකරුවන් හමුවූ විටදීත් ජෝන්ද සිල්වා සමරු රඟහල නාට්‍යකරුවන් වෙනුවෙන් ඉක්මනින් ඉදිකර දෙන ලෙස ඉල්ලීම් කළ බවත් ජනාධිපතිවරයා ඒ පිළිබඳව සොයා බලා නිසි පිළියම් යොදන බව පවසා සිටි බවත් ප්‍රවීණ රංගන ශිල්පිනි දීපානි සිල්වා මෙනවිය පවසයි. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයාගේ ප්‍රකාශයට මේ වනවිට වසර දෙකක් ගෙවී ගියද සිදුවෙමින් තිබෙන්නේ ජෝන්ද සිල්වා සමරු රඟහල නාට්‍යකරුවන්ට

03 පිටුවට>>>

# සංස්කෘතික උරුමය රැකීමට කලා සංස්කෘතික ප්‍රතිපත්තියක් අවශ්‍යයි

## ප්‍රවීණ නාට්‍යවේදී පරාක්‍රම නිරිඇල්ල

මෙවර 'රළ' අතිරේකය වෙන් වන්නේ ප්‍රවීණ නාට්‍යවේදී පරාක්‍රම නිරිඇල්ල සමඟ පිළිසඳරකට ය.

*රළ:* **ඔබ නාට්‍යකරුවෙකු ලෙස නාට්‍ය කලාවට පිවිසි ගමන් මඟ හා එම කාල වකවානුව ඔබට බලපෑ ආකාරය සඳහන් කළොත්,**

*පරාක්‍රම නිරිඇල්ල:* හැත්තෑව දශකයේ තමයි, මම නාට්‍ය කලාවට පිවිසෙන්නේ. ඊට පෙර ඒ කියන්නේ හැටේ දශකය කියන්නේ ලාංකේය නාට්‍ය කලා භාවිතයේ ස්වර්ණමය යුගය. එම කාල වකවානුවේ හිටපු විශ්වවිද්‍යාල කථිකාචාර්යවරුන් මෙන්ම රාජ්‍ය සේවකයන් ද කලාව, සංස්කෘතිය හොඳින් ජීවිතය සමඟ ස්පර්ශ කළ උදවිය. මේ වටාපිටාව සමඟ නාට්‍ය කලාව හැදෑරීමේ දැඩි උනන්දුවක් මගේ හිතේ ඇති වුණා. ඒ නිසා ම ධම්ම ජාගොඩ මහතාගේ 'රංග ශිල්ප ශාලිකාවේ' ශිෂ්‍යයකු ලෙස අත්දැකීම් බොහොමයක් ලැබුවා. මහාචාර්ය සරච්චන්ද්‍රයන් ඒ වන විට 'මනමේ' නාට්‍යයේ දෙවැනි අධ්‍යක්ෂණ කටයුතු ආරම්භ කරලා තිබුණේ. ධම්ම වැදි රජු ලෙස චරිත නිරූපණය කරනවා. මුළු නාට්‍යය ම සැකසෙන ආකාරය පිළිබඳව නාට්‍යයට සම්බන්ධ නොවී අත්දැකීම් ලබා ගත්තා.

1974දී ආචාර්ය ගාමිණී හත්තොටුවේගම සමඟ විවෘත වීදි නාට්‍ය කණ්ඩායමට එක් වුණා. ඔහොම ඉඳිද්දී 1974දීම 'තක්සලා නාඩගම හෙවත් මනමේ කතාවට තවත් අදහසක්' නාට්‍යයේ සහාය අධ්‍යක්ෂවරයා ලෙස පෙනී සිටියා. නව නිෂ්පාදනයක අත්දැකීම ලබා ගත්තේ මේ නාට්‍යයෙන් වීම සුවිශේෂී කරුණක් වුණා. ඉන් පසු 'කොරා සහ අන්ධයා', 'පරස්තාව', 'වෙස්මුහුණු' යන නාට්‍ය ත්‍රිත්වය නිෂ්පාදනය වෙන ආකාරය අත්දැකීමක් ලෙස එක් කර ගත්තා. විශේෂයෙන් ම කියන්න ඕනෑ ධම්මගේ තිබුණේ ස්ටැනිස්ලාවිස්ගේ 'මෙතඩ් ඇක්ටින්' ක්‍රමවේදයයි. හත්තොටුවේගමගේ තිබුණේ 'බ්‍රෙෂ්ට් ශෛලිය'. මෙම කාල වකවානුව කියන්නේ හත්තෑවෙකේ කැරැල්ලේ උණුසුම තිබුණු කාලයක්.

මේ කාල වකවානුවේ තරුණ පරම්පාරාව නාට්‍ය, සිනමාව, සාහිත්‍යය පිළිබඳව පුදුම දැනුමක් සහිත පිරිසක් වීම දක්නට ලැබුණා. ඒ හැමෝ ම හොඳ රසිකයෝ. නාට්‍යයක් බලලා ඒ ගැන කතා කරන්න, විචාරයකට ලක් කරන්න සංවිධානයකින් තොරව සංවිධානය වීමක්, ජීවිතයේ මධ්‍යගත ප්‍රවණතාවක් ලෙසත් පැවැති කාලයක් එවකට තිබුණා. වෘත්තීය සමිති නායකයෝ, එවකට සිටි දේශපාලකයෝ, පාක්ෂිකයෝ කලාවට දැඩි ලෙස නැඹුරු වූ පිරිසක්. ඔවුන්ගෙන් කලාවට දැන් වගේ කරදරකාරී තත්වයක් තිබුණේ නැහැ. විශේෂයෙන් ම ආරක්ෂාව පිළිබඳව ගැටලුවක් ඇති වුණේ ම නැහැ. මේ අතරවාරයේ දී වීදි නාට්‍ය තුනක් රඟදැක්වූවා. 'රජදැක්ම', 'බෝසත් දැක්ම', 'මිනිහෙකුට එල්ලිලා මැරෙන්න බැරි ද?' මේක ප්‍රේක්ෂකයෝ එකතු කළ හැකි හැම තැනක ම පෙන්නුවා. බෝගල පතලේ, වැඩබිම්වල, කම්කරු මධ්‍යස්ථානවල. භූමියේ නිදහස ඇති සෑම තැනක ම මෙම නාට්‍ය ප්‍රදර්ශනය කිරීම මත ප්‍රේක්ෂකයාව ශාලාවකට සීමා කළ නොහැකියි යන වග දැනුණා.

මෙම පසුබිම මත 1976දී මා විසින් නිෂ්පාදනය කොට ඉදිරිපත් කරන ලද 'සෙක්කුව' ඉහත කී තත්වයට පිළිතුරක් ලෙස ජනගත කෙරුවා. ප්‍රබල දේශපාලන යථාර්ථයක් දක්වමින්, ජන කාව්‍ය, ජන ගී ඇසුරින් සූරාකෑම, සමාජ විෂමතාවය වැනි දෑ එළිමහනේ රඟදැක්විය හැකි ලෙස නාට්‍ය තල ගෙන ආවා. මෙය 1976දී රාජ්‍ය නාට්‍ය උලෙළ නියෝජනය කරන ලද අතර. සම්මාන කිහිපයකින් පිදුම් ලැබුවා. 1978දී ජායිපූර්වල පැවැති ප්‍රජා නාට්‍ය වැඩමුළුවට සහභාගී වීමට ලැබීම ද, එහි දී හබීබ් තන්වීර් නමැති ප්‍රකට ඉන්දියානු නාට්‍යකරුවා හමු වීම ද, එහි 'නාසා තියටර්' හි දී 'චරන්දාස්', 'චෝර්' හා 'මැටි කරත්තය' වැනි නාට්‍ය නැරඹීම ද සුවිශේෂී වුණා. 1979දී පමණ 'විවෘත කලා කවය' කියලා වෙන ම වීදි නාට්‍ය කණ්ඩායමක් හදා ගත්තා.

ඒ කාලය වෙන කොට රැ ජින ලංකාවට ආපු සමය වික්ටෝරියා වේල්ල විවෘත කරන්න. පාලක පන්තිය ජනමතය හසුරුවමින් සිටියේ විශාල ආධාර මුදලක් ද සහිතව රැජින පැමිණ ඇති බවටයි. මේ පසුබිම මත අපි වීදි නාට්‍යයක් හැදුවා. අපි කිව්වේ, අධිරාජ්‍යවාදය මෙරට විශාල වශයෙන් සම්පත් කොල්ලකා ඇති බැවින්, ඒවා නැවත ලබා දෙන්න ඕනෑ කියලයි. ඒ තුළ අපි මොන තරම් ගැති මානසිකත්වයක ඉන්නවා ද කියන එක දන්වන ගමන් තරුණ පරම්පරාව තම දෙපයින් නැඟිටින්නට දරන උත්සාහය වර්ධනය කිරීම වැනි දෑ තේමා වශයෙන් යොදා ගත්තා. මේ වන විට පැවැති ආණ්ඩුවේ මර්දනය බොහො ම තදට තියෙන කාලයක්. අසූවේ වැඩ වර්ජනය උදෙසා වෘත්තීය සමිතියක් නොතිබුණත්, පාරට බැස්සේ විවිධ වෘත්තීය සමිති එක්ව ගෙන ගිය අරගලයට දායක වීමට අවශ්‍ය වූ නිසා.

*රළ:* **කලාව හා දේශපාලනය අතර ඇත්තේ අවියෝජනීය සම්බන්ධයක්. දේශපාලන බලපෑම ලාංකීය කලාවට බලපෑ ආකාරය ඔබට දැනෙන්නේ කොහොම ද?**

*පරාක්‍රම නිරිඇල්ල:* හැත්තෑහත ගත්තම ආණ්ඩුව කෙළින් ම කිව්වේ නැහැ නාට්‍ය කරන්න එපා කියලා. සියලු ම කලා විෂයයන්ට මෙම තත්ත්වය බලපෑවා. ආණ්ඩුව කලා විෂයයන් කප්පාදුවට ලක් කළා. නිර්මාණකරුවකුගේ ප්‍රකාශන අයිතිය, ජීවන අත්දැකීම් තමන් කැමැති මාධ්‍යයක් ඇසුරින් ප්‍රකාශනය කිරීම, මානව සබඳතා ගොඩනැංවීම වගේ දේවල්වලට බාධාවන් ඇති කළා. මේ කරුණු නිසා මිනිසුන්ගේ සුඛ, දුක්ඛ වේදනාවන්. මිනිසුන්ගේ නැඟිටීමට දරන උත්සාහය, මනුෂ්‍යත්වයට එරෙහි සියලු පීඩකයන්ට එරෙහිව නව නිර්මාණයක් ගොඩනැඟුණා. මෙයට ඉහත කී සමාජ - දේශපාලන වටාපිටාව තදින් බලපෑවා. කලාකරුවා සමාජයක ප්‍රමුඛයන්ගේ භූමිකාවට පණ දෙනවා. ඒ නිසා ම යථාර්ථය දැක්වීම උදෙසා නව නිර්මාණ උසස් තලයක දේශපාලනික අරුත් සපයමින් ඉදිරිපත් කළා. දැන් ඉන්දියාව ගත්තොත්, බෙංගාලිවල ඇති වූ පුනරුදය බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදයට එරෙහිව තාගෝර්ලා, භගත් සිංලා දක්වා රට පුරා ගොඩනැඟුවා. එය තනි පුද්ගල ප්‍රතිඵලයක් නොවේ. සමූහයක් එක් වීමේ ඵලයක්, එක් අරමුණක් උදෙසා. ඒ නිසා ම නාට්‍ය, ගීත, සාහිත්‍යය පෝෂණය ද තදින් ම පැවැතුණා. ඒ තුළින් සහෘදයා දැනුම්වත් කිරීමේ ක්‍රියාවලියක් පැවැතුණා. ජන මනසට කතා කළා.

මේ තත්වය අපේ රටට සාපේක්ෂව ගත්තොත්, වෙනස් ම තත්වයක්. එවකට පැවැති ධනපති ආණ්ඩුව විසින් කලාවන්ට තිබූ අවකාශය ඇහිරුවා. තහනම් කළේ නැහැ. රසිකත්වය, විචාරශීලී බව නැති කළා. ප්‍රාථමික අධ්‍යාපනයේ සිට විශ්වවිද්‍යාලය දක්වා අධ්‍යාපන ක්‍රමවේදය තුළ කලාවට තිබූ අවකාශ ඇහිරුවා. ජනමාධ්‍ය ද ඊට නොදෙවැනි ලෙස ස්වාධීනව කටයුතු කරනවා වෙනුවට පාර්ශ්වීය ලෙස ආණ්ඩුවට ගැති ජනමාධ්‍ය කලාවක් බිහි කළා. විශ්වවිද්‍යාලයට පවා මෙම තත්වය බලපෑවා. ඒ තුළ වූ අනෙක් ප්‍රතිඵලය වූයේ



තනි පුද්ගලයන් බිහිවීමයි. පන්තිය සංවිධානය නොවීමයි.

රුසියානු විප්ලවය, මාක්ස්වාදී න්‍යාය ස්ථාපිත වීම මුළු ලෝකයටම බලපෑවා. බොහෝ දෙනා බලාපොරොත්තු වුණේ යුරෝපයේත් විප්ලවීය වෙනසක් ඇති වෙයි කියලා. ඒත් එහෙම නොවුණාට එහි බලපෑම මත සිදු වුණු වෙනස්කම් අදටත් තියෙනවා. ධනේශ්වර රටවල වෘත්තීය සමිති ප්‍රබලව පවතින්නේ ඒ නිසා. නමුත්, අපි වගේ සංවර්ධනය වෙමින් පවතින කියන ලේබලයේ රටවල්වල සමාජයක් යහපත් කරන්නට අවශ්‍ය හැම දෙයක්ම කප්පාදුවට ලක් කරනවා. පාසල් මට්ටමේ සිට ඉහළට කලාව නඩත්තු කිරීමේ වැඩපිළිවෙළක් නැහැ. එහෙම වන්නේ පාලනය ගෙන යන ධනපති ආණ්ඩුවලට ඕනෑ වුණේ සමාජයක් හදනවා වෙනුවට තමන්ට වුවමනා විදියට කොන්ද නවා ගත්, ගැති මනෝභාවයකින් හෙබි පිරිසක් ඇති කර ගැනීමටයි. පවතින තත්වය වෙනස් කළ යුතුයි, පරිවර්තනය කළ යුතුයි කියලා හිතන පිරිසක් ඇති වෙන්න ඉඩ තිබ්බෙ නෑ.

මේ නිසාම ඉදිරි අවුරුදු කිහිපය සුවිශේෂී කඩඉම් බවට පත් වීමේ ඉඩකඩ අද වන විට භූමිය පුරාවට දකින්න තියෙනවා. මොකද? මෙච්චර කල් දේශපාලනය කියලා තිබුණේ ජාවාරමක්. ඒක පාලකයන්ට ඕනෑ විදියට හැසිරෙව්වා. දැන් කාලය වෙනස්. පවතින තත්වය වෙනස් කළ යුතුව තිබෙනවා.

රළ: **විකල්ප නාට්‍ය කලාවක් බිහි කරන්න කැප වුණු නාට්‍යකරුවකු විදියට ලෝකයේ විකල්ප නාට්‍ය කලා භාවිතාවන් ගැන දරන අදහස මොකක්ද?**

පරාක්‍රම නිරිඇල්ල: විකල්පය කියන එක හැම තිස්සෙම විකල්පය නොවෙයි. භාවිත ගුණය වැඩි වෙන කොට විකල්පය සම්මතයක් වෙනවා. ඒක තවදුරටත් විකල්පයක් වෙන්නේ නැහැ. ඉන්දියානු විකල්ප නාට්‍ය කියන්නේ අද වෙන කොට සාමාන්‍ය දෙයක් වෙලා. ප්‍රජා නාට්‍ය කණ්ඩායම් බොහොමයක් අද ව්‍යාප්ත වෙලා තියෙනවා. මේ අනුව ප්‍රොසීනියම් නැතිනම්, පින්තූර රාමු වේදිකාවක පෙන්විය හැකි නාට්‍ය බිහි වෙලා තියෙනවා. මෙය තවදුරටත් විකල්පයක් වන්නේ පින්තූර රාමු වේදිකාවට පමණයි. අපේ රටේ තවම මෙම තත්වය උදා වෙලා නෑ. එම තත්වය ගොඩනැඟිය හැකියි. එයට හුදු ආටෝපයෙන් තොර විනයක් නැති සමාජය නිවැරැදි දිශානතියකට නව පරපුරත් සමඟම ගෙන යා යුතුව තිබෙනවා.

මේ ධනවාදී ආර්ථිකය මහා තරගයක් ඇති කරලා තියෙනවා. මේ නිසාම සහභාගී කලාව මුල් තැනට ඇවිත් තියෙනවා. ඒ කියන්නේ කොහොම හරි මුදල් හොයාගෙන ගමක හරි නගරයක හරි ප්‍රේක්ෂකාගාරයක් හදාගෙන නාට්‍යයක් පෙන්නලා එනවා. ඒකෙන් සමාජ බලපෑමක් වෙන්නේ නැහැ, මේ නිසා විකල්පය කියන එක තවදුරටත් විකල්පයක් වෙන්නේ නැහැ.

රළ: **දිගින් දිගටම කලා ක්ෂේත්‍රයේ අර්බුද දික්ගැසෙමින් තිබෙනවා. මේ මොහොතේ කලාකරුවන්ගේ කාර්යභාරය කුමක් විය යුතුද?**

පරාක්‍රම නිරිඇල්ල: මේක සුළුපටු ප්‍රශ්නයක් නොවෙයි. ප්‍රශ්නයේ තැන් තැන්වලින් අල්ලලා වැඩක් නැහැ. සමස්ත සමාජයම අර්බුද රැසක ඉන්නේ. කලාව, සංස්කෘතියත් එහෙමයි. බේදවාචකයක තියෙන්නේ. මා හිතන විදියට පරිහානියට ලක් වෙලා තියෙන අංශ පහක් තිබෙනවා.

1. අධ්‍යාපනය 2. ආගම
3. ජනමාධ්‍ය 4. කලාව හා සංස්කෘතිය
5. දේශපාලනය.

මේ කියන අංශ වෙනසකට ස්ථිර ප්‍රතිපත්තිමය තැනකට ගෙන යාම වැදගත් වෙනවා. අධ්‍යාපනය තුළ දැනුම, ආකල්ප, කුසලතා වර්ධනය වන විදියට වෙනස් ප්‍රතිපත්ති ගේන්න ඕනෑ. අපේ රටේ විතරයි තියෙන්නේ සිංහල, දෙමළ, මුස්ලිම් පාසල්. බෞද්ධ, හින්දු, ඉස්ලාම්, කතෝලික ගැහැනු/පිරිමි මිශ්‍ර පාසල්. ඒකත් ග්‍රාමීය, නාගරික, ජනප්‍රිය ආදී ලෙස බෙදිලා. මේ ක්‍රමය තුළ එළියට එන්නේ ගිනිපුපුරක් තියාගෙන ඉන්න පුද්ගලයෙක්. කොයි වෙලාවේ හරි ඕක පත්තු වෙනවා. සෞන්දර්යය කොපමණ ඉගැන්නුවත් වැඩක් නැහැ. වැඩක් වෙලත් නැහැ, හේතුව විදියට මා දකින්නේ රසිකත්වයේ පිරිහීම හා රසිකත්වය වර්ධනයට ඇති බාධා වැඩිවීම. ඒ නිසා රසිකත්වයෙන් යුතු පුද්ගලයන් බිහි වන්නේ නැහැ. උසස් කලා රසිකත්වයකින් යුත් පුරවැසියන් බිහි වන්නේ නැහැ. උසස් කලා රසවින්දනයක් අපේක්ෂා කරන ගුරුවරයෙක් නැහැ. අලුත් නිර්මාණයක් කරන්නටවත්, ඈත පිටිසරක ඉඳන් ග්‍රාමීය දරු දැරියන්ට කලාව පිළිබඳ දැනුම ලබා දෙන්නවත් මේ බිහි වන විශ්වවිද්‍යාල ගුරු පත්වීම් ලැබූවන්ට අවශ්‍ය නැහැ, එහෙම වුවමනාව තියෙන්නේ සියයට එක්කෙනෙකුට නැත්නම් දෙන්නෙකුටයි. විශ්වවිද්‍යාල අධ්‍යාපනයෙන් පස්සේ බොහොමයකට අවශ්‍ය වන්නෙත් ගුරු පත්වීමක්. ඒක ලැබුණාට පස්සේ කලාව ස්පර්ශ කිරීමවත් කරන්නේ නැහැ. මේකට මුලින්ම වග කියන්න ඕනෑ ජාතික අධ්‍යාපන ආයතනය. ඊළඟට ජනමාධ්‍ය. මේ නිසා මිනිසුන්ගේ කලා භාවිතාව පිළිබඳව දිගු වැඩපිළිවෙළක් අවශ්‍යයි.

අද ළමයෙක් එක්ක යන්න තැනක් නැහැ. හැම තැනම තියෙන්නේ මහා පරිමාණ කෑම කඩ. දැනුමට අමතන්න තැනක් නැහැ. පොතක් පතක් කියවන්න, රසික හමුවක් තියන්න, නාට්‍යකරුවන්ට එක් වෙන්න තැනක් නැහැ, අනාගතය ගැන හිතලා නිවැරැදි ක්‍රමවේදයක් බිහි කළ යුතුයි. මේ පවතින ක්‍රමවේදය තුළ වෙනසක් බලාපොරොත්තු විය නොහැකියි. ඒ නිසා කලාකරුවන්ට පෙරට වඩා දැවැන්ත කාර්යභාරයක් කරන්න ඉතුරු වෙලා තියෙනවා. ඒ නිසාම නව ක්‍රමවේදයක් බිහි කළ යුතුව තිබෙනවා.

## පීප්ලි ලයිව්... >>04 පිටුවෙන්

රූපවාහිනී මාධ්‍ය කෙතරම් කුණු හොයනවා ද යන්න පැහැදිලි වන්නේ, නථා ගේ මළපහ පවා ප්‍රවෘත්තියක් වීමයි. ණය ගෙවන්නට බැරිව සියදිවි නසා ගන්නා නථාගේ නිවාස ඉදිරිපිට සැණකෙළියක් බවට පත්වන්නේ මාධ්‍යවේදීන් හා දේශපාලකයන්ගේ වුවමනාවන් සම්පූර්ණ කිරීමටයි. අවසානයේදී නථා හට සියදිවි නසා ගැනීමට අනවශ්‍ය වුණත් ජනමාධ්‍යවල බලපෑම නිසා ඔහුට සිදුවන්නේ තමා තුළ සිටින ගොවියා ඝාතනය කොට සියල්ලටම හොරෙන් නගරයට පළා ගොස් දියුණු වෙමින් පවතින ලෝකයේ සංවර්ධන කොටස්කරුවෙකුවී නවීන තට්ටු නිවාස ඉදිවෙන භූමියක අත්වැඩ දීමටයි. සිහින ජය ගන්න හැකි යැයි සිතා නගරයට එන බොහෝ දෙන අසාර්ථක වුණත්, තමා ගැනත් සමාජ ක්‍රමය ගැනත් ස්වයං වාරණයකට එළැඹීම ඉතා කණගාටු සහ ඉතා භයානක තත්වයක් බවට පත්වෙනවා. තරුණයන් බොහෝ දෙනෙක්, "අපි දේශපාලනයට නැහැ" කියමින් සිටින්නේද මේ ක්‍රමයේ ඇති අඩපණභාවය පිළිබඳව තමා ස්වයං වාරණයකට එළැඹ ඇති නිසාය. 'පීප්ලි ලයිව් සිනමා කෘතිය අන්තර්ජාතික මට්ටමෙන් සම්මානයට පාත්‍ර වූව ද, ඉන්දියාවේ අගැයීමට ලක් නොවීම තුළ කිසිදු අරුමයක් නැත.

ධනවාදය අර්බුදයෙන් අර්බුදයට පත්වෙමින් ඇති නූතන සංදර්භය තුළ ඔවුන්ගේ භූමිකාව භූමියෙන් භූමියට විවිධ වේශයෙන් පෙනී සිටිනවා. ධනවාදයේ රැකඩ බවට පත්වුණු දේශපාලකයින් සහ ඔවුන්ගේ පදයට නටන මාධ්‍ය ජාලය විසින් ජන ජීවිතයත් ජන ජීවිතයේ මහා ඛේදවාචකයනුත් උණු උණුවේ සිය ලාභ ආපේක්ෂාවන් වෙනුවෙන් අලෙවි කරමින් පවතිනවා. පීප්ලි ලයිව් එහි ඇති සමාජ දේශපාලනික කාරණය කියවා ගැනීමට හොඳ චිත්‍රපටයකි.

## ජෝන් ද සිල්වා... >>04 පිටුවෙන්

අහිමි වී යාමේ තත්වයක් බවද ඇය පවසයි.

නාට්‍යවේදී ප්‍රේමරත්න තෙන්නකෝන් සහෝදරයා පවසන්නේ යහපාලන ආණ්ඩුව බලයට පත් වුයේ කලාකරුවන්ට වඩා හොඳින් කලාකටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සපයන බවට පොරොන්දු දී වුවත් මේ වනවිට සිදු කෙරෙමින් තිබෙන්නේ කලාකරුවන් සතු අවම පහසුකම් පවා කප්පාදු කරමින් යන ගමනක් බවයි. රජයේ සෘජු මැදිහත් වීම යටතේ තිබූ ජෝන්ද සිල්වා සමරු රඟහල නැවත ඉදිකිරීම දෙවැනි අදියරේ සිට පුද්ගලික අංශය සඳහා පැවරීමට ආණ්ඩුව තීන්දුවක් ගෙන ඇති බව පසුගිය දිනෙක රාජ්‍ය ගිණුම් කාරක සභාවේදී හෙළිදරව් වී තිබෙන බව ඔහු පවසයි. දැනට ජෝන්ද සිල්වා රඟහල කඩා වසර හයකට වැඩි කලක් ගතවී තිබෙන අතර ඉතිරි ඉදිකිරීම් වෙනුවෙන් තවත් රුපියල් මිලියන 1000ක මුදලක් අවශ්‍ය බව ගණන් බලා ඇති බවද ඔහු පවසයි. එම අරමුදල සොයා ගැනීම සඳහා පෞද්ගලික අංශය දායක කර ගැනීමට අගමැතිතුමාගේ ප්‍රධානත්වයෙන් රැස් වූ ආර්ථික කළමනාකරණය පිළිබඳව කැබිනට් අනුකමිටුව තීරණය කර තිබෙන බවද ප්‍රේමරත්න තෙන්නකෝන් සහෝදරයා පවසයි.

# 2017 රාජ්‍ය නාට්‍ය උලෙළට පසුවදනක්...

ලාංකේය අද්‍යතන ජන සමාජය පුරුෂාර්ථයන්හි ඌණතා සහිත, සමාජ ප්‍රගමනයට හේතු වන මානවහිතවාදී ආකල්පයන්ගෙන් බැහැරවූ හර පද්ධතියක් මුල් කොටගෙන පවතී. මෙය ලාංකේය කලා මාධ්‍යයන් භාවිතයේද එකසේ දැකිය හැකි වකවානුවකි. නව ලිබරල්වාදී පරිභෝජනවාදී තාක්ෂණ ධනාවාදයක් අතර ගැටුම අද වන විට නාට්‍යකරුවන්ගේ නිර්මාණකරණයට විවිධ ලෙස බලපා ඇත. සැබැවින්ම ආරම්භක කලාව යනු හුදු වින්දනීය කලා මාධ්‍යයක් නොවන්නේය. එය ශ්‍රම ක්‍රියාවලිය හා සෘජු සම්බන්ධතාවයක් සහිත ජීවන අත්දැකීම් බෙදා ගන්නා කලා මාධ්‍යයක් වේ. කලාව පිළිබඳව නිවැරැදි කියවා ගැනීමකදී ශ්‍රමය හා කලාව අතරවූ එම අවියෝජනීය සහසම්බන්ධය හඳුනා ගත හැකි වේ.

තතු මෙලෙස වුවත්, පසුගියදා ලෝක නාට්‍ය දිනයේදී අවසන්වූ රාජ්‍ය නාට්‍ය උලෙළේ ක්‍රියාකාරීත්වය හා අවසන් වටය නියෝජනය කරන ලද කෙටි හා දිගු නාට්‍ය පිළිබඳව විමසීමේදී ඉහත කියන ලද මූලික අර්ථකථනයන්වත් ඉස්මතු නොවූ භාවිතාවන් බොහොමයක් ඇතුළත්වී තිබුණු අතර, ඉහත කී පරිදිම මිනිස් පරමාදර්ශ හා අද්‍යතන සමාජ, ආර්ථික, දේශපාලනික වාතාවරණයන් මානවරූපී ලෙස මිනිසා හා පරිසරය අතර ගැටුමක් ලෙස නිරන්තරයෙන් පත් කොට තිබේ. මෙම යථෝක්ත කරුණු බොහෝ නිර්මාණයන්ගෙන් ගිලිහීමට පාදකවී ඇත්තේ සහභාගී කලාවක් මත



යැපෙන්නට වෙර දැරීමේ ඵලයක් ලෙසිනි.

පන්ති සමාජය බිහිවීම සමඟ කලාව ද විපරිනාමයට පත් විය. එහිදී මහා කලාවක්ද, ක්ෂුද්‍ර කලාවක්ද බිහි විය. ආරම්භයේදීම මෙම බණ්ඩනය මත ක්ෂුද්‍ර කලාව මහා කලාවෙන් යටපත්වූ අතර, මතවාදීමය අරගලයක් තුළ මහත් සේවයක් ධනපති පන්තියට ලබා ගැනීමට මෙම තත්ත්වය ඉවහල් විය. එසේ වුව ද, ක්ෂුද්‍ර කලාව සමාජ අරගලත් හා බද්ධ වෙමින්, යම් සමාජයීය මෙහෙවරක් ඉටු කිරීමට දායක විය. මෙවර රාජ්‍ය නාට්‍ය උලෙළ නියෝජනය ගත් විට බොහොමයක් යොවුන් නාට්‍යකරුවන්වූ අතර, විශ්වවිද්‍යාල ආචාර්යවරු හා ප්‍රවීණ නාට්‍යකරුවෝද තම නිර්මාණ අවසන් වටය දක්වා නියෝජනය කරවන්නට සමත් වූහ. ඒ අතර වත්මන් ධනවාදී සමාජ ක්‍රමය අන් කවරදාටත් වඩා මානව බැඳීම් සියල්ල කීතු කීතු කොට ඉරා දමමින්, තම වුවමනාවන් උදෙසා මූල්‍ය සම්බන්ධයන් ප්‍රමුඛ කොටගෙන ඇත.

මේ මොහොත වන විටත් මෙරට නාට්‍ය කලාවේ උන්නතියේ ප්‍රධානතම තෝතැන්නක් වන ජෝන් ද සිල්වා සමරු රඟහල මෙරට ජන සමාජයට මෙන්ම ලාංකේය නාට්‍ය කලාවටද නොලැබීමේ අදියරකට පැමිණ ඇති මොහොතක පසුවෙයි. මනුෂ්‍ය ජන සමාජය භෞතික වර්ධනයක සිට ජීවධරණී සංහිඳියාවකින් යුත් සංස්කෘතික ආධ්‍යාත්මයක් ඇති කර ගත යුත්තේමය. එනමුත්, එවැන්නක් බිහි වීමට ඇති අවකාශ අහුරමින් කලාවට ඇති මං අහුරන්නට කිසිදු පාලකයකුට අයිතියක් ඇත්තේ නැත. ජාතික උරුමයක් ලෙස පැවැතිය යුතු රඟහලක් පවා නඩත්තු කළ නොහැකි පාලනයක් යටතේ පැවැත්වූ රාජ්‍ය නාට්‍ය උලෙළක සමාප්තිය සටහන් කොට සම්මාන දරා ගනිමින්, ජයග්‍රාහී මානසිකත්වයක් ගොඩනැඟුණ ද, ප්‍රේක්ෂකයා පමණක් නොව කලාකරුවා ද රංග ශාලාවෙන් ඉවත් කොට තබා ඇත. එමෙන්ම සියලු නාට්‍යකරුවන්ද අවබෝධ කොට ගත යුත්තක් ඇත. මුදල මත තීරණය වන සමාජ හර පද්ධතියක අනුකරණවාදී, වාණිජවාදී පරමාර්ථ අරමුණු කොටගෙන ජනතාව නිර්වින්දනය කොට තැබීමේ අකටයුත්ත වහා නිවැරැදි කොට මානව වර්ගයාගේ බුද්ධිය හා හදවත ස්පර්ශ කරමින්, අවදි කරන කලා නිර්මාණයන් බිහි කිරීම අත්‍යවශ්‍ය සාධකයක් ලෙස පවතී. එනම්, ***කලාකරුවාගේ වගකීම වනුයේ, පවතින යථාර්ථයට අනුගතව නියම කළ මිලටම විකිණී යාම නොව වඩා යහපත් කලා භාවිතයක් වෙනුවෙන් නිවැරැදි සමාජ ක්‍රමයක අවශ්‍යතාවය උදෙසා තම දායකත්වය සපයමින්, සමාජ ක්‍රියාකාරීත්වය උදෙසා චින්තන හැකියාව නම් වන සුවිශේෂී ගුණාංගය සෞන්දර්යාත්මකව විනිවිද දකින්ට මං පාදා දීමයි.*** එවිට බලය, ලාභය මුල් කොට ගත් සහභාගී කලාවක් වෙනුවට පාලන තන්ත්‍රය විසින් බෙදා වෙන් කොට ඇති සමාජ බලවේගවල තනිවූ ජීවන අරගලය දිනන්නට වෙහෙස වන හෘද සාක්ෂිය මරා නොදැමූ නාට්‍යකරුවන්ගේ කලා භාවිතාවන් දකින ප්‍රේක්ෂකාගාරයක් සකසා ගත හැකි වන්නේමය. එය මීට වඩා සුභදායී පරිසරයක පවත්වන රාජ්‍ය නාට්‍ය උලෙළක් වනු නොඅනුමානය.

කලාව

## මාක්ස්වාදී ඇසින්

# ප්‍රාග්ධනයේ ආධිපත්‍යය තුළ කලාව

ධනවාදය යනු වෙළඳ භාණ්ඩ නිෂ්පාදනයත් ලාභයත් පදනම් කරගත් ප්‍රාග්ධනයේ ආධිපත්‍යයට සියල්ල නතු කරගත් සමාජයකි. ඉන් නිදහස් වූ හෝ ස්වාධීන වූ කිසිවකට ධනවාදය තුළ පැවැත්මක් නැත. ඒ අනුව කලාවද ඉතා ඉක්මනින් ප්‍රාග්ධන හිමියන්ගේ ආධිපත්‍යයට යටවූ අතර සියලු කලා නිර්මාණ වෙළඳ භාණ්ඩ බවට පත් කරනු ලැබීය. නැතිනම් එසේ පත්කිරීමට බලකරනු ලැබීය. ඒ සමගම එතෙක් සමාජයේ ගරුබුහුමනට ලක්ව තිබූ කලාකරුවා ක්‍රමිකව ප්‍රාග්ධනයේ වැටුප් ශ්‍රමිකයෙක් බවට ප්‍රාග්ධන හිමියන් වෙත කෑලි ගණනට විකිණෙන කෙනෙක් බවට පත් කළේය. මෙම සත්‍ය මෙයට සියවස් එක හමාරකට පෙර ධනවාදයේ මුල් යුගයේම මාක්ස් හා එංගල්ස් තම කොමියුනිස්ට් ප්‍රකාශනයේ මෙසේ සඳහන් කළේය. "මෙතෙක් ගරුත්වයට භාජනය වූ, ගෞරව පූර්වක විශ්මයකින් යුතුව සැලකූ හැම වෘත්තියකම තිබූ ප්‍රභා මණ්ඩලය ධනපති පංතිය විසින් ඉවත් කැරිණි. එය වෛද්‍යවරයා, නීතිවේදියා, පූජකයා, කවියා, විද්‍යා කටයුතුවල නිතරවන්නා ආදී හැම කෙනෙක්ම වැටුප් ලබන ශ්‍රමිකයන් බවට පත් කළේය." දියුණු ධනවාදී රටවල කලාවද කර්මාන්තයක් බවට පත්ව ඒවායේ ඒකාධිකාරය පවා (මහා චිත්‍රපට සමාගම්, නාට්‍ය සමාගම්, පොත් ප්‍රකාශන සමාගම් ආදී) බිහි වෙද්දී පසුගාමී සංවර්ධනයක් සහිත ධනවාදී රටවල එම ක්‍රියාවලිය සිදුවූයේ මඳක් හෙමිනි. එහෙත් මේ වනවිට එය ලංකාව වැනි රටවලද සිදුවී අවසන්ය. රංගන ශිල්පීන්, සංගීත ශිල්පීන්, චිත්‍ර ශිල්පීන්, ලේඛකයන් ආදී සෑම දෙනාම ප්‍රාග්ධන හිමියන් විසින් මුදලට මිලදී ගන්නා අය බවට පත් කරනු ලැබුවේ කලාකරුවා 'කුලීකරුවෙක්' බවට පත්කරමිනි. මෙම තත්වයෙන් මිදී සිටීමට ඇතැම් අය උත්සාහ කළද තවමත් උත්සාහ ගනිමින් සිටයද හැම දෙනාම ක්‍රමානුකූලව ප්‍රාග්ධන විසින් ගිලගන්නා හැටිත් ඊට එකඟ නැති අය කලා ක්ෂේත්‍රයෙන් විසිවී යන හැටිත් අපි දකිමින් සිටිමු.

ධනවාදය 'නිදහස' 'නිර්මාණකරණයේ නිදහස' ආදී අලංකාර සංකල්ප බිහි කළද භාවිතාවේදී නිර්මාණකරණයේ නිදහස මායාවක් බවට පත් කළේය. ප්‍රාග්ධන හිමියන්ට අවශ්‍ය වූයේ රසවින්දනය පුළුල්කරන, සමාජ සංවර්ධනයට දායක වන, නිර්මාණ ශිල්පය විදහා පාන දේවල් නොව 'පහසුවෙන් විකිණිය හැකි' හා වැඩිපුර ලාභ ලැබිය හැකි කලා නිර්මාණය. ඒ නිසා ධනවාදය තුළ කලාව එක් අතකින් ප්‍රාග්ධන හිමියන්ට ලාභ ලබාදෙන ව්‍යාපාරයක් බවට පත්වන අතර අනෙක් අතින් ධනේශ්වර මතවාදය ජනතාවගේ චින්තනය තුළට ගෙනයන මාධ්‍යයක් බවටද පත්විය. ධනවාදය තුළ කලාව පිරිහීමට පත්වූයේ එසේය.

පන්ති සමාජය තුළ කලාව පිරිහීමට ලක්වූ ආකාරය ගැන ශ්‍රේෂ්ඨ රුසියානු ගත් කතුවර ලියෝ ටෝල්ස්ටෝයි තම 'කලාව යනු කුමක්ද?' නම් කෘතියේ මෙසේ සඳහන් කර තිබිණි.

"මේ තත්වය සම්බන්ධයෙන් ඉදිරිපත් කළ හැකි පුදුම සහගත උපමාවක් ඇත. එය මෙසේය. මාතෘත්වය අපේක්ෂා කරන, රූ සපුවෙන් අනූන කාන්තාවක් ඇගේ ශරීරය ලෝකාස්වාද රතිය අපේක්ෂා කරනවුනට විකුණයි. අපේ පංතියේ වර්තමාන කලාවට සිදුවී ඇත්තේද මෙවැන්නකි."

අපේ පංතියේ වර්තමාන කලාව වෙසඟනකගේ තත්වයට පත්ව ඇත. මේ උපමාව සියලු අංගෝපාංගයන් අතින් ගැලපේ. ඒ ස්ත්‍රියට මෙන් ඒ කලාවටද කාල සීමාවක් නොමැත. ඇය මෙන්ම ඒ කලාවද නිරන්තරයෙන් අලංකරණයෙන් විභූෂිතය. ඇය මෙන්ම ඒ කලාවද හැම කල්හි විකිණීමට සැදී පැහැදී සිටී, ඇය මෙන්ම ඒ කලාවද අනුන් පොළඹවන සුළුය. විනාශකාරීය.

සැබෑ කලාවට නම් සෙනෙහෙබර හිමියෙකුගේ බිරියකට මෙන් අබරණ අවශ්‍ය නැත. එහෙත් ව්‍යාජ කලාවට වෙසඟනකට මෙන් සැරසිලි අවශයය"

ටෝල්ස්ටෝයි මෙම දහස පළ කළේ ඔහුද අයත්වූ ප්‍රභූ පන්තියේ කලාවට සිදුව තිබූ ඛේදනීය තත්වය පිළිබඳවය. ඔහුගේ එම අදහස ධනවාදය තුළ කලාව පත්ව ඇති තත්වයටද එකසේ ගැලපේ. කලාව වෙළඳපොළේ විකිණීමට නිපදවන භාණ්ඩයක් වනවිට, නිෂ්පාදකයා හෙවත් ප්‍රාග්ධන හිමියා ඉන් බලාපොරොත්තු වන්නේ ලාභය පමණක් වූ විට කලා කෘතිය මෙන්ම කලාකරුවාද ධනවාදය තුළ පත්වන්නේ අර්බුදයකටය. දැන් අපි අත්දකිමින් සිටින්නේ එම අර්බුදයයි. ලංකාවේ රූපවාහිනී නාලිකාවල දෙබස්කවා පෙන්වන අවර ගණයේ බාල ටෙලිනාට්‍යයත් රංගන ශිල්පින් වෙනුවට 'ටෙලි කෑලි බිහිකළ, දෙවසේ කුලියට රඟපාන මෙගා ටෙලිනාට්‍යයත් ඊට එරෙහිව නිර්මාණ ශිල්පීන් නගන දුක්ගැනවිල්ලත් කියා පාන්නේ එම අර්බුදයයි. මෙහිදී රූපවාහිනී නාලිකාවල අයිතිකරුවෝද වෙළඳ සමාගම් හිමිකරුවෝද (වෙළඳ දැන්වීම් හරහා) ටෙලිනාට්‍යවල තීරක බලවේග වී සිටින අතර අන් සියල්ලෝම ඔවුන්ගේ කැමැත්තට අනුව ඔවුන් යටතේ වැඩ කරන්නනෝ බවට පත්ව තිබේ. ඔවුන් මෙම නාට්‍ය නිපදවන්නේ නිෂ්පාදන මන්දිර හෙවත් Production Houses තුළය. එවිට එහි කලාවේ සෞන්දර්යය හෝ එහි හොඳ අරමුණ පවතින්නේ නැත. කෙසේ වෙතත් ධනවාදය තුළ කලාව මෙම තත්වයට පත්වීමට හා පත් කිරීමට එරෙහිව සටන් කරන කලාකරුවන් මෙන්ම විකල්ප කලාවක්ද තිබේ. එහෙත් එය සමාජයේ ආධිපත්‍යයට දරන එක නොවේ. කාව තුළ දැන් ආධිපත්‍යය දරන්නේ ප්‍රාග්ධනයේ ග්‍රහණයට හසුවූ කලාවය. එය ජන විඥානයටත් සමාජයේ පොදු සාමූහික පැවැත්මටත් මිනිසුන්ගේ රස වින්දනයටත් නිර්මාණශීලීත්වයටත් කර තිබෙන හා තවමත් කරමින් සිටින හානිය විශාලය.

# ජන ජීවිතය, ජන සංහාරය හා ජන මාධ්‍ය සංදර්ශනය සමඟ 'පීප්ලි ලයිව්'





බොලිවුඩයෙන් එහාට ගිය ඉන්දියාවේ සමකාලීන සිනමාවක් තියෙන බව බොහෝ දෙනෙක් නොදන්නා කාරණයක්. එනිසාම අනූෂා රිස්විගේ අධ්‍යක්ෂණයෙන් නිර්මාණය කෙරුණු 'පීප්ලි ලයිව්' සිනමා කෘතිය අපට වැදගත් වෙනවා. බොලිවුඩ් සිනමාවේ වාර්තා තබන බොහෝ සිනමා කෘතිවලට හසු නොවන ගැඹුරු ඛේදනීය කතාවක් ඉන්දියානු සමාජයේ යටින් දිවෙනවා. පාවෙන උද්‍යාන, හෙලිකොප්ටර් අංගන සහිත මුකේෂ් අම්බානිලාගේ අධි සුඛෝපභෝගී ජීවිතවල සිට ප්‍රාන්ත රාජ්‍යන්ගේ ගම්දනව් දක්වා ගමන් කරන්නෙකුට ඉන්දියානු ජන සමාජය මතුපිටින් වසා ඇති සැබෑ ජීවිතවල ඛේදනීය ඉරණම අපට හමුවෙනවා. බොහෝ සිනමාකරුවන් වාණිජ සිනමාව හඹා යද්දී අනුෂා රිස්වි 2010 වර්ෂයේදී ඉන්දියානු ජන සමාජය යටින් දිවෙන අළු යට ගිනි අවුස්සමින් 'පීප්ලි ලයිව්' සමකාලීන සිනමා කෘතිය නිර්මාණය කොට තිබෙනවා. අවුරුදු හයක් හතක් ගෙවී ගොස් තිබුණත් මෙම සිනමා කෘතියේ ඇති සර්ව කාලීන අගයත් කෘෂිකාර්මික ජීවිතය බූවල්ලෙකුගේ වේශයෙන් වත්මන් ධනවාදය විසින් වේගයෙන් ගිලගනිමින් සිටින ලාංකීය ගොවිජන ජීවිතයට ඇති සමීපකමත් නිසා මෙම චිත්‍රපටය නැවත කියවීම වැදගත් බව අප හිතනවා. 'පීප්ලි ලයිව්' චිත්‍රපටය තුළ බොහෝ චිත්‍රපටවල අපි දකිනා වීරයා හා දුෂ්ඨයා යන චරිත වෙනුවට සමාජ ක්‍රමය හා දේශපාලන භාවිතාව ඉදිරියට එනවා. මෙම සිනමා කෘතියේ ප්‍රධාන වශයෙන් ප්‍රවේශයන් තුනක් තිබෙනවා. ගොවි ජනතාවගේ ඇති ගැටලු, ඒවාට හිමි වන දේශපාලනික විසැඳුම් හා ජන මාධ්‍ය හරහා මේ සියල්ල විකුණාගෙන කෑම. පොදුවේ දකුණු ආසියාතික රටක් හැටියට කෘෂිකාර්මික සමාජ ක්‍රමයක් වටා ගොඩනැගුණු සංස්කෘතියක් ඇති අපේ රටේ තත්ත්වයද මේ හා සමාන පසුබිමක් ගන්නවා.

ඉන්දියාවේ පසුගිය දශක දෙක තුළ ගොවි ජීවිතය හෝ ගොවිතැන් කිරීම අතහරින ලද ගොවීන් ප්‍රමාණය මිලියන අටක් පමණ වෙනවා. පාරම්පරික ගොවිතැන අත්හළ පසු ඔවුන් කරන්නේ මොනවාද? හෝ කරන්නට ඉතිරිව ඇත්තේ කුමක්ද? යන කරණය මෙම කෘතියේ උපහාසාත්මක ලෙස ගෙනෙනවා. නථා නමැති තරුණ (වයස 35) ගොවියා තමන්ගේ වගාවන් කිරීමට තම වගා භූමිය රාජ්‍ය බැංකුවකට උකස් කිරීමත්, එය බේරා ගැනීමට අසමත් වීම නිසා වන්දි මුදලක් බලාපොරොත්තුවෙන් සියදිවි නසා ගැනීමට තීරණය කරනවා. ප්‍රවෘත්තියක් එනකම් බලා සිටින ජන මාධ්‍ය ගිජු ලිහිණින්ට මෙය ඉතා හොඳ ගොදුරක් වන අතර කෑදර දේශපාලකයන්ට වටිනා ආහාරයක් වෙනවා. උපහාස රසය හරහා සමාජ හා දේශපාලන ක්‍රමය ජනමාධ්‍යයේ මවාපෑමක් ලෙස නථාත්, ඔහුගේ වැඩිමහල් සොහොයුරාත්, තරුණ ජන මාධ්‍යවේදියාත්, නව රැල්ලේ මාධ්‍යවේදිනියක් ඉදිරියේ පෙනී සිටිනවා. එහි මුල සිටම ඇමරිකානු බලවේග ගැන පොදු ජන මතය දෙබස්වලින් එහාට ගිය රූප රාමු හරහා ගෙනෙනවා. ශ්‍රීක කුඹුරක කෙසඟ සිරුරකින් යුත් මිනිසෙක් වළක් කපමින් සිටිනවා. එය සිනමා කෘතිය පුරාවටම පෙනෙනවා. බයිසිකලයක පොහොර උරයක් තියාගෙන ඔහු අමාරුවෙන් එහෙ මෙහෙ යනවා පේනවා. අවසානයේදී හෙළිවෙන්නේ, ඒ ඔහු බැංකුවට සින්නවූ තමාගේ ඉඩමේ පස් නගරයට ගොස් විකුණන බවයි.

03 පිටුවට>>>